# THE SIGNALLER

SRI LANKA SIGNAL CORPS JOURNAL - 2012




SRI LANKA SIGNAL CORPS

# SIGNAL COLORS NIGHT - 2012




















# කතුවැකිය

69 වන වියට පා තබන ශ්‍රී ලංකා සංඥා බලකායේ "ද සිග්නලර්" සගරාවේ 14 වන කලාපයේ කතෘ වශයෙන් කටයුතු කිරීමට ලැබීම මා ලද ගෞරවයක් සහ භාග්‍යයක් කොට සලකමි.

අප බලකායේ වර්ෂයක් පුරාවට සිදුවන සුවිශේෂි වූ අවස්ථාවන් සෑම සාමාජිකයකුටම දැන ගැනීමට හා ඔවුන්ගේ නිර්මාණ හැකියාවන් එළි දැක්වීමටත්ල මෙම සඟරාව කදිම තෝතැන්නක් වේ. තවද අප බලකායට එකතු වන නවකයින් හට තම ඒකකය ගැන අවබෝධයක් ගබා ගැනීමටත්ල මෙහි පලවන අධ්‍යාපනික ලිපි මගින් ඔවුන්ගේ තාක්‍ෂණික/ වෘත්තීය දැනුම වර්ධනය කර ගැනීමටත් මනා පිටුවහලක් වනු ඇති බව නොඅනුමානය.

සංඥා බලකාධිපතිගේ සංකල්පයකට අනුව "ද සිග්නලර්" සඟරාව සංඥා බලකා ඉතිහාසයේ ප්‍රථම වරට ඉංග්‍රීසි මාධ්‍යයෙන් මුද්‍රණය කිරීමත්ල එම සඟරාවන් දකුණු ආසියාතික රටවල යුධ හමුදාවන් වෙත ද බෙදා හැරීමටත් කටයුතු සිදු කර ඇත. මෙමගින් එම රටවල යුධ හමුදාවන් සමග සමීප සම්බන්දතාවයන් ඇතිකර කරගැනීමටත්ල මනා පිටුවහලක් වනු ඇති බව මගේ විශ්වාසයයි.

විවිධ රාජකාරීන් මධ්‍යයේ වුවද මෙවර කලාපය සාර්ථක අයුරින් එළි දැක්වීම සඳහා සහය දැකිවූ සියලු ජ්‍යෙෂඨ නිළධාරින්ල ඒකක අණදෙන නිළධාරින් ඇතුලු සියලුම නිළධාරින් මෙන්ම සෙසු නිළයින්ටත් මාගේ අවංක ස්තූතිය පුද කරන අතරල මෙම සඟරාව පෙළගැස්වීම සඳහා දායකත්වය දැක්වූ සංස්කරණ මණ්ඩලය වෙත මගේ හෘදයාංගම ප්‍රණාමය පුද කරමි. තවද අප වෙත ලැබුන ප්‍රතිචාර විශාල වුවත්ල සීමිත වූ ඉඩ ප්‍රස්ථාවන් නිසා සියලුම නිර්මාණ එළ කිරීමට නොහැකි වීම ගැන කනගාටුව ප්‍රකාශ කරමු.

අවසන් වශයෙන් "ද සිග්නලර්" සඟරාවෙහි ඔබගේ අදහස් හා යෝජනා අප වෙත දන්වා එවීමෙන් ඉදිරි කලාප විශිෂ්ඨ අයුරින් ඉදිරිපත් කිරීමට හැකියාව ලැබෙනු ඇත. තවද මෙම සඟරාව අලංකාර අන්දමින් මුද්‍රණය කර ඔබ අතට පත් කිරීමට කටයුතු කල "රුචිර ප්‍රින්ටර්ස්" අධිපති ඇතුලු කාර්යය මණ්ඩලයේ සාමාජිකයින්ටත් මාගේ හෘදයාංගම ස්තූතිය මෙයින් පුද කරමි.

# පටුන

පෙරවදන

මතක පොතින්

කෙලි බිම

පාඨමාලා

මන්දාකිණිය

කැටපත් පවුර

උපන්දින සුභ පැතුම්

මංගල සීනු

විවිධ

THE SIGNALLER
Is the annual publication of the Sri Lanka Signal Corps

ලිපිනය

සංස්කාරක මණ්ඩලය

සැකසුම සහ මුද්‍රණය



## සංඥා බලකාධිපතිගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බලකායට වසර 69 ක් සපිරෙන මෙම ඓතිහාසික අවස්ථාවේ 14 වන කලාපය වෙනුවෙන් සංඥා බලකාධිපති වශයෙන් පණිවුඩයක් ගෙන ඒමට ලැබීම මා ලද ඉමහත් භාග්‍යක් කොට සලකමි. ප්‍රෞඪ ඉතිහාසයක් ඇති සංඥා බලකායේ සාමාජිකයින් වන අප සංඥා රාජකාරි තුලින් මෙන්ම පාබල රාජකාරි තුලින් දල යුද හමුදාවට ලබාදුන් අසීමිත දායකත්වය සංඥා බලකාධිපති වශයෙන් මා මෙහිදී සිහිපත් කරනුයේ ඉතා අභිමානයෙනි.

සාමකාමී වාතාවරණයක් යටතේ ක්‍රියාත්මක වන රට ගොඩනැගීමේ මහඟු ක්‍රියාවලියේදී ශ්‍රම දායකත්වයෙන් මෙන්ම යුද හමුදා සන්නිවේදනයේ පෙර ගමන්කරු වන අප බලකායට පැවරෙන රාජකාරීන් කිසිදු ලෙසකින් හෝ අවම නොවන් ඇත. යුධ වාතාවරණය සහමුලින්ම දේශයෙන් බැහැර කිරීමෙහිලා අප බලකාය ලබාදුන් මෙහෙවර අති විශිෂ්ඨ වූ අතර, නවීන තාක්ෂණික උපකරණ හා පරිගණක උපකරණ භාවිතා කරමින් යුධ හමුදා සන්නිවේදන ජාලයන් උසස් මට්ටමකට ගෙන ඒම සඳහා කරනු ලබන ක්‍රියාවන් ද මෙහිදී අගය කල යුතුය. ඉන් නවත් ඔප් නැංවුනු අප බලකායේ කීර්තිය ඉදිරියට ගෙනයාම සඳහා දැනට ක්‍රියාත්මක වන දේශය ගොඩනැගීමේ මහඟු ක්‍රියාවලියේ කොටස් කරුවන් වශයෙන් එක්ව කටයුතු කිරීම අපගේ පරම අභිලාෂය හා අරමුණ විය යුතු අතර, එය ශ්‍රී ලංකාව ආසියාවේ ආශ්වර්යය කරා ගෙන යාමේ සිහිනය සැබෑ කිරීමෙහිලා මහත් පිටුවහලක් වනු ඇත.

මාතෘ භූමියට පූර්ණ සාමය ලඟාකරදීම සඳහා තම ජීවිතය කැපකල සියලුම සංඥා රණවිරුවන් සහ සටනේදී ආබාධිත තත්වයට පත් සියලුම නිළධාරි/සෙසුනිළයින්ට මාගේ ගෞරවය හා ආචාරය පුදකිරීමට මෙය අවස්ථාවක් කරගන්නෙමි.

සංඥා බලකායේ කාලීන සිදුවීම් පිළිබඳව අප සාමාජිකයින් දැනුවත් කිරීම හා නිර්මාණශීලී හැකියාවන් ඇති අයවලුන්ගේ කුසලතාවයන් වැඩි දියුණු කිරීමේ තොතැන්න බඳු වූ "ද සිග්නලර්" සඟරාව දිනෙන් දිනම දියුණුවට පත්වේවායි ඉතසිතින් ප්‍රාර්ථනා කරන අතර, සංඥා බලකායේ සියලුම නිළධාරින් /සෙසුනිළයින් හා ඔවුනගේ පවල්වල සාමාජිකයින්ටත්, නිරන්තරයෙන් අප හා එක්ව කටයුතු කරන සිවිල් සේවක කාර්‍ය මණ්ඩලයට හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ටත් සාමය සතුට සෞභාග්‍යමත් අනාගතයක් උදා වේවායි ප්‍රාර්ථනා කරමි.

ඊ පී ද ඉසෙඩ් අබේසේකර යුඑස්පී
මේජර් ජෙනරාල්
සංඥා බලකාධිපති



## ප්‍රධාන සංඥා නිළධාරිගේ පණිවුඩය






## අධ්‍යක්ෂක තොරතුරු තාක්ෂණගේ පණිවුඩය

ශ්‍රී ලංකා සංඥා බලකාය විසින් පළකරනු ලබන "ද සිග්නලර්" 2012 වසරේ සඟරාවට තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක වශයෙන් පණිවිඩයක් නිකුත් කිරීමට ලැබීම මා ලද භාග්‍යයක් කොට සලකමි.

මෙම අංශ 2010 වසරේ මාර්තු මස 01 දින ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානය යටතේ ආරම්භ කරන ලද අතර, මෙම අංශ මගින් සිදුකරනු ලබන කාර්යයන් අතුරින් යුධ හමුදාවේ තෝරාගත් ස්ථානයන් සඳහා පරිගණක පද්ධතීන් සකසාදීමේ කටයුතු ප්‍රධාන තැනක් ගන්නා අතර, දැනට සැලකිය යුතු පරිගණක පද්ධතීන් ප්‍රමාණයක් යුධ හමුදාවේ ස්ථානයන් සඳහා සකස් කර දී ඇති බැව්ද පෙන්වා දෙමි.

මෙම පරිගණක පද්ධතීන් අතරින් යුධ හමුදාවට ඉතාම වැදගත් පද්ධතියක් වශයෙන් හැඳින්විය හැකි CENTRAL HR MANAGEMENT SYSTEM පද්ධතිය මගින් යුධ හමුදාවේ සියලුම රෙජිමේන්තුවලට අයත් නිලධාරීන් සෙසුනිලයින්ගේ පුද්ගලික විස්තර නිවැරදිව ලබාගැනීමට හැකිවන බැව්ද පෙන්වා දෙමි. එමෙන්ම යුධ හමුදාවට අදාල විස්තර ගොනුවෙන් අනෙකුත් සියළුම ප්‍රධාන පද්ධතීන් මෙම පද්ධතියට සම්බන්ධ කිරීම තුලින් යුධ හමුදාවේ විශාලම විස්තරයක් සංචිතය ලබාගැනීමට හැකි වන බැව්ද පෙන්වා දෙමි.

තවද, යුද හමුදාව තුළ ක්‍රියාත්මක SL ARMY DATA NETWORK පද්ධතියේ සියලුම කටයුතු ප්‍රධාන සංඥා නිලධාරී මූලස්ථානයේ උපදෙස්වලට අනුව මෙම අංශ, සංඥා බලසේනා සහ පසම සමඟ සම්බන්ධතාවයෙන් සුදුසු සිදුකර ගෙන යනු ලබන අතර, එම පද්ධතිය මගින් යුධ හමුදාවේ විදිගත කටයුතු ඉතා කාර්යක්ෂමව කරගැනීමට හැකිවන බැව්ද පෙන්වා දෙනු ලැබේ.

දැනට සිදුකර ගෙන යනු ලබන සියළුම පරිගණක පද්ධති වල ප්‍රගතිය සමඟ අප තව තොරතුරු තාක්ෂණයෙන් දියුණු හමුදාවක් සමඟ සම තත්වයට පත්වීමට හැකි බව පෙන්වා දෙමි.

සංඥා බලකායේ නිලධාරීන්ගේ සහ සෙසුනිලයින්ගේ සම්පූර්ණ කැපවීම මත ඉහත සියලුම කටයුතු සිදුකර ගෙන යනු ලබන බැව් පෙන්වා දෙන අතර, බලකාධිපති තුමා ඇතුළු සංඥා බලකායේ සියළුම නිලධාරීන්ට, සෙසුනිලයින්ට, ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට සිවිල් සේවක මහතුන්ට සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට මෙම සඟරාව පළිදන්වන කාර්ය මණ්ඩලයට සුභාසිංසනය පිරිනාමීමට මෙය අවස්ථාවක් කරගනිමි.

ඒ.ඩී.පී. වික්‍රමසිංහ යූඑස්පී
බ්‍රිගේඩියර්
අධ්‍යක්ෂක තොරතුරු තාක්ෂණ



## සංඥා බළසේනාධිපතිගේ පණිවුඩය

වර්ෂ 1998 දී ප්‍රථම වරට එළි දැක්වූ "ද සිග්නලර්" සඟරාවේ 14 වන කලාපය එළි දක්වන මෙම අවස්ථාවේදී "ද සිග්නලර්" සඟරාවට පණිවුඩයක් නිකුත් කිරීම සඳහා අවස්ථාවක් ලැබීම මා ලද ගෞරවයක් හා භාග්‍යයක් ලෙස සලකමි.

පසුගිය දශකය තුළ ශ්‍රී ලංකා සංඥා බළකායේ සන්නිවේදන තාක්ෂණය ඇතුළු විෂය දැනුම බළකායේ ගෞරව සේවාවන් ඉටුකරනු ලබන සියලුම සාමාජිකයින් සඳහා දැනුම බෙදා දීමේ මාධ්‍යයක් ලෙසින් "ද සිග්නලර්" සඟරාව තුළ වර්ෂයෙන් වර්ෂයට අනුකූලව අඛණ්ඩව සුබ ගමුදාව තුළ ප්‍රකාශයට පත්කර ඇත.

14 වන කලාපයේ ලෙසංගු ලිපි, පාර්ථමෙය විස්තරයන් සහ තාක්ෂණික තොරතුරු පරිශීලනය කිරීමෙන් සංඥා බළකා සාමාජිකයින් හට සහ අනෙකුත් සියලුම පාඨකයන් හට දැනුම ලබාගැනීමට හැකිවන පරිදි මෙම සඟරාව පිළියෙල කිරීම සඳහා කැපවූ ඉහුකල කතෘ මණ්ඩල සාමාජිකයින් හට මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

"ද සිග්නලර්" සඟරාව සියලුම පාඨකයින් කියවමින්, ලබන සිගපිමෙන් ලෙසලා පරිශීලනය කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

"කියවීම මිනිසා සම්පූර්ණ කරයි" යන ශීර්ෂ පාඨ අනුව පිළිබිඹු කිරීම පස් "ද සිග්නලර්" සඟරාව ආරම්භයක් කර ගනු ඇතැයි මම බලාපොරොත්තු වෙමි.

ජන්ටම් ගෙට්ටිආරච්චි පියස්සි
බ්‍රිගේඩියර්
සංඥා බළසේනාධිපති






## සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායකගේ පණිවුඩය

"ද සිග්නලර්" 14 වන කලාපය එළිදක්වන මේ මොහොතේ සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක වශයෙන් දෙවන වරටත් පණිවුඩයක් ගෙන ඒමට ලැබීම ගැන මා පෞද්ගලිකවම ආඩම්බර වන අතර, එය මා ලැබූ භාග්‍යයක් කොට සලකමි.

69 වසරක ප්‍රෞඪ ඉතිහාසයක උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බළකාය පුරා 30 වසරක යුද්ධයේදී ලද අත්දැකීම් අනාගත අභිවෘද්ධිය සඳහා නව තාක්ෂණික මංපෙත් ඔස්සේ පෙරමග එළිපෙහෙලි කරමින් ගමන් ගන්නා මේ මෙහොතේ සංඥා බළකා සාමාජික සාමාජිකාවන් හා සමස්ථ යුද්ධ හමුදාවම දැනුවත් කිරීම සඳහා මෙවැනි සඟරාවක් අඛන්ඩව 14 වතාවක් ඉදිරිපත් කිරීමට හැකිවීම සමස්ථ සංඥා බළකායම ලද ජයග්‍රහණයකි.

වෘත්තීය සංඥා සෙබළුන්ගේ සැඟවුනු දක්ෂතා එළි දැක්වීමටත්, පසුගිය වසරේ අග භාගයේ සිට මේ දක්වා සංඥා බලකාය ගමන් ගත් ජයග්‍රාහී මඟ නිර්මාණශීලීව ඉතාමත් කෙටියෙන් ඔබ වෙත පිරිණැමීමට වෙහෙස මහන්සි වූ මෙම සඟරාවේ සංස්කාරක මණ්ඩල සාමාජිකයින්ට මා මේ අවස්ථාවේ මාගේ හෘදයාංගම ස්තූතිය පුදකර සිටිමි.

අවසාන වශයෙන් මෙම "ද සිග්නලර්" 14 වන කලාපයට නව නිර්මාණ, අදහස් හා නොයෙකුත් තොරතුරු ලබා දුන් සංඥා බළකායේ සාමාජික සාමාජිකාවන්ට මාගේ විශේෂ ප්‍රණාමය පිරිණමන අතර, "ද සිග්නලර්" දිනෙන් දින ගුණාත්මක හා කාලෝචිත සඟරාවක් ලෙස දියුණුවෙන් දියුණුවට පත් වේවායි හිත සිතින් ප්‍රාර්ථනා කරමි.

ඩීආර් ධර්මසිරි
කර්නල්
රෙජිමේන්තු මධ්‍යස්ථාන සේනාවිධායක




# ශ්‍රී ලංකා සංඥා බලකායේ ඉතිහාසය

ශ්‍රී ලංකා සංඥා බලකාය ස්වකීය අභිමානවත් ඉතිහාසයෙහි 70 වන වියට නොබෝදිනකින් පියනැගීමට නියමිතය. මූලිකව රාජකීය ඉංජිනේරු බලකායට අනුයුක්ත සංඥා සම්බන්ධතා සැපයීමේ බලඝණයක් වශයෙන් තිබී පසුව 1943 ඔක්තොබර් මස 19 වන දින පලකරන ලද 9183 ගැසට් නිවේදනය මගින් එය ලංකා සංඥා බලකාය ස්වකීය මුලාරම්භය සනිටුහන් කරන ලදි. රාජකීය ඉංජිනේරු බලකාය යටතේ සංඥා සම්බන්ධතාවය සපයන අවධියේදී නිලධාරින් දෙදෙනෙකුගෙන් සහ සෙසු නිළයින් 25 දෙනෙකුගෙන් සමන්විතව තිබූ එම බලඝණය සංඥා සම්බන්ධාතවය සඳහා වර්ණ පටු කොඩි, ලාම්පු, තෙලියොග්‍රාල්, ධාවන පැදිකරුවන් උපයෝගි කරගත් බැම් ඉතිහාසය සාක්ෂි දරයි.

1939 සැප්තැම්බර් මස 11 වන ලෝක සංග්‍රාමය ආරම්භයත් සමඟ සංඥා බලඝණය සක්‍රීය සේවය සඳහා කැඳවනු ලැබූ අතර එය පූර්ණ වශයෙන් ස්වේච්ඡා නිලධාරින් සහ සෙසු නිළයින්ගෙන් සමන්විත විය. එය ත්‍රිකුණාමලයෙහි ස්ථානගත කරන ලද අතර බලඝණාධිපති වශයෙන් ජී එච් ටොඩ්ද බණ්ඩභාර නිලධාරින් වශයෙන් 2/ලුති වින්ස්ටන් බෙලිස් පුනාන්දු එච් ඩබ් වුඩ් සහ එච් බී ස්කොට් යන නිලධාරින් කටයුතු කරන ලදි. ඉන් අනතුරුව එළඹි වසර වසර 02ක පමණ කාලය තුලදී යුධ තත්වයට පෙර සූදානමකින් සිදුවූ හමුදා සංවිධානයට සාපේක්ෂව සංඥා බලඝණයද කෙමෙන් ව්‍යාප්ත විය. 1941 වසරේදී ඉංජිනේරු බලකා සංවිධානයට අතිරික්ත සංඥා බලඝණයක් අංක 04 බලඝණය ලෙස ස්ථාපනය වූ අතර එහි නිළධාරි අණදෙන වශයෙන් ලුතිතන් එච්ඩබ් වුඩ් පත්විය. 1941 සහ 1942 වසර තුලදී සංඥා බලඝණයන්හි සිදුවූ ව්‍යාප්තියන් සමග ඇතිවූ නිලධාරි පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා සෙසු නිළයින් අධිකාරියට පත්කිරීම සිදුකරන ලද අතර ඒ අනුව සැරයන් සීආර් සිල්වා, සැරයන් එච්ජේ ඇන්ඩ්‍රියිස්, සැරයන් එටීඑ් සැරිමන්, සැරයන් ඩීවී බ්‍රෝහියර් යන 2/ලුතිතන් නිලයේ අධිකාරියට පත්කරන ලදි.

1942 දෙවන ලෝක යුද්ධයෙහි බලපෑම අග්නිදිග ආසියාව වෙත පැතිරීමත් සමඟ ලංකාව ආසියානු කලාපයෙහි වැදගත් යුධ අණදීමේ මධ්‍යස්ථානයක් බවට පත් වූ අතර බ්‍රිතාන්‍ය හමුදා සේනාවන් කීපයක් සංඥා රෙජිමේන්තුව සමඟ දිවයින තුල ස්ථානගත කරන ලදි. එම වකවානුවෙහි පැවැති සංඥා සම්බන්ධතා අවශ්‍යතාවය සපුරාලීම වස් ප්‍රදාන සංඥා නිලධාරි කාර්යාලයක් කොළඹ කලාභවන පරිශ්‍රයේ ස්ථාපිත කරන ලද අතර ප්‍රථම ප්‍රධාන සංඥා නිලධාරි වශයෙන් කර්නල් ෆ්‍රෑන්ක් විල්සන් පත්විය. දිවයින තුල ස්ථාපිතව තිබූ සංඥා බලඝණයේද යුද අවශ්‍යතාවයට සංඥා සම්බන්ධාවය සැපයීම වස් ප්‍රධාන සංඥා නිළධාරි කාර්යාලයට අනුයුක්ත කරන ලදි.

මෙලෙස සංඥා සම්බන්ධතා අවශ්‍යතාවය කෙමෙන් විශාල වීමත් සමගම එයට සමගාමීව සිදුවූ සංවිධානයෙහි ව්‍යාප්ත වීමද සමග සංඥා සම්බන්ධතාවය සඳහා ස්වාධීන බලකායක අවශ්‍යතාවය ඉස්මතු විය. ඒ අනුව 1943 ඔක්තෝබර් මස 19 වන දින අංක 9185 දරණ ගැසට් නිවේදනයේ ප්‍රකාරව ලංකා සංඥා බලකාය (Ceylon Signal Corps) ආරම්භය සිදුවිය. එය යුධ හමුදා සංවිධානයේ රෙජිමේන්තු ජ්‍යෙෂ්ඨතාවයෙහි ඉංජිනේරු බලකායට පසුව ජ්‍යෙෂ්ඨතාවය පිහිටුවන ලදි. එම යුගයේ අවශ්‍යතාවය සඳහා සංඥා බලකාය ස්වාධීනව සංවිධානය වීමත් සමග නව ආධුනිකයින් සැලකිය යුතු සංඛ්‍යාවක් බඳවාගැනීමද , අංක 01 සහ අංක 03 වශයෙන් බලඝණයන් දෙකක් මේජර් සීආර් ද සිල්වා සහ මේජර් වින්ස්ටන් මෙලිස් ප්‍රනාන්දුගේ අණදීම යටතේ ස්ථාපිත කරන ලදි. සංඥා බලකායේ විධායක අධිකාරි වගයෙන් ලුතිතන් ඩීවී බ්‍රොහීයර් පත්විය.

මෙම වකවානුව තුල නවක නිලධාරින් බඳවා ගැනීම වෙනුවට සංඥා සම්බන්ධතාවය පිළිබඳ හසල දැනුමක් ඇති ජ්‍යෙෂ්ඨ කොණොනීන් අධිකාරියට පත්කිරීමේ ප්‍රතිපත්තියට අනුව පීඩීඑස් රාජපක්‍ෂ, එන්ටී ජොබිස්, එල්ඒ ද සිල්වා , ජේඊ ප්‍රානාන්දු, සීඩබ් සෙනාරිස්, අයිවීඕ හොලිසින්ගර්, බීආර්සි වයිස්මන්, එස්එම් පෙරේරා, පිඩබ් ශ්‍රීකාන්ත, ටීඑස්එච් යංග්, එම් විජේනායක, එඊ රොබට්ස්, එම්ජේඑෆ්ආර් පෙරේරා, ඊ හසේ, ඊඩබ් සෙනාරිස් සහ වීසී බෘයි යන ජේකොණොනීන් අධිකාරියට පත්කරන ලදි.

1944 අගභාගය වන විට දෙවන ලෝක යුද්ධය තීරණාත්මක අවස්ථාවකට එළඹ තිබු අතර, සංඥා සම්බන්ධතා අවශ්‍යතාවයන් සඳහා නව බලසණයන් 2 ක් අංක 2 බලසණය සහ අංක 4 බලසණය වශයෙන් මේජර් වීසී කොලාර්ඩ් සහ මේජර් එච්ඩබ්ජී කූපර් යන නිළධාරින්ගේ අණදීම යටතේ ස්ථාපිතව අංක 2 බළසනය මහනුවරද අංක 4 බළසණය ත්‍රිකුණාමලයේදී ස්ථානගත විය. 1944 අගභාගයේදී ලංකාව තුල ස්ථාපිතව රාජකීය සංඥා රෙජිමේන්තුව සහ භට පිරිස් අතුරින් යුධ කලාපයන්හි ස්ථානගතවීම සඳහා දිවයිනෙන් බැහැරවිය. ප්‍රධාන සංඥා නිළධාරි වශයෙන් කටයුතු කල ලුතිනන් කර්නල් සැමුවෙල් යන ජ්‍යෙෂ්ඨ නිළධාරි තනතුරින් බැහැරවීමත් සමග එම තනතුර සඳහා ලුති කර්නල් මැකන්සි පත්වීමද විශේෂිත වූ අවස්ථාවක් සංඥා බලකාය සඳහා නව සිරස්ක ලාංඡනයක් සැකසීමේ වගකීම ලුතිනන් කර්නල් මැකන්සි වෙත පැවරීම පරිදි ඒ සඳහා රාජකීය සංඥා ලාංඡනය සමාන පරිදි එහි ඔටුන්න වෙනුවට ඇතකුගේ රූපය ඇතුලත් නව සංඥා සිරස්ක ලාංඡනයක් නිර්මාණය කරන ලදි.

දෙවන ලෝක යුද්ධයෙහි අවසානය සනිටුහන් කල 1945 වසරේදී බ්‍රිතාන්‍ය අතිරේක හමුදාවන් නැවත සියරට පැමිණීම සිදුවූ අතර, ඒ අනුව ලංකාව තුල ස්ථාපිත අතිරේක හමුදා බලඇණිද නැවත සියරට බලා නික්මයාමට සිදුවිය. සංඥා බලකායේ ප්‍රධාන සංඥා නිළධාරි වශයෙන් රාජකාරි කරන ලද ලුතිනන් කර්නල් මැකන්සි එම තනතුරින් සමුගත් අතර, ඉන්පසු එළඹෙන ලද වසරක පමණ කෙටි කාලසීමාවක් තුල ප්‍රධාන සංඥා නිළධාරින් වශයෙන් ලුතිනන් කර්නල් එෆ්ආර් බූත්, ලුති කර්නල් ලිඩියාම්, ලුති කර්නල් කිංග් යන නිළධාරින් කටයුතු කරන ලදි. පසුව එය ශ්‍රී ලංකීය නිළධාරියෙකු වූ මේජර් සීආර් ද සිල්වා විසින් කාර්‍ය නියුක්ත ප්‍රධාන සංඥා නිළධාරි තනතුර හොබවන ලදි. දෙවන ලෝක යුද්ධ නිමාවෙන් පසු කැටිබල් පෙදෙසෙහි පැවැති ප්‍රධාන සංඥා නිළධාරි මූලස්ථානය සම්පූර්ණයෙන්ම විසිරුවා හරින ලද අතර, ස්වේච්ඡා නිළධාරින් සහ සෙසු නිළයින් ස්වකීය සිවිල් සේවය සඳහා නික්මයන ලදි.

1947 වසරේදී දිවයිනෙහි අභ්‍යන්තර ආරක්‍ෂාව තහවුරු කිරීමේ උදෙසා ලංකා ආරක්‍ෂක බලකාය ස්ථාපනය කිරීමත් සමග ලංකා සංඥා බලකායෙහි ප්‍රතිස්ථාපනය සිදුවූ අතර, මේජර් කෙලාට් අණදෙන නිළධාරි වශයෙන්ද මේජර් සීආර් ද සිල්වා දෙවන අණදෙන නිළධාරි වශයෙන්ද කපිතන් ඩීවී බ්‍රෝහියර් විධායක අධිකාරි වශයෙන් ද පවත්වන ලදි.

ශ්‍රී ලංකාව යටත් විජිතයක්ව පැමිණ නිදහස ලැබීමෙන් පසු 1949 ඔක්තෝබර් මස 10 දින ලංකා යුධ හමුදාව අභිනවයෙන් ආරම්භය සුවිශේෂී සිදුවීමක් අතර, ඒ සඳහා සංඥා සම්බන්ධතාවය සැපයීම වෙනුවෙන් නිත්‍ය සංඥා බණ්ඩයක් ස්ථාපනය කිරීම සංඥා බලකායෙහි විශේෂිත වූ අවස්ථාවක් වශයෙන් දැක්විය හැක. මෙහි අණදීම ලුතිනන් එන්ටී ජොබිස් විසින් දරණ ලදි. එයට අමතරව ස්වේච්ඡා සංඥා බලකායද යුධ හමුදාවෙහි සංඥා සම්බන්ධතා සැපයීමේ වගකීම උදෙසා ප්‍රතිස්ථාපනය කරන ලදි.




1952 වසරේ ආරම්භයත් සමඟ ශ්‍රී ලංකා යුධ හමුදාවෙහි සිදුවූ ව්‍යාප්තියට සමගාමීව නිත්‍ය සංඥා ඛණ්ඩය බළඝණයක් දක්වා වර්ධනය විය. එහි බළඝණාධිපති ධුරය මේජර් බ්‍රෝහියර් විසින් දරණ ලදි. සංඥා බලකායෙහි අණදීම ලුතිනන් කර්නල් කෙලාට් විසින්ද පසුව ලුතිනන් කර්නල් සීආර් සිල්වා විසින් ද හොබවන ලදි. විධායක අධිකාරිධූරය කපිතාන් ජොබ්ස් විසින් දරණ ලදි. 1953 අගභාගයේදී බලකායෙහි අණදීම ලුතිනන් කර්නල් වින්ස්ටන් බෙලිස් ප්‍රනාන්දු විසින් දරණ ලදි. 1953 සිට 1959 දක්වා කාලසීමාව තුල ලංකා යුධ හමුදාව අභ්‍යන්තර ආරක්‍ෂක රාජකාරීන් සහ හදිසි අවස්ථාවන්ට භට පිරිස් යෙදවීමට සිදුවූ කාර්ය බහුල වකවානුවක් විය. 1953 වසරේ පැවැති හර්තාලය මැඩ පැවැත්වීමට සංඥා සම්බන්ධතාවය සැපයීම 1952 වසරේ නීති විරෝධී සංක්‍රමිකයන් දිවයිනට පැමිණීමට එරෙහිව සිදුකල "ඔප් මොන්ටි" ක්‍රියාන්විතයට සංඥා සම්බන්ධතාවය සැපයීම 1956 ජාතිවාදී අරගල මැඩපැවැත්වීම සඳහා ක්‍රියාන්විතයට සංඥා සම්බන්ධතාවය සැපයීම සහ එම වසරේ 1959 වසරේ ජල ගැල්මෙන් විපතට පත්වූවන්ට සහන සැලසීම සඳහා සිදුකල හමුදා ක්‍රියාන්විතයන්ට සංඥා සම්බන්තාවය සැපයීමද, සංඥා බලකාය විසින් සිදුකල භාරදූර සංඥා රාජකාරීන් වශයෙන්ද දැක්විය හැකිය. ශ්‍රී ලංකා යුධ හමුදාව ආරම්භයේ සිට දශකයක පමණ කාල සීමාවක් ගුවන් විදුලි සංඥා සම්බන්ධතාවය සැපයීම සඳහා අංක 19, අංක 31 "අංක 38 මාර්ක් III" අංක 52, අංක 53 "අංක 62 සහ අංක 88" යන ගුවන් විදුලි යන්ත්‍රන් උපයෝගී කරගත් බැව් ඉතිහාස පිළිබඳ කරුණු සෙවීමේදී අනාවරණය වේ.

අභ්‍යන්තර ආරක්‍ෂක රාජකාරී සහ ජාතික අවශ්‍යතාවයන් උදෙසා යුධ හමුදාවෙහි භාරධූර වගකීමට සාපේක්‍ෂව යුධ හමුදා සංවිධානයෙහි වර්ධනයද කාලීනව සිදුවූ අතර, එයට සමගාමීව 1958 වසරේ ඔක්තෝබර් 19 දින ප්‍රථම සංඥා රෙජිමේන්තුව අභිනවයෙන් ආරම්භය සනිටුහන් කිරීම සංඥා බලකායෙහි ඉතිහාසයෙහි විශේෂිතවූ අවස්තාවක් 1 වන සංඥා රෙජිමේන්තුවෙහි ප්‍රථම අණදෙන නිළධාරී වශයෙන් ලුතිනන් කර්නල් ඩග්ලස් වර්නන් බ්‍රෝහියර් පත්විමද සුවිශේෂී වු අවස්ථාවකි. එම නිළධාරී සෙසු නිළයෙකු ලෙස සක්‍රීය හමුදා දිවිය ආරම්භ කර සැරයන් නිළයේ සිට 2/ලුතිනන් වරයෙකු වශයෙන් අධිකාරියට පත්ව බණ්ඩභාර නිළධාරියෙකු, විධායක අධිකාරි, බළඝණාධිපති තනතුරු හොබවා අණදෙන නිළධාරී තනතුරටද, ප්‍රධාන සංඥා නිළධාරී තවතුරටද පත්විමද ඉතාමත් අගයකලයුතු අතීත මතක සටහනකි. අභිනවයෙන් ආරම්භවූ 1 වන සංඥාරෙජිමේන්තුව ........................................ සිය මූලස්ථානය පිහිට වූ අතර, ප්‍රථම උප අණදෙන නිළධාරී වශයෙන් මේජර් .................................... ආරම්භයේදී එය බලඝණයන් ............... ......................... කින් සමන්විතය. ප්‍රථම බළඝණාඕපති වරුන් වශයෙන් මේජර් ................................... මේජර් ...................................................................... .................... පත්වූ අතර, ප්‍රථම විධායක අධිකාරී ධූරය කපිතාන් ............................................. විසින්ද රෙජිමේන්තු සැරයන් මේජර් ධූරය බනි 1 පීජේ ද සිල්වා විසින්ද හොබවන ලදි.

## මතක පොතින්

# ශ්‍රී ලංකා සංඥා බලකායේ 68 වන සංවත්සරය































2012 ජූලි මස 12 වන දින ශ්‍රී ලංකා යුධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ලෙස වත්මන් සංඥා බලකාධිපති මේජර් ජෙනරාල් ඒ පී ද ඉසෙඩ් අබේසේකර යූඑස්පී සුභ මොහොතින් වැඩ භාරගත් අවස්ථාව









2012 ජූලි මස 13 වන දින ශ්‍රී ලංකා යුධ හමුදාවේ නියෝජ්‍ය මාණ්ඩලික ප්‍රධානී ලෙස මේජර් ජෙනරාල් ඒ පී ද ඉසෙඩ් අබේසේකර යූඑස්පී විසින් නව තනතුරේ වැඩ භාර ගැනීම වෙනුවෙන් සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය විසින් සංවිධානය කරනු ලැබූ උත්සවයේ විශේෂ අවස්ථා



2012 ජනවාරි මස 29 වන දින ආඥාපති යුද්ධ හමුදා පුහුණු ලෙස මේජර් ජෙනරාල් එච්ජ්ටීඑච්ජ් හේරත් පීඑස්සී සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාරගත් අවස්ථාව



2012 අප්‍රේල් මස 04 වන දින ආරක්‍ෂක මාණ්ඩලික ප්‍රධානී කාර්යාලයේ ප්‍රධාන මාණ්ඩලික නිළධාරි ලෙස මේජර් ජෙනරාල් එස්ජ්පීපී සමරසිංහ ආර්එස්පී පීඑස්සී සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාරගත් අවස්ථාව



2011 ජූලි මස 30 වන දින 57 වන සේනාංකයේ සේනාංකාධිපති ලෙස බ්‍රිගේඩියර් කේආර්පී රොවෙල් ආර්ඩබ්පී යූඑස්පී පීඑස්සී සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාරගත් අවස්ථාව



2012 ජූනි මස 03 වන දින 55 වන සේනාංකයේ සේනාංකාධිපති ලෙස බ්‍රිගේඩියර් බීඑච්එම්ජ් විජේසිංහ පීඑස්සී සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාරගත් අවස්ථාව

- බ්‍රිගේඩියර් එච්පී සෙනෙවිරත්න - 2011 ජූලි මස 14 වන දින 621 වන බලසේනාවේ බලසේනාධිපති වශයෙන් වැඩ භාරගන්නා ලදි
- කර්නල් කේඑම්ආර්පී කරුණාතිලක පීඑස්සී - 2011 අගෝස්තු මස 23 වන දින 642 වන බලසේනාවේ බලසේනාධිපති වශයෙන් වැඩ භාරගන්නා ලදි
- කර්නල් සීඑම්ඩීපී චන්ද්‍රසේකර - 2011 ජූලි මස 25 වන දින 651 වන බලසේනාවේ බලසේනාධිපති වශයෙන් වැඩ භාරගන්නා ලදි
- කර්නල් ඩබ්පීඩී වන්නිආරච්චි පීඑස්සී - 2011 නොවැම්බර් මස 11 වන දින 552 වන බලසේනාවේ බලසේනාධිපති වශයෙන් වැඩ භාරගන්නා ලදි
- කර්නල් එන්පී අකුරන්තිලක - 2011 නොවැම්බර් මස 04 වන දින 662 වන බලසේනාවේ බලසේනාධිපති වශයෙන් වැඩ භාරගන්නා ලදි
- කර්නල් පීජ්ජේ පීරිස් - 2012 වන දින 681 වන බලසේනාවේ බලසේනාධිපති වශයෙන් වැඩ භාරගන්නා ලදි

# ප්‍රධාන සංඥා නිළධාරී මූලස්ථානය

වර්ෂ 1943 වූ ඔක්තෝම්බර් මස 19 වන දින ආරම්භ කරන ලද සංඥා බලකාය 2007 වර්ෂය වන විට සංඥා බලසේනා මූලස්ථානය, සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය, සංඥා සම්බන්ධතා ඒකක 04ක් (ස්වේච්ඡා සංඥා ඒකක - 01 ක් ඇතුළුව), ආධාරක බලඇණි 02ක්, තොරතුරු තාක්ෂණ ඒකකයක්, සංඥා මූලික වැඩපල සහ සංඥා පාසල වශයෙන් පැවතුනි

මෙම වකවානුවේ උතුරු නැගෙනහිර ත්‍රස්ථවාදය උත්සන්නව පැවති අතර, එම ත්‍රස්ථවාදී කටයුතු මැඩපැවැත්වීම සඳහා යුද හමුදාවට විශාල කාර්‍යය භාරයක් පැවරුණු අතර, ඒ සඳහා අවශ්‍යය සංඥා සම්බන්ධතා සැපයීමේ භාරධූර වගකීම සංඥා බලකායට පැවරිණි. මෙම භාරධූර කර්‍යයට සාර්ථකව මුහුණදීම සඳහාද සංවිධානාත්මකව සහ සැලසුම් සහගතව සියළු සංඥා සම්බන්ධතා කටයුතු සම්බන්ධීකරණය සඳහාද ARO 44/2007 යුද හමුදා චර්යා නියෝග අනුව 2007 මාර්තු 12 වන දින පනාගොඩ යුද හමුදා ජනපදය තුල ප්‍රධාන සංඥා නිළධාරි මූලස්ථානය ස්ථාපනය කරන ලදි

එවකට බලසේනාධිපති ලෙස කටයුතු කල බ්‍රිගේඩියර් ටීඑෆ් මිඩින් ආර්එස්පී නිළධාරි අභිනවයෙන් ස්ථාපිත ප්‍රධාන සංඥා නිළධාරි මූලස්ථානයේ ප්‍රධාන සංඥා නිළධාරි ලෙස රාජකාරි භාරගන්නා ලදි. ඉන් අනතුරුව 2009.07.22 දින සිට 2011.08.29 දින දක්වා ප්‍රධාන සංඥා නිළධාරි තනතුර මේජර් ජෙනරල් එස්ඒපීපී සමරසිංහ ආර්එස්පී පීඑස්සී විසින් දරන ලද අතර 2011.08.30 දින සිට මේ දක්වා බ්‍රිගේඩියර් ආර්ඒ කඩුවෙල ප්‍රධාන සංඥා නිළධාරි ලෙස රාජකාරි ඉටුකරනු ලබයි.



බ්‍රිගේඩියර් ආර්ඒ කඩුවෙල ප්‍රධාන සංඥා නිළධාරි වශයෙන් 2011 අගෝස්තු මස 30 වන දින සුභ මොහොතින් වැඩ භාරගැනීම

## ප්‍රධාන සංඥා නිළධාරි මූලස්ථානයේ වත්මන් තනතුරු හොබවන නිළධාරීන්/සෙසුනිළයින්.

- ප්‍රධාන සංඥා නිළධාරි - බ්‍රිගේඩියර් ආර්ඒ කඩුවෙල
- කර්නල් තොරතුරු තාක්ෂණ - කර්නල් කේඑච්ඩබ්ලිව් සුමනදාස යූඑස්පී
- කර්නල් සම්බන්ධීකරණ - කර්නල් එල්එස්පී පෙරේරා
- ප්‍රමානි 1 (විදුසංබ) - ලුතිතන් කර්නල් ආර්එම්පීඑස්බී රත්නායක
- ප්‍රමානි 1 (සංඥා) - මේජර් කේඑම්පී බණ්ඩාරනායක පීඑස්සී
- ප්‍රමානි 11 (සංඥා) - මේජර් එම්පීසීබී ජයශාන්ත
- ප්‍රධාන ලිපිකරු - බනි 11 සරත් කුමාර එම්

## ප්‍රධාන සංඥා නිලධාරි මූලස්ථානය යටතේ පාලනය වනු ලබන අනිකුත් මූලස්ථාන

- තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය
- සංඥා බලසේනා මූලස්ථානය
- 11 වන ශ්‍රීලංකා සංඥා රෙජිමේන්තුව
- සංඥා මූලික වැඩපල

## ප්‍රධාන කාර්යභාර්ය

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ අණ පාලනය සහ පරිපාලනය සඳහා අවැසි සංඥා සම්බන්ධතා, තොරතුරු තාක්‍ෂණය සහ විද්‍යුත් සංග්‍රාම අවශ්‍යතාවයන් සපයා දීම.

## ප්‍රධාන කාර්යයන්

- යුද්ධ හමුදාධිපති වෙත අණ, පාලනය, සංඥා, පරිගණක, තොරතුරු (C4I) සහ විද්‍යුත් සංග්‍රාම කටයුතු සඳහා සියළු සංඥා සම්බන්ධතා පිළිබඳ උපදෙස් ලබා දීම.

- අණ, පාලනය, සංඥා, පරිගණක, තොරතුරු (C4I) සහ විද්‍යුත් සංග්‍රාම කටයුතු සඳහා සියළු සංඥා සම්බන්ධතා කටයුතු සැලසුම් කිරීම ඇගයීම සහ පුහුණු වීම් කටයුතු සිදුකිරීම.

- සියළු සංඥා වැය ශීර්ෂ පාලනය කිරීම, ඉදිරි වාර්ෂික මිළදීගැනීම් සැලසුම් කිරීම, සියළු සංඥා උපකරණ (සංඥා, තොරතුරු තාක්‍ෂණ සහ විද්‍යුත් සංග්‍රාම) අළුත්වැඩියා කිරීම හා පවත්වාගෙන යාම. සියළු සංඥා සම්බන්ධතා, තොරතුරු තාක්‍ෂණ සහ විද්‍යුත් සංග්‍රාම උපකරණ වල පර්යේෂණ හා සංවර්ධන කටයුතු හඳුනා ගැනීම සහ එම කටයුතු ක්‍රියාවට නැංවීම.

- සියළු සංඥා සම්බන්ධතා, තොරතුරු තාක්‍ෂණ සහ විද්‍යුත් සංග්‍රාම පිළිබඳ ප්‍රතිපත්ති, නියෝග, උපදෙස් හා ක්‍රියාපටිපාටි ක්‍රමවත්ව පවත්වාගෙන යාම.

- ආරක්‍ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව, ගුවන්, නාවික හමුදාවන්, පොලිස් දෙපාර්තමේන්තුවද වෙනත් රජයේ සහ පුද්ගලික අංශ සමග සහයෝගයෙන් සංඛ්‍යාත පරාස කළමණාකරණය.

- ජාතික ආරක්‍ෂාව පිළිබඳ සියළු සංඥා සම්බන්ධතා, තොරතුරු තාක්‍ෂණ සහ විද්‍යුත් සංග්‍රාම ක්‍රියාකාරකම් පිළිබඳ ආරක්‍ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයට අවශ්‍ය උපදෙස් ලබාදීම.

- සංඥා සහ තොරතුරු තාක්‍ෂණය ක්‍රියාකාරකම් පිළිබඳ සියළු රාජ්‍ය දෙපාර්තමේන්තු සහ ආයතන සඳහා අවැසි උපදෙස් ලබාදීම.

- විදුලි සංදේශ හා සංඛ්‍යාත පරාස සම්බන්ධයෙන් පැනනගින ගැටළුවලදී ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සමග සම්බන්ධීකරණය සහ සහයෝගීව කටයුතු කිරීම.

- සංඥා බලකායේ පුහුණු ප්‍රතිපත්ති, පුහුණු විෂය මූලික කරුණු, සැලසුම් නිර්මාණය, ක්‍රමවත් බව සහ ඇගයීම් සිදුකිරීම.

- ප්‍රධාන සංඥා නිළධාරි මූලස්ථානය යටතේ පාලනය වන අනෙකුත් ආයතන වල ප්‍රධාන කාර්යයන් සහ සෙසු කාර්යයන් නිවැරදිව සිදුවන බවට තහවුරු කර ගැනීම.

# තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය

වසර 30 ක පමණ කාලයක් පැවති යුධ වාතාවරණය අවසන්වූ පසු යුධ හමුදාව තුල තොරතුරු තාක්ෂණයේ වර්ධනයක් පෙන්නුම් කල අතර එහි ප්‍රතිපලයක් වශයෙන් 2010 මාර්තු මස 01 දින ප්‍රධාන සංඥා නිළධාරි මූලස්ථානය යටතේ මෙම අධ්‍යක්ෂක මණ්ඩලය ආරම්භ විය. මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රථම අධ්‍යක්ෂක ලෙස බ්‍රිගේඩියර් එස්ජේ වික්‍රමසිංහ යූඑස්පී යන ජ්‍යෙෂ්ඨ නිළධාරි පත් වූ අතර එතුමා වත්මන් අධ්‍යක්ෂක වශයෙන්ද කටයුතු කරනු ලබයි.

නිළධාරින් 15 ක් හා සෙසු නිළයින් 45 දෙනෙකු මෙම අම අනුමත සංස්ථාවට ඇතුලත්ව ඇති අතර දැනට තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂක ඇතුලු නිළධාරින් 03 දෙනෙකු සහ ප්‍රධාන ලිපිකරු ඇතුලු ලිපිකරුවන් 13 කින් යුත් කාර්ය මණ්ඩලයක් මගින් කාර්යාලීය රාජකාරි ඉටුකරගෙන යනු ලබයි.

මෙම අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය යටතේ පරිගණක විද්‍යාගාරයක් සහ දත්ත මධ්‍යස්ථානයක්ද පවත්වගෙන යනු ලබයි. පරිගණක විද්‍යාගාරය තුල රාජකාරි කරනු ලබන වෘත්තීමය පරිගණක නිළධාරින් මගින් පහත සඳහන් පරිගණක ව්‍යාපෘතීන් තෝරාගත් ස්ථානයන් සඳහා ආරම්භ කර ඇති අතර, මෙම ව්‍යාපෘති කටයුතු මෙම අම අධ්‍යක්ෂකගේ පූර්ණ අධීක්ෂණය යටතේ සාර්ථකව සිදුකර ගෙන යනු ලබයි.

- Central HR System for whole Army.
- Material Management System for Dte of Ord Svcs, Connecting all Ordnance depots.
- Integrated Procurement Management System for MGO Br, Dte of Ord Svcs and DGFM.
- Welfare Management System.
- Hospital Management System.
- Transport Management System for Dte of S&T.
- Project Progress Monitoring System for Dte of ES.
- Integrated Finance Management System for FM Br.
- Strength Reconciliation system weapon & Ammo Monitoring System for Dte of Ops CAAD.
- Assest Management System.
- Intranet (Web Portal) for whole Army.
- Training Information System for Dte of Trg.
- Supply Management System for Dte S&T.
- Hotel Management System for Wadduwa Holiday Resort
- Intelligence System for Dte of MI
- Wksp Management System

මෙම ව්‍යාපෘති කටයුතු අඛණ්ඩව පවත්වා ගෙන යාම සඳහා සහ යුධ හමුදාවට ඇවැසි සියලුම පරිගණක කටයුතු සඳහා 2010 වසරේ සිට 2012 වසර දක්වා කාලසීමාව තුල වෘත්තීමය පරිගණක නිළධාරින් කපිතන්/ලුතිතන් නිළයෙන් 35 දෙනෙකු අලුතින් බඳවාගෙන ඇති බවත් 2012 වර්ෂයේදී ද නිළධාරින් 14 දෙනෙකු බඳවා ගැනිමට නියමිතව ඇත.

මෙම ව්‍යාපෘතින් අතරින් CENTRAL HR MANAGEMENT SYSTEM ව්‍යාපෘතිය යුද හමුදාවට ඉතාම වැදගත් ව්‍යාපෘතියක් වශයෙන් පෙන්වාදිය හැකි අතර මෙම ව්‍යාපෘතියට ඉහත දක්වා ඇති අනෙකුත් ව්‍යාපෘති සම්බන්ධ කිරීම තුලින් නිළධාරි/සෙසුනිළයින්ගේ පුද්ගලික විස්තර ලබාගත හැකි වනවා පමණක් නොව යුධ හමුදාවේ සියලුම පුද්ගලික තොරතුරු ක්ෂණිකව ලබා ගැනීමට හැකි වනු ඇත.

දැනට යුධ හමුදාව තුල ක්‍රියාත්මක SL ARMY DATA NETWORK ජාල පද්ධතියේ සියලුම කටයුතු ප්‍රසංනිමු හි අධීක්ෂණය යටතේ මෙම අම, සංඥා බසේමු සහ පසම සමග සම්බන්ධතාවයෙන් සිදුකරගෙන යනු ලබයි. යුද හමුදාවේ ජාලගත ස්ථානයන් අතර දත්ත හුවමාරු කටයුතු (DATA TRANSFERING) සහ විද්‍යුත් සාකච්චාවන් (VEDIO CONFERENCING) මේ මගින් කාර්යක්ෂමව සිදුකර හැකි බැවිද පෙන්වා දෙනු ලැබේ.

මෙම අම මගින් ආරම්භ කර ඇති සියලුම ව්‍යාපෘති කටයුතු වල ප්‍රගතියක් සමග ලොකයේ තොරතුරු තාක්ෂණයෙන් දියුණු හමුදාවන් සමග අපට එක්විය හැකි වනු ඇත.



තොතාඅම විද්‍යාගාරය තුළදී යුද හමුදාවේ ස්ථානයන් සඳහා අවශ්‍ය වන පරිගණක ව්‍යාපෘති (COMPUTER PROJECTS) සැකසීමේ කටයුතු වල නියැලි සිටින නිලධාරින් සහ සෙසුනිළයින්



සමස්ථ යුද හමුදාවේම නිලධාරින්ගේ සහ සෙසුනිළයින්ගේ පුද්ගලික විස්තර ඇතුලත් කිරීම සඳහා තොතාඅම මගින් සකස්කර ඇති මානව සම්පත් කළමණාකරණ පද්ධතිය පිළිබඳව ඒකක නියෝජිතයින් දැනුවත් කිරීමේ පුහුණු සැසියක්

# සංඥා බල සේනා මූලස්ථානය

# 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

1996.12.31 දින සිට 1 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය මින්නේරිය මහසෙන්පුර යන ස්ථානයේ ස්ථාන ගතවෙමින් නැගෙනහිර ප්‍රදේශය ආවරණය වන පරිදි සංඥා සම්බන්ධතාවයන් හා ආරක්ෂක රාජකාරින්හි නිරත විය. ඝණ වනාන්තර භූමියක ස්ථාපනය වු මෙම ඒකකය එම භූමිය ඉතා අලංකාරවත් ලෙස සම්පූර්ණ යුධ හමුදා පරිශ්‍රයක් බවට පත් කරන ලදි. නැගෙනහිර මුදවා ගැනීමේ මානුෂීය මෙහෙයුම සක්‍රිය දායකත්ව සපයමින් නැගෙනහිර ප්‍රදේශය සම්පූර්ණයෙන්ම ත්‍රස්ථවාදින්ගෙන් මුදවාගැනීමේ ක්‍රියාන්විතයන් සඳහා සාර්ථක සංඥා සම්බන්ධතාවයක් ලබාදීමට මෙම ඒකකය දායක වු අතර ඒ සඳහා 2008.11.15 දින වැලිකන්ද ප්‍රදේශයේ ස්ථානගත විය. වැලිකන්ද ප්‍රදේශයේ ස්ථානගතවීමෙන් අනුරුව එවකට පැවති අධි ක්‍රියාන්විත අවශ්‍යතාවය මත ඒකකය ඔඩ්ඩුසුඩාන් ප්‍රදේගයේ ස්ථානගත වන ලදි.

වන්නි මානුෂීය මෙහෙයුම අවසන්වී මාස කිහිපයක් ගතවී යනවාත් සමගම ආරක්ෂක සේනා මූලස්ථානය (මුලතිව්) වෙතින් අක්කර 50 කින් පමණ සමන්විත වූ ඝණ වනාන්තර භූමියක් ඒකකය ස්ථාපනය කරගැනීම සඳහා ලබාදෙන ලදි. ඒ අනුව මෙම ඒකකය 2009 සැප්තැම්බර් මස 30 වන නැවත ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ සිට මුලතිව් හි වට්ටප්පලෙයි ප්‍රදේශයේ අක්කර 50 කින් පමණ සමන්විත වූ භූමියක ස්ථාන ගතවන ලදි. එම භූමිය නිවැරදිව හා ක්‍රමානුකූලව කඳවුරක් බවට පරිවර්ථනය කිරීමේ අභියෝගය සහ වගකීම එවකට සිටි අණදෙන නිළධාරි තුමා සහ අනෙකුත් නිළයින් වෙත පැවරී තිබුණි. අවම පහසුකම් යටතේ කෙටි කාලයක් තුලදී අප බලකායේ මෙන්ම වෙනත් මූලස්ථානයන්හි ජ්‍යෙෂ්ඨ නිළධාරින්ගේ පැසසුමට ලක්වන අයුරින් කඳවුරකට අවශ්‍ය මූලික ඉදිකිරීම් කටයුතු සහ මනරම් බුදු මැදුරක්ද සහිත නිවාසද නිළධාරි නිවස්නය සහ රෙජිමේන්තු මුලස්ථන ගොඩනැගිල්ල මනා ලෙස නිම කර ගැනීමට හැකිවුයේ නිළධාරි සහ සෙසුනිළයන්ගේ අප්‍රතිහත ධෛර්‍ය නිසාවෙනි.

අනතුරුව 2010.12.03 දින ඒකක අණදීමේ කාර්යභාරය ලුතිනන් කර්නල් ආර් ඇල්විටිගල නිළධාරි විසින් භාරගන්නා ලද අතර කරගෙන යනු ලැබූ ඉදිකිරීම් කටයුතු අවසන් කර නව ඉදිකිරීම් කටයුතු ආරම්භ කරමින් නවතමයෙන් බෝ මළුව වටා දැකම්කළු බෝධි ප්‍රාකාරයක් ඉදිකිරීමට කටයුතු කරන ලදි. එතෙක් ඒකකයට අඩුපාඩුවක්ව පැවති මුරහලක්ද ඉදිකිරීමට කටයුතු කල අතර එම මුරහල සංඥා බලකාධිපති තුමන් විසින් 2011.11.06 දිනට යෙදුනු සුභ මොහොතින් විවෘත කරන ලදි.

2012.03.16 වන දින වර්ථමාන අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් බීඩබ්එම්ජේඒ ප්‍රේමදාස ආර්එස්පී විසින් නව අණදෙන නිළධාරි වශයෙන් වැඩ භාර ගත් අතර ඔහුගේ ඍජු අධීක්ෂණය යටතේ රූපවාහිනී නැරඹුම් මැදිරියක් සහිතව සෙසුනිළ විවේක ප්‍රදේශයක් ඉදිකරන ලද අතර එය සංඥා බළකාධිපතිතුමාගේ සුරතින් 2012.04.29 වන දින විවෘත කරනු ලැබීය. එසේම ඒකකයට අඩුපාඩුවක්ව පැවති ජල පහසුකම් නිවැරදිව හා ක්‍රමවත්ව සපයා ගැනීම සඳහා යුධ හමුදා ප්‍රථිපාදන මත අඩි 30 කට වඩා වැඩි උසකින් යුතු සුවිසල් ජල ටැංකියක් සකස්කර ගැනිමේ මූලික කටයුතු අවසන්කර ඇති අතර නුදුරේදීම එම පහසුකම් ඒකකයේ නිළධාරි සහ සෙසුනිළයින් සියළු දෙනාටම අත්විදීමට හැකියාව ලැබෙනු ඇත. මිට අමතරව ප්‍රාදේශියව සපයා ගන්නා ලද අමුද්‍රව්‍යද උපයෝගි කර ගනිමින් ඒකකයේ ඉදිකර තිබූ බේකරිය නවිකරණය කිරීමේ කටයුතුද සිදුකර ඇති අතර නිසි සැලසුමකින් සමන්විත අණදෙන නිළධාරි නිවස්නය බනි/සැරයන් නිවස්නය නිවාඩු නිකේතනය සහ නූතන අංගෝපාංග ද ඇතුළුව නවින මළුතැන්ගෙයක් ඉදිවෙමින් පවතී. මිට අමතරව ඒකකයේ සෙසු නිළයින්ගේ සනීපාරක්ෂක කටයුතු වැඩි දියුණු කිරීමෙහිලා අංගසම්පූර්ණ වැසිකිළි පද්ධතියක්ද ඉදිකර ඇති අතර අනෙකුත් මූලික සුභ සාධන කටයුතු දියුණු කරමින් පවතී.

සංඥා සම්බන්ධතාවය සහ ඉදිකිරීම් වලට අමතරව මෙම ඒකක නිළධාරින් හා සෙසුනිළයින් සංඥා අන්තර් ඒකක ක්‍රීඩා තරඟාවලියන්හිදි 2012 වර්ෂය තුළ මේ දක්වා පහත සදහන් දක්‍ෂතාවයන් දක්වමින් දිනෙන් දින ස්ථාවරත්වයට පත්වෙමින් පවතී.

- ඔරු පැදීමේ තරඟාවළිය අන්තර් ඒකක ශූරතාවය
- පාපන්දු අන්තර් ඒකක අනුශූරතාවය
- මේස පන්දු අන්තර් ඒකක අනුශූරතාවය
- එල්ලේ අන්තර් ඒකක අනුශූරතාවය
- බැට්මින්ටන් අන්තර් ඒකක තුන්වන ස්ථානය

මෙම ඒකකය දැනට ලබා ඇති ප්‍රගතිය සහ ඉදිකරමින් පවතින ගොඩනැගිලි දෙස බලන කළ ඒකකය නුදුරේදිම ඉතා ආකර්ෂණීය ස්ථානයක් වන අතර මෙහි සියළු නිළයින්ගේ රාජකාරි සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීමෙන් වෘත්තිමය ගුණාංගද ඉහල මට්ටමක පවත්වා ගනී. මෙම ඒකකයට අළුතින් එක්වන ලද 10 ශ්‍රිලංසංබ නිළධාරි සහ සෙසුනිළයින්ද ඒකක නිළධාරි සහ සෙසුනිළයින්ද මෙම ඒකකය වෙනුවෙන් කරනු ලබන සෑම කැපකිරීමක්ම හේතුවෙන් 1 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය දිනෙන් දිනම සීඝ්‍ර දියුණුවක් කරා පිය නගනු නොඅනුමානය.



නව අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් බීඩබ්එම්ජේඒ ප්‍රේමදාස ආර්එස්පි ජ්‍යෙෂ්ඨ නිළධාරි හට පිරිනමන ලද ආචාර පෙළපාලිය



2012.03.16 දින ලුතිතන් කර්නල් බීඩබ්එම්ජේඒ ප්‍රේමදාස ආර්එස්පි 1 ශ්‍රිලංසංබ ඒකකයේ 24 වන අණදෙන නිළධාරි ලෙස සුභ මෙහොතින් වැඩ භාරගැනීම



2012 අන්තර් ඒකක පාපන්දු තරඟාවලියේ අවසන් මහා තරඟය සඳහා කණ්ඩායම් දෙකට සුභ පතමින්



2012.04.29 වන දින සංඥා බලකාධිපතිගේ ඒකක සංචාරය



පණදෙන නිළධාරි විසින් ඒකකයේ නව මුළුතැන් ගෙය ඉදිකිරීම සඳහා මුල්ගල තැබීම



බලකාධිපතිතුමා ඒකක ඉදිකිරීම් නිරීක්ෂණය කරමින්



බළකාධිපති තුමා විසින් ඒකකයේ නව නිවාඩු නිකේතනය ඉදිකිරීම් පරීක්ෂා කරමින්



2012.04.11 වන දින සියළු නිළයින්ගේ සහභාගිත්වයෙන් පැවැත්වූ සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය

# 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

1989 මාර්තු මස 09 වන දින සංඥා බලකා මැණියන්ගේ කුසින් මෙළොව එළිය දුටු 3 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය මේ වන විට වසර 22 ක් සපිරූ නව යෞවනයෙක් බවට පත්වී සිටී. දශක 03 ක් පමණ මාතෘ භූමිය වෙලාගෙන සිටි කුරිරු ත්‍රස්ථවාදීන්ගේ හඩ නිහඩ කිරීමට සක්‍රියව දායක වෙමින් ත්‍රස්ථ හඩ නිහඩ කිරීමෙන් පසු වසර දෙකක් ගෙවන මේ මොහොතේ අප උපන් බිමට ඉටු කලාවූ සේවය වෙනුවෙන් නිහතමානීව සතුටට හා ආඩම්බරයට පත්වන්නෙමු.

මෙම වසර 23 පුරාවට මව් බිම තෝරා ගැනීමේ මහා ක්‍රියාන්විතයන් සඳහා සංඥා රාජකාරී මෙන්ම පාබල රාජකාරීන් ඉටුකිරීමේදී රට ජාතිය වෙනුවෙන් තම ජීවිත පුජා කළ මෙම ඒකක විරුවන් මේ මොහොතේ හද පිරි ගෞරවයෙන් යුතුව සිහිපත් කරන්නෙමු.

අප ඒකකය 21 සේනාංකය යටතේ අනුරාධපුර රණසේවාපුර ස්ථානගතව රාජකාරීන්හි නිරතව සිට 2007 සැප්තැම්බර් මස 18 වන දින ආරක්‍ෂක සේනා මූලස්ථානය - යාපනය බලප්‍රදේශය වෙත පැමිණ වසර 05 කට ආසන්න කාලයක් ගතවී ඇති මේ මොහොතේ ආසේමු (යා) වෙතින් පාලනය වන සේනාංක හා බලසේනාවන්හි සංඥා සම්බන්ධතා ගොඩනැගීමේ කාර්යයට දායකත්වයක් දෙමින් ඉතා උසස් මට්ටමින් ඒකකයේ ගෞරවය, කීර්තිනාමය ගොඩනගාගෙන ඇත.

ආරක්‍ෂක සේනා මූලස්ථානය - යාපනය බලප්‍රදේශය තුල ඇති ඒකකයන්හි සංඥා රාජකාරීන් හි නිරතවීමට හැකි සෙබළුන් පිරිසක් බිහි කිරීමේ අරමුණින් වෙනත් ඒකක සංඥා පාඨමාලාවන් 02 ක්ද විශේෂ පාබළ ඛණ්ඩ පුහුණු පාඨමාලවන් හි සංඥා අධියරයන් 02 ක් මෙම වසර තුලදී පවත්වා සංඥා දැනුමින් ඔවුන් පෝෂණය කරන ලදි.

එමෙන්ම 23 වන සංවත්සරයට සමගාමීව වැඩසටහන් මාලාවක් පවත්වන ලද අතර, බළඝණ අතර ක්‍රිකට්, එල්ලේ සහ පාපන්දු තරඟාවලියක් සංවිධානය කර ක්‍රීඩා හැකියාවන් ඔප් නැංවීම හා සාමුහිකව වැඩ කිරීම තුලින් ජයග්‍රහණය ලබා ගත හැකි බව ඒත්තු ගැන්වීමට කටයුතු කරන ලදි. තවද 2012.03.02 දින බෝධිපූජා පිංකමක් නාගදීපවිහාරයේදී සියළුම නිළයින්ගේ සහභාගිත්වයෙන් පවත්වන ලද අතර, ශාන්ත මරියා දේවස්ථානය - අච්චුවේලි හි ක්‍රිස්තියානි දේව මෙහෙයක් සහ තොණ්ඩමනාරු කෝවිල තුල හින්දු පුජාවක් ද පවත්වා ඔවුනට වියලි ආහාර පාර්සල් බෙදා දීමටද කටයුතු කරන ලදි. එමෙන්ම අණදෙන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් තෙලිප්පලේ පිලිකා රෝහලේ නේවාසික ප්‍රතිකාර ලබන රෝගීන් සඳහා ආහාර වේලක්ද ලබාදීමට කටයුතු කරන ලදි.

2010.08.07 දින සිට මෙම ඒකකයේ 22 වන අණදෙන නිළධාරි තනතුර හොබවන ලද ලුතිතන් කර්නල් සීඑල් සරත්චන්ද්‍ර යන ජ්‍යෂ්ඨ නිළධාරි විසින් මෙම ඒකකය වෙනුවෙන් අනගි මෙහෙවරක් ඉටුකර 2012.05.28 දින අණදෙන නිළධාරි තනතුරෙන් සමුගෙන රෙජිමේන්තු ප්‍රධාන මාණ්ඩලික නිළධාරි තනතුර සඳහා 2012.05.28 දින මෙම ඒකකයෙන් නික්ම යන ලදි.

තවද මෙම ඒකක 23 වන අණදෙන නිළධාරි වශයෙන් ලුතිතන් කර්නල් එස්එච්පීඩී තිලකරත්න ආර්එස්පී යන ජ්‍යෂ්ඨ නිළධාරි 2012.05.28 දින සුභ මෙහොතින් අණදෙන නිළධාරි තනතුරේ වැඩ භාරගන්නා ලදි

අවසන් වශයෙන් 3 වන රෙජිමේන්තුව ඉදිරියටත් යුධ හමුදාව තුල දිනෙන් දින දියුණුවට පත්වේවායි ප්‍රාර්ථනා කරන්නෙමු.



ඒකක 23 වන සංවත්සරය නිමිත්තෙන් ඒකක අණදෙන නිළධාරි වන ලුතිතන් කර්නල් ඩීඑල් සරත්චන්ද්‍ර යන ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම



23 වන සංවත්සරය නිමිත්තෙන් සියළුම නිළයින්ගේ සහභාගිත්වයෙන් තොන්ඩමනාරු කෝවිල තුල පවත්වන ලද හින්දු පුජාව



ඒකක 23 වන සංවත්සර දිනට සමගාමීව අණදෙන නිළධාරි විසින් පැලයක් රෝපණය කිරීම



23 වන සංවත්සරය නිමිත්තෙන් සියළුම නිළයින්ගේ සහභාගිත්වයෙන් ශාන්ත මරියා දේවස්ථානය අච්චුවේලි හිදි පවත්වන ලද ක්‍රිස්තියානි දේව මෙහෙය



2012.03.02 දින 23 වණ සංවත්සරය සමගාමීව සියළුම නිළයින්ගේ සහභාගිත්වයෙන් නාග විහාරයේ පැවැත්වූ බෝධිපුජා පිංකම



23 වන සංවත්සරයට සමගාමීව පැවති සියලු නිළ දිවා භෝජන සංග්‍රහය



23 වන සංවත්සරය වෙනුවෙන් ඒකක ක්‍රීඩා පිටියේ පැවති සුහද හමුව අණදෙන නිලධාරිතුමා විසින් ආරම්භ කිරීම



2012.05.28 දින අණදෙන නිළධාරි තනතුරෙන් සමුගත් ලුතිතන් කර්නල් ඩීඑල් සරත්චන්ද්‍ර යන ජ්‍යෙෂ්ඨ නිළධාරි ඒකකයෙන් නික්ම යාම



2012.05.28 දින අණදෙන නිළධාරි තනතුරෙන් සමුගත් ලුතිතන් කර්නල් ඩීඑල් සරත්චන්ද්‍ර යන ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් කඳවුරු මුරය පරීක්‍ෂා කිරීම



2012.05.28 දින නව ඒකක අණදෙන නිළධාරි ලෙස තනතුරේ වැඩ භාරගැනීම සඳහා පැමිණි ලුතිතන් කර්නල් එස්එච්පීඩී තිලකරත්න ආර්එස්පී විසින් කඳවුරු මුරය පරීක්‍ෂා කිරීම



2012.05.28 දින ලුතිතන් කර්නල් ඩීඑල් සරත්චන්ද්‍ර යන ජ්‍යෙෂ්ඨ නිළධාරි අණදෙන නිළධාරි තනතුරෙන් සමුගැනීම වෙනුවෙන් පැවති සියලු නිළ දිවා භෝජන සංග්‍රහය



2012.05.28 දින නව ඒකක අණදෙන නිළධාරි ලෙස ලුතිතන් කර්නල් එස්එච්පීඩී තිලකරත්න ආර්එස්පී සුභ මොහොතින් වැඩ භාරගැනීම

# 4 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

1991 ජූනි මස 05 වන දින පනාගොඩ යුධ හමුදා කඳවුරේ ස්ථාපනය කර එතැන් සිට අද දක්වා 20 වසරක සාඩම්බර ඉතිහාසයකට උරුමකම් කියන ශ්‍රී ලංකා සංඥා බළකායේ සව්වැනි සාමාජිකයා වශයෙන් මේ වන විට 4 වන ශ්‍රී ලංකා සංඥා බළකාය ලෙස හිරිමල් යෞවනයෙකු විලසින් ඉතා අනලස්ව කඩිසරකමින් තම රාජකාරීන් ඉටුකරනු ලබයි. එදා සිට මේ දක්වා අණදෙන නිළධාරීන් 14 දෙනෙකුගේ පූර්ව මග පෙන්වීම සහ පාලනය තුලින්ද මෙම ඒකකයේ සේවය කරන ලද සහ දැනට සේවයේ නියුතු අනෙකුත් නිළධාරීන් සහ සෙසු නිළයින්ගේ නොපසුබට උත්සාහය සහ කැපවීම තුලින් මෙම ඒකකය සංඥා මාතාවගේ නම ඔප නැංවූ බව නොරහසකි

තිස් වසරක යුද්ධයේ ගිණිදැල් දේශයෙන් තුරන් වී ගියද, ආධාරක බළඇණි ලෙස සංඥා බළකායේ කාර්ය්‍ය බහුලත්වය හමාර වී නොමැත. අප හට පැවරී ඇති රාජකාරීන් දිනෙන් දින වැඩි වනවා මිස එහි අඩු වීමක් දක්නට නොලැබේ. නමුත් එම රාජකාරීන් නූතන තාක්‍ෂණය සමග ගැටෙමින්, පවතින අවම සම්පත් ප්‍රයෝජනයට ගනිමින් 4 වන ශ්‍රී ලංකා සංඥා බළකාය අනුරාධපුර ඓතිහාසික භූමියේ ස්ථානගත වී එහි රාජකාරීන් මනාව ඉටුකරගෙන යනු ලබයි. දැනට ආසේමු (ව) බළ ප්‍රදේශයේ සංඥා සම්බන්ධතා පවත්වාගෙන යාමේ භාරධූර කාර්ය මෙම ඒකකය විසින් ඉටු කරනු ලබයි

තවද අනුරාධපුරය, නොයෙකුත් ඓතිහාසික සිද්ධස්ථාන රාශියකින්ද, උතුර දකුණ යා කරන ප්‍රධාන නගරය හෙයින්ද පොසොන් උත්සව වැනි ජාතික උත්සව රාශියකට අනුග්‍රහය දක්වන ප්‍රධාන නගරය ලෙසින්ද ප්‍රචලිතය. එබැවින් මෙම ප්‍රදේශයේ අතිවිශාල ප්‍රභූවරුන් පිරිසකගේ සංචාරයට භාජනය වන බව විශේෂයෙන් කිවයුතු නොවේ. එවැනි අවස්ථාවන් හිදී අප ඒකකයට නියම වූ සංඥා සම්බන්ධතාවයන් සැපයීමට අමතරව අභ්‍යන්තර ආරක්ෂක රාජකාරීන් පවා මෙම ඒකකයේ සිටින නිළධාරීන් සහ සෙසු නිළයින්ගේ කැපවීම තුලින් මනාව ඉටු කරනු ලබන බව කාටත් නොරහසකි.

සංඥා සම්බන්ධතාවයන් පවත්වා ගැනීමේදී දැනට වඩාත් ප්‍රචලිත වූ මාතෘකාවක් වන ජංගම දුරකථන සම්බන්ධතා සැපයීමේදී රජය මෙන්ම පුද්ගලික ජංගම සහ CDMA දුරකථන සම්බන්ධතා පවත්වාගනු ලබන ආයතන සමග සහ සම්බන්ධතාවයෙන් සහ සහයෝගයෙන් කටයුතු කරනු ලබන අතර එමගින් ක්‍රියාන්විත ප්‍රදේශයන් හි සේවය කරනු ලබන සෙබළුන් හට තම නිවෙස් සමග පෙරට වඩා ඉතාමත් පහසුවෙන් ඔවුන්ගේ පවුල් සමග පණිවිඩ හුවමාරු කර ගැනිමට හැකි වීම අප ලද ජයග්‍රහණයකි. එමෙන්ම මෙම ඒකකයේ පුහුණු අංශය මගින් ආධුනික පුහුණු පාඨමාලා ගණනාවක් පවත්වා ඔවුන් යුධ හමුදා ඒකකයන් හට අභීත සෙබළුන් රාශියක් දායාද කර දී ඇති අතර, මේ වන විට ඉරාම සංඥා බළකායට බඳවා ගනු ලැබ ආධුනික සෙනින් 100 කට ආසන්න පිරිසකට පුහුණුව ලබා දෙනු ලබයි

මෙවර ඒකකයේ 20 වන සංවත්සරය ආගමික කටයුතු වලට මුල් තැන දෙමින් සමරනු ලැබූ අතර, එහිදී විශේෂ ආගමික වැඩසටහන් කීපයක්ද සංවිධානය කෙරිණ. ඒ අතරින් අනුරාධපුර "අභය" ළමා නිවාසයේ කුඩා දරුවන් හට දානයක් සහ තෑගි භාණ්ඩ ලබාදීම, ස්වාමීන් වහන්සේලා 20 නමක් ඒකක රෙජි මූලය වෙත පෙරහරින් වැඩමවා දවල් දානය පිළිගැන්වීම, ජය ශ්‍රීමහ බෝධීන් වහන්සේ ඉදිරිපිට බෝධි පූජාවක් පැවැත්වීම සහ අනුරාධපුර ගණදෙවි කෝවිලේ පූජාවක් පැවැත්වීම වැනි දෑ විශේෂයෙන් සඳහන් කල යුතුය. තවද ඒකකයේ සෙබලුන්ගේ චිත්ත ධෛර්‍යය ඇති කිරීම වස් සංවිධානය කල බළසණ අතර ක්‍රීඩා උත්සවය, අණදෙන නිළධාරිතුමා වෙත පැවැත්වූ සම්මාන පෙළපාලිය, අණදෙන නිළධාරි තුමාගේ සහභාගීත්වයෙන් සියලු නිළ භෝජන සංග්‍රහය සහ එදින සන්ධ්‍යාවේ සෙසුනිළ




සුහද හමුව ඒකක 20 වන සංවත්සරයේ කැපී පෙනෙන අංගයන් විය. මෙහිදී මෙම සෑම වැඩසටහනකටම සාර්ථකව නිම කිරීමට හැකියාව ලැබුනේ ඒකකයේ අණදෙන නිළධාරිතුමන් ඇතුලු සියලුම නිළධාරින්ගේ සහ සෙසුනිළයින්ගේ උනන්දුව සහ කැපවීම මතය.



4 ශ්‍රීලංසංබ පුහුණු පාසල මගින් 2012.02.14 දින පවත්වන ලද ආධුනික පුහුණු පාඨමාලා අංක 24 හි පුහුණුව ලැබූ ආධුනික සෙබළුන් විසිරයාමේ උත්සවයේ විශේෂ අවස්ථා



2012.02.22 දින ප්‍රධාන සංඥා නිළධාරිගේ කඳවුරු සංචාරය



2012.04.01 දින පවත්වන ලද සංඥා බළකා අන්තර් ඒකක මළල ක්‍රීඩා උළෙලේ විශේෂ අවස්ථා

අවසන් වශයෙන් 20 වසරක් සපුරන ලබන 4 වන ශ්‍රී ලංකා සංඥා බළකායේ මෙම ගමන් මග ඔපවත් කිරීමෙහි ලා ජීවිත පූජාකරමින් රාජකාරි කල හා තම ශරීරාංග අහිමි කරගත් නිළධාරින් සහ සෙනින් අප මේ මොහොතේ මතක් කරනු ලබන්නේ හද පිරි භක්ති ප්‍රණාමයකිනි. 4 වන සංඥා බළකායේ ධජය ලෙළ දෙන සෑම අවස්ථාවකදීම ඔවුන් හෙළු සුසම් එම ධජය ඔප නංවනු ලබන අතර එය දැනට සේවයේ නියුතු සියළුම දෙනාටත්, මෙහි සේවයේ නියුතු සියළුම දෙනාටත් ඒකකයේ අනාගත සුභසාධනයටත් ආශිර්වාදයක් වනවා නොඅනුමානය. අවසන් වශයෙන් 4 වන සංඥා බළකායේ උත්තරීතර සේවය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටත්, රටටත් ඉටුකර චිරාත් කාලයක් වැජඹේවායි පතමින් මෙම කෙටි ආවර්ජනයට නැවතීමේ තිත තබන්නෙමි.



2012.04.24 දින සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව පවත්වන ලද අවුරුදු ක්‍රීඩා



2012.05.02 දින සංඥා බළකාධිපති සහ සංඥා බළකා සේවා වනිතා ගරු සභාපතිනිය ඇතුළු සාමාජිකාවන්ගේ ඒකක සංචාරයේ විශේෂ අවස්ථා






2012.06.04 දින පොසොන් උත්සවයට සමගාමීව ප්‍රදර්ශණය කරන ලද පොසොන් පහන් කූඩුව සහ බැති ගී ප්‍රසංගය



2012.06.14 දින ඒකක 21 වන සංවත්සර උත්සවයට සමගාමීව ජය ශ්‍රී මහ බෝ සමිඳු අභියස පැවැති බෝධි පූජා පිංකම



2012.06.10 දින ඒකක 21 වන සංවත්සරය නිමිත්තෙන් පවත්වනු ලැබූ බළසෂණ අතර ක්‍රීඩා උත්සවයේ විශේෂ අවස්ථා



2012.06.14 දින ඒකක 21 වන සංවත්සර උත්සවයට සමගාමීව සංඝයා වහන්සේලා 21 නමක් සඳහා පැවැත්වූ දානමය පිංකම



2012.06.12 වන දින ඒකක 21 වන සංවත්සරය නිමිත්තෙන් අභය ළමා නිවාසය වෙත දෙනු ලැබූ දානයේ විශේෂ අවස්ථා



2012.06.16 දින 21 වන සංවත්සරයට සමගාමීව ඒකක අණදෙන නිළධාරිතුමන් විසින් කඳවුරු මුරය පරීකෂා කිරීම සහ ආචාර පෙළපාලිය පිළිගැනීම



2012.06.16 දින ඒකක 21 වන සංවත්සර උත්සවයට සමගාමීව පවත්වන ලද සියළු නිල සුහද හමුව



2012.07.16 දින ඒකකයේ 15 වන අණදෙන නිළධාරි ලෙස ලුතිතන් කර්නල් එම්ඒජේ කුලරත්න පීඑස්සී සුභ මොහොතින් වැඩ භාරගත් අවස්ථාව



2012.06.16 දින ඒකක 21 වන සංවත්සර උත්සවයට සමගාමීව පවත්වන ලද සියළු නිල භෝජන සංග්‍රහය



4 ශ්‍රීලංසංබ බලප්‍රදේශයේ ඩෙංගු මර්ධන වැඩසටහන් සඳහා මෙම ඒකක දායකත්වය



2012.07.16 දින ඒකකයේ 15 වන අණදෙන නිළධාරි වශයෙන් වැඩ භාර ගන්නා ලද ලුතිතන් කර්නල් එම්ඒජේ කුලරත්න පීඑස්සී විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම



සංඥා බලකාධිපතිගේ පූර්ණ අධීක්ෂණය යටතේ අභිනවයෙන් ඉදිකරන ලද අනුරාධපුර ශ්‍රීලංසංබ නිළධාරි නිවාඩු නිකේතනය




# 5 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය

සංඥා බළකා මැණියන්ගේ පළමු ආධාරක බළඇණිය වශයෙන් 1994 ජනවාරි මස 02 වන දින රුදුරු ත්‍රස්තවාදින් මුලිනුපුටා දැමීමේ අරමුණින් 5 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය (ආධාරක බළඇණිය) ආරම්භ කිරීමෙන් පසු අණදෙන නිළධාරි වරුන් 15 දෙනෙකු යටතේ සාර්ථකව ක්‍රියාන්විත රාජකාරි සිදුකර ඇති අතර පවරනු ලබන රාජකාරීන් නිසි පරිදි හා විධිමත්ම ඉටුකරීම සහ පාඨමාලාවන්හි දක්වන ලද සුවිශේෂි දක්ෂතාවයන් හේතුවෙන් ජ්‍යෙෂ්ඨ නිළධාරින්,සේනාංකාධිපතිවරුන්සහ බළසේනාධිපතිවරුන්ගේ ප්‍රශංසාවට ලක්ව ඇත. දැනට මෙම ඒකකය මානුෂය මෙහෙයුම තුලින් මුදවාගත් මුලතිව් දිස්ත්‍රික්කයේ පුදුකුඩිඉරිප්පු සුතන්තිරපුරම් ප්‍රදේශයේ 68 පාබල සේනාංක මුලස්ථානයට අයත් 683 බසේමු යටතේ ස්ථානගතව ඇත.

ඒකකය මුලතිව් මුල්ලියාවේලි ප්‍රදේශයේ ස්ථානගතව සිටියදී නව අණදෙන නිළධාරී වැඩ භාරගත් අතර එහිදී සෙනින්ගේ පාලනය කටයුතු සහ සිවිල් සම්බන්ධිකරණ කටයුතු සාර්ථකව ඉටු කරමින් සිටියදී එම ස්ථානයෙන් මිදී 10 ශ්‍රීලංසංබ ඒකකය ස්ථානගත කර තිබූ සුතන්තිරපුරම් ප්‍රදේශයේ ස්ථානගතවිය. සංඥා බළකා ඉතිහාසයේ ප්‍රථම වතාවට සංඥා ඒකක දෙකක් ඒකාබද්ධ කිරීම පසුගිය වසරේ මෙම ඒකකයේ සිදුවූ විශේෂ සිදුවීමක් ලෙස හැදින්විය හැක. 2012.03.04 දින 5 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බළකාය සහ 10 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බළකාය ඒකාබද්ධ කිරීමේදී එහි තිබූ වගකීම් සහිත කාර්යට මුහුණ දෙමින් වත්මන් අණදෙන නිළධාරි වශයෙන් කටයුතු කරනු ලබන ලුතිතන් කර්නල් අයිඑච්එම්ආර්කේ හේරත් පිඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරි එම අභියෝගය මැනවින් ජයගනිමින් ඒකක 02 ක් විසින් පාලනය වු විශාල භූමි ප්‍රමාණයක් ආවරණය වන පරිදි මෙම ඒකක භට පිරිස් යෙදවිම සහ පසුගිය යුධ වාතාවරණය තුලදී මගහැරී තිබූ සෙනින්ගේ පාලන කටයුතු නිසියාකාරව සිදුකිරීම සදහා නව මග පෙන්වීමක් ලැවීම ඒකකය ලද ජයග්‍රහණයක් ලෙස හැදින්වීය හැක.

දැනට මෙම ඒකකය මානුෂීය මෙහෙයුමින් පසු මුදවාගත් ප්‍රදේශයන්හි සිවිල් වැසියන් නැවත පදිංචි කිරීමේ කටයුතු විධිමත්ව සදු කරනු ලබන අතර එහිලා දක්වන ක්‍රියාශිලිත්වය හා කාර්ය ශූරත්වය හේතුවෙන් ඉහල මුලස්ථානයන්ගේ නිරන්තර පැසසුමට ලක්වෙමින් පවතී. තවද ගෙවී ගිය වසරේ සිදුවු වැදගත් සිදුවීම් ලෙස යුධ වාතාවරණයක් නොමැති වකවානුව තුලදී පාලන කටයුතු වලට හා සිවිල් සම්බන්ධීකරණ කටයුතු වෙනුවෙන් නායකත්වයක් නව අණදෙන නිළධාරී වෙතින් ලැබීම හේතුවෙන් මෙම ඒකක නි/සෙනින්ගේ චිත්ත ධෛර්ය ඉහල මට්ටමක පවත්වා ගැනීමට හැකිව ඇත. තවද ඒකක සෙනින් සහභාගි වන යුධ හමුදා පුහුණු පාසල්හි පවත්වනු ලබන පාඨමලාවන්හිදී විශිෂ්ට දක්‍ෂතාවයන් දැක්වීමට හැකිවීම සහ අන්තර් ඒකක කබඩි තරගාවලියේදී සියලූ සංඥා ඒකක පරදවමින් මෙම ඒකක කබඩි කණ්ඩායම ශූරතාවය ලබාගැනිමට හැකිවීමද ඒකකය ලද තවත් ජයග්‍රහණයක් වේ. තවද ඔවුන් අතරින් යුදහමුදා කබඩි කණ්ඩායමට මෙම ඒකක ක්‍රීඩකයින් තිදෙනෙකු ඇතුලත්වීම සමස්ථ සංඥා රෙජිමේන්තුවට මහත් අභිමාණයක් බැව් දැක්වීමට කැමැත්තෙමි.

ඒ අනුව මෙම ඒකකය මෙතෙක් සිදු කරන ලද උදාර මෙහෙවර මෙන්ම අනාගතයේදිද ඉමහත් සේවයක් ඉටු කිරීමට ශක්තිය හා ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනය කරමි.




2012.01.02 දිනට යෙදුන ඒකක 18 වන සංවත්සරය නිමිත්තෙන් පැවැති ක්‍රීඩා තරඟාවලිය



2012.01.02 දිනට යෙදුන ඒකක 18 වන සංවත්සරය වෙනුවෙන් පවත්වන ලද පිරිත් සජ්ඣායනාව



2012.01.02 දිනට යෙදුන ඒකක 18 වන සංවත්සරයේදී පැවැති සියළු නිළ සුහද හමුව



2012.02.01 දින ඒකකයේ 15 වන අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් අයිඑච්එම්ආර්කේ හේරත් පීඑස්පී සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාර ගත් අවස්ථාව




2012.01.02 දිනට යෙදුන ඒකක 18 වන සංවත්සරයේ සියළු නිළ භෝජන සංග්‍රහයේදී වැ.බ. අණදෙන නිළධාරී විසින් සියළුම නිළයින් ඇමතීම



2012.02.06 දින සංඥා බළකාධිපතිගේ ඒකක සංචාරයේදී සංඥා බලකාධිපති විසින් කඳවුරු මුරය පරීක්ෂාව



2012.02.06 දින සංඥා බළකාධිපති විසින් සියළු නිළයන් ඇමතීම



2012.03.04 දින 5 ශ්‍රීලංසංබ සහ 10 ශ්‍රීලංසංබ ඒකක ඒකාබද්ධ කිරීමේ උත්සවයේ දී, 5 ශ්‍රීලංසංබ අණදෙන නිළධාරී විසින් 10 ශ්‍රීලංසංබ ඒකක ධජය 5 ශ්‍රීලංසංබ රෙසැමේ වෙත ලබාදීම



2012.02.13 දින මුල්ලියාවේලි ප්‍රදේශයේ දිළිඳු පවුලක් සඳහා නිවාසයක් ඉදිකරදීම පිණිස 592 බළසේනාධිපතිගේ ප්‍රධානත්වයෙන් මුල්ගල තැබූ අවස්ථාව



2012.03.04 දින 5 ශ්‍රීලංසංබ වෙත 10 ශ්‍රීලංසංබ ඒකාබද්ධ කිරීමෙන් පසු අණදෙන නිළධාරී වරුන් භාරදීම් භාරගැනීම් සිදු කිරීම



2012.03.04 දින 5 ශ්‍රීලංසංබ සහ 10 ශ්‍රීලංසංබ ඒකක ඒකාබද්ධ කිරීමේ උත්සවයේ දී, 10 ශ්‍රීලංසංබ රෙසැමේ වෙතින් 10 ශ්‍රීලංසංබ අණදෙන නිළධාරී හට ඒකක ධජය භාර දීම



2012.03.06 දින 5 ශ්‍රීලංසංබ සහ 10 ශ්‍රීලංසංබ ඒකාබද්ධවීමෙන් පසු එහි පාලන කටයුතු පිළිබඳ සොයා බැලීම සඳහා පැමිණි සංඥා බළකාධිපති විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම



2012.03.06 දින 5 ශ්‍රීලංසංබ සහ 10 ශ්‍රීලංසංබ ඒකක ඒකාබද්ධ කිරීමෙන් පසු සංඥා බළකාධිපතිගේ ප්‍රධානත්වයෙන් පැවැති ප්‍රගති සමාලෝචන සාකච්ඡාව



2012.05.04 දින වෙසක් උත්සවයට සමගාමීව ඒකකයේ පවත්වනු ලැබූ ආගමික වැඩසටහන්



2012.04.12 දින සිංහල හා හින්දු අළුත් අවුරුදු උත්සවයේදී ඒකකයේ රාජකාරි කරනු ලබන සිවිල් සේවක මහතුනගේ සේවය ඇගයීම



2012.06.07 දින 683 බළසේනාධිපති කඳවුරු සංචාරයේදී කඳවුරු මුරය පරීක්‍ෂා කිරීම



2012.04.22 දින 5 ශ්‍රීලංසංබ සහ 10 ශ්‍රීලංසංබ ඒකාබද්ධ කිරීමෙන් පසු කඳවුරු සංචාරය සඳහා පැමිණි 68 සේනාංකාධිපති විසින් කඳවුරු මුරය පරීක්‍ෂා කිරීම



2012.06.10 දින ඒකකය විසින් පවත්වන ලද කෝවිල් පූජාව

# 6 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

විශ්වය නම් වූ සප්ත මහ සාගරයෙහි පාවෙන රුවල් නැවක් බඳු සොබා සෞන්දර්යයෙන් පොහොසත් මේ පුංචි ලක් දෙරණෙහි වසර 30 කට අධික කාල පරාශයක් තුල පැවැති යුධ ගිනි දැල් නිමාවී උදාවෙමින් පවතින අරුණෝදයේ ආශ්චර්යය මධ්‍යයේ තම 16 වන වියට පාතැබූ ශ්‍රීලංකා යුද්ධ හමුදාවේ සන්නිවේදනයේ ප්‍රමුඛයා වන ශ්‍රීලංකා සංඥා බලකායේ 2 වන ආධාරක බළඇණිය ලෙස 1997.01.10 දින ආරම්භ කරනු ලැබූ 6 වන රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය (ආධාරක බළඇණිය) තම ගෙවී ගිය වසර 15 ක කාලපරාසයෙහි අතීතාවර්ජනය, සිග්නලර්, සගරාවේ පසුගිය කලාපය තුලින් එළිදැක්වූ බැවින් ගෙවී ගිය පසුගිය වසර තුල සිදුවූ විශේෂිත සිදුවීම් පමණක් මෙසේ සනිටුහන් කරන්නෙමු.

මේ වන විට මෙම ඒකකය ආසේමු(යා) බල ප්‍රදේශයේ 51 සේනාංක මූලස්ථානයට අයත් 512 බලසේනා මූලස්ථානය යටතේ යාපනය නගරය මධ්‍යයේ 2010.10.15 දින සිට ස්ථානගතව එම මූලස්ථානයන්හි පැසසුමටද ලක්ව පැවරෙන රාජකාරීන් ඉතා උසස් අන්දමින් ඉටු කරමින් සිවිල් වැසියන්ගේද සිත් දිනාගනිමින් ඔවුන්ගේ ප්‍රශ්න හා ගැටළු සම්බන්ධයෙන් නිරන්තර අවධානය යොමු කරමින් ජන ජීවිතය යලි පුබුදුවාලීම සඳහා සහයෝගය ලබා දෙමින් රාජකාරී ඉටු කරනු ලබයි.

ඒකකයේ අණදෙන නිළධාරී වශයෙන් රාජකාරී ඉටුකරනු ලැබූ ලුතිතන් කර්නල් එම්පිජේඑස්කේ පටබැඳිගේ යන ජ්‍යෙෂ්ඨ නිළධාරී 2011.10.29 දින අණදෙන නිළධාරී තනතුරෙන් සමුගෙන මෙම ඒකකයෙන් නික්ම ගිය අතර, නව අණදෙන නිළධාරියෙකු පත්ව එන තෙක් උප අණදෙන නිළධාරී වශයෙන් සිටි මේජර් එස්කේඒ ශ්‍රියානන්ද යන ජ්‍යෙෂ්ඨ නිළධාරී වැඩ බලන අණදෙන නිළධාරී වශයෙන් රාජකාරී කරන ලදි. ඉන් පසු මෙම ඒකකයේ නව අණදෙන නිළධාරී වශයෙන් පත් කරන ලද ලුතිතන් කර්නල් එස්එම්ජීබී ඉමදුවගේ ආර්එස්පී යන ජ්‍යෙෂ්ඨ නිළධාරී 2012.03.05 දින සුභ මොහොතින් අණදෙන නිළධාරී තනතුරෙහි රාජකාරී ආරම්භ කරන ලදි.

ඒකක 15 වන සංවත්සරය 2012.01.10 දිනට යෙදී තිබූ අතර, එයට සමගාමීව ඒකකයේ රාජකාරියෙහි නියලී සිටියදී තම ජීවිත පුද කල සියළු රණවිරුවන්ට නිවන් සුවය, ත්‍රස්ථ ප්‍රහාර හේතුවෙන් තුවාල ලබා තම ශරීරාංග අහිමිව ආබාධිත තත්වට පත් සියළුම රණවිරුවන්ට නිරෝගී සුවය ප්‍රාර්ථනා කරමින් යාපනය ශ්‍රී නාගම්භාරස්ථායේදී බෝධි පූජා පිංකමක් පවත්වා සියළු ලක් වැසියන්ටද සෙත් පතන ලදි. තවද, සියළු නිළ භෝජන සංග්‍රහයක් හා සියළු නිළ සුහද හමුවක් ආදී වශයෙන් විශේෂාංග රැසකින් යුතුව පවත්වන ලදි.

තවද, ආසේමු(යා) බළ ප්‍රදේශය තුල පවත්වනු ලැබූ සිංහල හා හිඳු අළුත් අවුරුදු උත්සවය, වෙසක් පුන් පොහොය දිනය නිමිත්තෙන් යාපනය නගර මධ්‍යයෙහි පවත්වනු ලැබූ වෙසක් කලාපය සහ පොසොන් පොහෝ දිනය නිමිත්තෙන් පැවැති උත්සව මාලාව සඳහා මෙම ඒකකය වෙතින් ලබාදෙන ලද දායකත්වය අති මහත්ය. එමෙන්ම යාපනය ප්‍රදේශයේ සිවිල් ජනතාවගේ ජන ජීවිතය ඔප් නැංවීම සඳහා පවත්වනු ලබන නොයෙකුත් වැඩ සටහන්, සුභසාධක කටයුතු හා උත්සව මාලාවන්ට මෙම ඒකකය වෙතින් සහයෝගය නිරතුරුවම ලබා දෙමින් සිවිල් සටිබන්ධීකරණ කටයුතු මනාව ඉටු කිරීම හේතුවෙන් සිවිල් ජන සමාජය තුලද මෙම ඒකකය ජනාදරයට පත්ව ඇත.

එමෙන්ම ඒකකයේ ක්‍රීඩා කුසලතාවයන්ද ඉතා උසස් මට්ටමක පවතින අතර, දක්ෂතාවයෙන් හෙබි ක්‍රීඩකයින් සංඥා බලකා ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරමින් ජයග්‍රහණ රැසක් ලබාගෙන ඇත. මෙම ඒකක එල්ලේ කණ්ඩායම 2012 වසරේ අන්තර් සංඥා

ඒකක එල්ලේ තරගාවලියේ ශූරතාවය හිමි කර ගැනීමට සමත් වීම, අන්තර් සංඥා ඒකක වෙඩිතැබීම තරගාවලියේ අනුශූරතාවය මෙන්ම සංඥා බලකායේ දක්ෂතම වෙඩි තබන්නා ලෙස සෙ/277720 කෝප්‍රල් තිලකරත්න ඒපීපීඑ යන කොනොනි තේරී පත්වීම, අන්තර් ඒකක කබඩි තරගාවලියේ තෙවන ස්ථානය හිමිකර ගැනීම, අන්තර් ඒකක බිලියඩ්/ස්නූකර් තරගාවලියේ 05 වන ස්ථානය හිමිකර ගැනිම හා එහි කේවල අංශයේ අනුශූරතාවය සෙ/277654 කෝප්‍රල් සිරිල් පිපී හිමිකර ගැනීම, ආසේමු(යා) බල ප්‍රදේශයේ පැවැත්වූ අන්තර් ඒකක කබඩි තරගාවලියේ ප්‍රතිවාදි කණ්ඩායම් අබිබවමින් ඉදිරියේදී පැවැත්වීමට ඇති අවසාන මහා තරගයට තේරී පත්වීම සහ සේනාංක මුලස්ථාන, බලසේනා මුලස්ථාන, ඒකකයන් වෙතින් පවත්වනු ලැබූ ක්‍රීඩා තරගාවලියන්හි ජයග්‍රහන රැසක් හිමිකර ගැනීම තුලින් ඒකකයේ ක්‍රීඩා අංශයේ ශීඝ්‍ර වර්ධනයක් සිදුව ඇත

තවද මෙම ඒකක සෙබළුන්ගේ නිළ උසස් කිරීම් සඳහා අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාලීම වස් සංසෙ සිට ලා/කෝ දක්වා නිළ උසස් කිරීමේ පාඨමාලා සංඥා බලකායට ආවේණික වෘත්තීන් සඳහා වන වෘත්තීය පරීක්ෂණ III හා II ශ්‍රේණියේ පරීක්ෂණ පවත්වන ලදි. එමෙන්ම ඒකකයෙන් පිටත අනෙකුත් ස්ථාන වෙතින් පවත්වනු ලබන පාඨමාලාවන් සඳහා වැඩි සෙබළුන් සංඛ්‍යාවක් සහභාගි කරමින් ඔවුන්ගේ ඉදිරි හමුදා ජීවිතය සාර්ථක කරීමට කටයුතු කරනු ලබන අතර, අනෙකුත් සුභසාධන කටයුතු පිළිබඳ සොයාබලා ක්‍රියාකිරීම සෙබළුන්ගේ චිත්ත ධෛර්යය උසස් අන්දමින් පවත්වාගෙන යාමට පිටුවහලක් වී ඇත. එබැවින් ඔවුන් වෙත පැවරෙන රාජකාරි කැපවීමෙන්/වගකීමෙන් මෙන්ම උනන්දුවෙන් ඉටුකිරීම ඒකකයේ සාර්ථකත්වයටද ප්‍රධාන සාධකයකි.

මෙම ඒකකය සංඥා බලකා පවුලට එක්වී දැනට වසර 15 කට වැඩි කාලයක් ඉක්මවා ගොස් ඇත. එම කාල පරාසය තුල ඒකකයේ සාර්ථකත්වයට අණදෙන නිළධාරි වරුන් 12 දෙනෙකු නායකත්වය ලබාදී ඇති අතර, වත්මන් අණදෙන නිළධාරීගේ නායකත්වය හා මගපෙන්වීම යටතේ ඒකකයේ පාලන කටයුතු හා සෙබළුන්ගේ සියළුම සුභසාධන කටයුතු ඉතා උසස් මට්ටමකින් ඉටු කිරීමට හැකියාව ලැබී ඇත. එබැවින් එය ඒකකයේ ඉදිරි ගමන් මගෙහි සාර්ථකත්වයට ඉමහත් පිටුවහලකි.



2012.01.10 දිනට යෙදී තිබූ ඒකක 15 වන සංවත්සරය නිමිත්තෙන් වැඩ අණදෙන නිළධාරි විසින් පැලයක් සිටුවීම



2012.01.10 දිනට යෙදී තිබූ ඒකක 15 වන සංවත්සරය නිමිත්තෙන් පැවැත්වූ සියළු නිළ භෝජන සංග්‍රහය



2012.01.10 දිනට යෙදී තිබූ ඒකක 15 වන සංවත්සරයට සමගාමීව පැවති සියළු නිළ සුහද හමුව



බළකාධිපති විසින් යාපනය සීනුර් ජැටියෙහි ඉදිවන නව කඳවුරු භූමිය පරීක්ෂා කිරීම



2012.01.20 දින පැවති අණදෙන නිළධාරිවරුන්ගේ සාකච්ඡාව සඳහා පැමිණි බළකාධිපති විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම



2012.03.05 දින නව ඒකක අණදෙන නිළධාරි ලෙස ලුතිතන් කර්නල් එස්එම්එච් ඉමදුවගේ ආර්එස්පී විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම



2012.01.20 දින බළකාධිපතිගේ ප්‍රධානත්වයෙන් පැවති අණදෙන නිළධාරිවරුන්ගේ සාකච්ඡාව



2012.03.05 දින ඒකකයේ 14 වන අණදෙන නිළධාරි වශයෙන් ලුතිතන් කර්නල් එස්එම්එච් ඉමදුවගේ ආර්එස්පී සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාරගත් අවස්ථාව



නව අණාදෙන නිළධාරි නවතමයෙන් ඉදිවන කඳවුරු භූමිය පරීක්‍ෂා කරමින්



2012 වර්ෂයේ සංග්‍රාමික වෙඩි තැබීම තරඟාවලිය සඳහා සහභාගි වෙමින්



2000.05.24 වන දින යාපනය සරසාලෙයි ප්‍රදේශයේ දී එල්ලවූ ත්‍රස්ථවාදි ප්‍රහාරයෙන් මියගිය සෙබළුන් හට වසර 12 ක් පිරීම නිමිත්තෙන් ඔවුන්ගේ ඥාතීන් සමග එක්ව පැවැත්වූ බෝධි පූජාමය පිංකම



ප්‍රදේශයේ නිවාස නොමැති සාමාන්‍ය ජනතාව වෙනුවෙන් නිවාස ඉදිකරදීමේ සමාජ සත්කාරය



යාපනය කොටුව ප්‍රදේශයේ නවතමයෙන් ඉදි කරනු ලබන ඒකක කඳවුරු භූමිය



දුප්පත් සිසුවෙක් හට පාසල් උපකරණ කට්ටලයක් ලබා දෙමින්

# 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

ඉතිහාසයේ ප්‍රථම වරට ආධාරක බළඇණියක් වශයෙන් සංග්‍රාමික භූමියට සෘජුවම පිවිස සංඥා බලකා නාමය රන් අකුරින් සනිටුහන් කොට 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (ආධාරක බළඇණිය) තම සිව්වන උපන්දිනය සැමරිය.

2008 පෙබරවාරි මස 08 වන දින නිළධාරීන් 18 ක් සහ සෙසුනිළයින් 525 කින් යුක්තව ආධාරක බළඇණියක් වශයෙන් මේජර් ඩබ්සී ජයසිංහ පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ අණදීම තුලින් ආරම්භ කිරීමෙන් පසු මෙතෙක් ආ ගමන්මගෙහි කළ කැපකිරීම් සහ මුහුණදුන් අභියෝගයන් බොහෝය.

දශක කිහිපයක් පුරා පැවැති කුරිරු යුද්ධයේ අවසන් සටන වන වන්නි මානුෂීය මෙහෙයුම සඳහා 57 වන ප්‍රහාරක සේනාංකය සහ දෙවන කාර්‍ය සේනාංකය යටතේ 2009.02.25 දින දක්වා සක්‍රීය දායකත්වය ලබාදෙමින් ඉදිරි ආරක්ෂණක වළල්ලේ අනිකුත් පාබල ඒකකයන් සමග උරෙනුර ගැටී දැඩි දුෂ්කර තාවයන්ට මුහුණු දෙමින් ඉදුරාම ක්‍රියාන්විතයන්ට සහභාගි වන ලදි. 573 බසේමු වෙත අනියුක්තව නොච්චිකුලම් ඉදිරි ආරක්ෂක වලල්ලේ සතුරාට දැඩි ප්‍රතිරෝධයක් දෙමින් ක්‍රියාන්විතය සඳහා දැක්වූ දායකත්වය සහ පාබල හමුදාවන්ට ලබාගැනීමට අසීරු ඉලක්කයක්ව තිබූ උදයාර්නට්ටුකුලම් වැව මුදාගැනීමේ දැවැන්ත ක්‍රියාන්විතය සඳහා ලබා දෙන ලද සහභාගිත්වය යුධ ඉතිහාසයේ රන් අකුරින් සනිටුහන් වී ඇත.

ඒකකයක් වශයෙන් නිළධාරි/සෙසුනිළයින්ගේ අප්‍රතිහත ධෛර්‍ය හා කැපකිරීම් තුලින් මෙතෙක් ආ ගමන් මගෙහි වෙනසක් සදු කරමින් 2009.02.25 වන දින සිට 2010.09.28 දින දක්වා දෙවන කාර්‍ය සාධක බළකායෙන් වෙන්ව 573 බළසේනාව යටතේ ධර්මපුරම් ප්‍රදේශයේ රාජකාරි සඳහා යොමුවන ලදි. සිවිල් පුද්ගලයන්ගෙන් තොරවූ ධර්මපුරම් ප්‍රදේශයේ භූමිය සම්පූර්ණයෙන් නිසැක කර සිවිල් පුද්ගලයින් නැවත පදිංචි කර ජන ජිවිතය යථා තත්වයට පත් කරීමේ භාරධූර වගකීම අකුරටම ඉටු කරමින් සිවිල් වැසියන්ගේ සිත් දිනා ගනිමින් දේශයේ මුර දේවතාවුන් යන්න ඔවුන්ගේ හදවත් තුල ලියා තබමින් 2010.09.29 වන දින 631 බළසේනාවට අනියුක්තව අම්පකාමන් ප්‍රදේශයේ ස්ථාන ගත වන ලදි.

යුධමය ක්‍රියාකාරකම් වලින් සම්පූර්ණයෙන්ම ඉවත්වී සිවිල් ජනතාවගේ බලාපොරොත්තු සිතුම් පැතුම් වලට නව ජීවයක් දෙමින් අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් කේඒඩබ්එස් රත්නායක යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ පූර්ණ මග පෙන්වීම යටතේ සිවිල් සම්බන්ධීකරණ කටයුතු සඳහා මෙම ඒකකය යොමුවන ලදි.

පුලිමච්චිනාදකුලම් සහ අම්පකාමම් ග්‍රාමයන්හි සිවිල් වැසියන්ගේ සහාගිත්වයෙන් පාසල් නිවාසාන්තර ක්‍රීඩා උත්සවයක් සහ ශ්‍රමදාන ව්‍යාපාර වැඩසටහනක් පවත්වා සිවිල් වැසියන්ගේ නිබද මිතුරා බවට පත්වීම කෙටි කාලයක් තුල ලබාගත් ඒකක ජයග්‍රහණයකි.

මෙතෙක් ආ ගමන් මගෙහි නිළධාරීන් 04 දෙනෙකු සහ සෙසුනිළයන් 139 දෙනෙකු තුවාල ලබමින් සෙබළුන් 31 දෙනෙකු ආබාධිත තත්වයට පත්වෙමින් හා සෙබළුන් 17 දෙනෙකු දිවි පුජා කල අතර තීරණාත්මක කාල පරිච්ඡේදයකට පා තබමින් සංඥා බලකා ඉතිහාසයේ ප්‍රථම වතාවට 8 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය(ආ/බ) සමග ඒකාබද්ධ වී 65 සේනාංකය ට අයත් 652 බසේමු යටතේ 2012.04.01 දින 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය (ආ/බ) වශයෙන් ප්‍රතිස්ථාපනය වන ලදි.

මෙහිදි වසර 04 ට ආසන්න කාලයක් කල්මඩු ඉලුප්පායිකුලම්, කනගරායන්කුලම්, ඔඩ්ඩුසුඩාන්, මුල්ලියන්කුලම් යන ප්‍රදේශයන්හි අනෙකුත් ඒකක සමග උරෙනුර ගැටී දේශයේ උන්නතිය වෙනුවෙන් නිළධාරි දෙදෙනෙකු සහ සෙසුනිළයින් 20 දෙනෙකු තුවාල ලබමින් පැමිණි ගමන් මගෙහි නව පිටුවක් පෙරලමින් 8 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය (ආ/බ) නිළධාරි/සෙසුනිළයන් 7 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය (ආ/බ) සමග සහෝදරත්වයෙන් අත්වැල් බැඳ ගන්නා ලදි. දැනට මෙම ඒකකය උයිලන්කුලම් ප්‍රදේශයේ ආරක්ෂක රාජකාරීන්ට අමතරව සිවිල් සම්බන්ධීකරණ කටයුතු වලටද ප්‍රමුකත්වය දෙමින් රාජකාරි කටයුතු සිදුකරනු ලබන අතර මේ වන විට අණදෙන ලුතිතන් කර්නල් කේඒඩබ්එස් රත්නායක යන ජ්‍යෙෂ්ඨ නිළධාරිගේ පූර්ණ මග පෙන්වීම තුලින් ඒකකයේ සියළුම නිළධාරි/සෙසුනිළයින්ගේ සහභාගිත්වයෙන් බළඇණි පුපා මුලංකාවිල් හි බළඇණි පුහුණු පාඨමාලාව හදාරන ලද අතර, එම පාඨමාලාව සඳහා අනෙකුත් පාබල ඒකක වලට වඩා වැඩි භට පිරිස් ප්‍රමාණයක් සහභාගි වන අතර, පාඨමාලාව අති සාර්ථකව හැදෑරීමට එම භට පිරිස් හට අවස්ථාව උදාවන ලදි. බළඇණි පාඨමාලාව අවසානයේ එම පාඨමාලාව හදාරන ලද සියළු භට පිරිස් ඒකකය වෙත පැමිණීමෙන් පසු සුපුරුදු ක්‍රියාන්විත/ පාලන/ සිවිල් සම්බන්ධීකරණ රාජකාරි ඉටු කරු ලබයි.

ඒකකයේ අණදෙන නිළධාරි වශයෙන් රාජකාරි ඉටුකරනු ලැබූ ලුතිතන් කර්නල් කේඒඩබ්එස් රත්නායක යන ජ්‍යෙෂ්ඨ නිළධාරි 2012.07.27 දින අණදෙන නිළධාරි තනතුරෙන් සමුගෙන මෙම ඒකකයෙන් නික්ම ගිය අතර, ඒකකයේ 5 වන නව අණදෙන නිළධාරි ලෙස ලුතිතන් කර්නල් ආර්එම්පීඑස්බී රත්නායක යන ජ්‍යෙෂ්ඨ නිළධාරි 2012.07.28 වන දින සුභ මොහොතින් අණදෙන නිළධාරි තනතුරේ රාජකාරින් භාර ගන්නා ලදි.



2012.02.08 වන දින ඒකක 4 වන සංවත්සරය නිමිත්තෙන් අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් කේඒඩබ්එස් රත්නායක ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම සහ සම්මාන පෙළපාලිය පරීක්ෂා කිරීම



2012.02.08 වන දින ඒකක 4 වන සංවත්සරය නිමිත්තෙන් පැවති සියලු නිළ භෝජන සංග්‍රහය



2012 අන්තර් ඒකක සංග්‍රාමික වෙඩිතැබීම් ශූරතාවය දිනාගත් 7 ශ්‍රීලංසංබ(ආ/බ) ඒකක කණ්ඩායම



2012.04.13 වන දින සිංහල අළුත් අවුරුදු උත්සවය වෙනුවෙන් සංවිධානය කරන ලද බක් මහ උළෙලේ විශේෂ අවස්ථා



අභිනවයෙන් ඉදි කරන ලද 7 ශ්‍රීලංසංබ(ආ/බ) රෙජිමේන්තු මූලස්ථාන ගොඩනැගිල්ල 2012.04.28 වන දින සංඥා බළකාධිපති තුමා විසින් විවෘත කිරීම



2012.04.28 වන දින සංඥා බළකාධිපතිගේ ඒකක සංචාරයේදී සංඥා බළකාධිපති විසින් කඳවුරු ආරක්‍ෂක මුරය පිරික්සීම



2012.04.28 වන දින සංඥා බළකාධිපති තුමාගේ කඳවුරු සංචාරය සිහිවනු වස් අඹ පැළයක් සිටුවීම



අභිනවයෙන් ඉදිකරන ලද 7 වන (ආ/බ) ශ්‍රීලංකා සංඥා බලකා රෙජිමේන්තු මූලස්ථාන ගොඩනැගිල්ල



2012.04.28 වන දින සංඥා බළකාධිපති තුමා විසින් සියලු නිළයින් ඇමතීම



2012.04.28 වන දින සංඥා බළකාධිපතිගේ ප්‍රධානත්වයෙන් පැවති සංඥා ඒකක අණදෙන නිළධාරි වරුන්ගේ සාකච්ජාව



2012.05.14 වන දින 65 සේනාංකාධිපතිගේ ඒකක සංචාරය




2012.05.05 දින සිට 2012.07.11 දින දක්වා පැවැති බළඇණි පුහුණුවීම්



2012.07.27 වන දින අණදෙන නිළධාරි තනතුරින් නික්ම ගිය ලුතිතන් කර්නල් කේඒඩබ්එස් රත්නායක ජ්‍යෙෂ්ඨ නිළධාරිහට පිරිනැමූ ආචාර පෙළපාලිය



2012.07.28 වන දින නව අණදෙන නිළධාරි ලුතිතන් කර්නල් ආර්එම්පිඑස්බී රත්නායක යන ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් කඳවුරු මුරය පරීක්‍ෂා කිරීම



2012.07.28 වන දින 5 වන අණදෙන නිළධාරි ලෙස ලුතිතන් කර්නල් ආර්එම්පීඑස්බී රත්නායක යන ජ්‍යෙෂ්ඨ නිළධාරි සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාරගැනීම

# 9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

9 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකාය 2008.07.15 දින සංඥා බළකායට එක්වූ අතර, මේ වනවිට සිව්වන වසරට පාතබා ඇත. මෙම ඒකකය දැනට ආරක්ෂක සේනා මුලස්ථානය(කිලි) යටතේ ඇති සියළුම සේමු/බසේමු/ඉනපෙ(කිලි) හා ඒකක සඳහා සංඥා සම්බන්ධතාවයන් ලබා දෙමින් කිලිනොච්චිය, ඉරණමඩු හි ස්ථාපනය කර ඇත. මෙම ඒකකයේ අණදෙන නිළධාරි වශයෙන් රාජකාරි කරන ලද නි/61415 ලුතිතන් කර්නල් කේඒඩබ්එස් රත්නායක යන ජ්‍යෙෂ්ඨ නිළධාරි 2010 දෙසැම්බර් මස 31 වන දින සමුගැනිමත් සමගම නි/61501 ලුතිතන් කර්නල් ඩබ්සී ජයසිංහ පීඑස්සී විසින් 2011 ජනවාරි මස 01 වන දින ඒකකයේ නව අණදෙන නිළධාරි වශයෙන් වැඩ භාරගන්නා ලදි. අණදෙන නිළධාරි වශයෙන් වැඩ භාර ගැනීමෙන් පසුව 2011 ඔක්තෝම්බර් මස 29 වන දින ප්‍රධාන සංඥා නිළධාරි බ්‍රිගේඩියර් ආර්ඒ කඩුවෙල ජ්‍යෙෂ්ඨ නිළධාරිතුමන් හා 2012 වර්ෂයේ ජනවාරි මස 22 දින මෙ ඒකක පාලන පරීක්ෂාව සඳහා පැමිණි සංඥා බළකාධිපති මේජර් ජෙනරල් ඊ පී ද ඉසෙඩ් අබේසේකර යුඑස්පී ජ්‍යෙෂ්ඨ නිළධාරිතුමාණන් මෙම ඒකකය තුල සංචාරය කරන ලදි.

මෙම රෙජිමේන්තුව දෙවන වරටත් 2011 වර්ෂයේ සියළු සංඥා රෙජිමේන්තු අතුරින් හොදම සංඥා රෙජිමේන්තුව බවට පත්වූ අතර 2012 වර්ෂය සදහාද අන්තර් රෙජිමේන්තු තරග අතුරින් ඉතා විශිෂ්ඨ ජයග්‍රහණ රැසක් හිමිකරගන්නා ලදි. ඒ සදහා අණදෙන නිළධාරිතුමාගේ ශ්‍රේෂ්ඨ මගපෙන්වීම හා කැපවීම ඒකකයට විශාල අශිර්වාදයක් වූ බැව් පෙන්වා දිය යුතුය. මේ වසරේ පවත්වන ලද අන්තර් රෙජිමේන්තු සරඹ තරගාවලියෙන් මෙම ඒකකය ප්‍රථම ස්ථානය හිමිකරගත් අතර, අණදෙන නිළධාරිතුමාගේ නායකත්වය හා මගපෙන්වීමත් ඒකකයේ සෙනින්ගේ දැඩි කැපවීම හා උනන්දුව මත මෙම ජයග්‍රහණය 9 වන සංඥා බළකාය වෙත ලබා ගැනීමට හැකි වූ බව කිව යුතුය

ඉතා ලාබාල අවදියේ පසුවන 9 වන සංඥා බළකාය සෙනීන්ගේ දැනුම වර්ධනය කිරිමටත් ක්‍රීඩා කුසලතා වර්ධනය කිරිමටත් ඉවහල් වන මහත් තෝතැන්නක් බඳුය. 2012 වසරේ මෙම ඒකක සෙනීන්හට සංසෙ සිට ලා/කෝ දක්වා නිළ උසස් කිරිමේ පාඨමාලාවක් ද, ලා/කෝ සිට කෝප්‍රල් දක්වා නිළ උසස් කිරිමේ පාඨමාලවක් හා වෙනත් ඒකක සෙබළුන්හට සංඥා සංස්කරණ පාඨමාලාවන් 04ක් ද පැවැත්විමට මෙම ඒකකය ක්‍රියාකර ඇත. දිනෙන් දින දියුණු වන මෙම ඒකක සෙනීන්ගේ ක්‍රීඩා කුසලතාවයන් මත සමස්ථ සංඥා බලකායටම මේ වන වීට මහත් ආඩම්බරයකට පත්වීමේ අවකාශය ලැබී ඇත. මෙම වසරේ යුද හමුදා ශාරීරික අභ්‍යාස පුහුණු පාසල වෙතින් පවත්වන ලද සහකාර ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලා අංක 93 වෙත මෙම ඒකකය වෙතින් සහභාගී වූ සෙ/278474 කෝප්‍රල් මාලගම්මන ඕජේසීකේ එම පාඨමාලාවේ දක්ෂතම ක්‍රීඩකයාට හිමි සම්මානය දිනා ගනිමින් සංඥා බළකාය යන නාමය වර්ණවත් කර ඇති

ඒකක අණදෙන නිළධාරිගේ ශ්‍රේෂ්ඨ මගපෙන්වීම හා උපදෙස් මත ඒකක සෙනීන්ගේ අවශ්‍යතාවයන් සපුරාලීමට අවශ්‍ය වන පහසුකම් බොහොමයක් 2012 වසර තුලදී ඒකකය තුල ස්ථාපනය කර ඇත. ඒ අතුරින් මේ වසර තුලදී පැවති කොණ්ඩය කපන ස්ථානය වෙනුවට සියලු පහසුකම් වලින් යුත් නව ගොඩනැගිල්ලක් ඒකකය තුලම ස්ථාපනය කිරීම, පැවති බේකරිය පර්ණ වශයෙන් පිළිසකර කර සෙබළුන්ගේ සෞඛ්‍යට හිතකර වන පරිදි පවත්වාගෙන යාමට කටයුතු කරීම සහ බනි සැරයන් නීවස්න භෝජනාගාරයේ සියළු වැඩ නිමකර ඒකක ජ්‍යෙකොනොනීන් හට පැවරීම යන ආදිය සිදුකරන ලදි. තවද සෙබළුන්ගේ සහ සිවිල් සේවක මහතුන්ගේ සහභාගීත්වයෙන් ඔවුනොවුන් අතර, සහයෝගිතාවය වර්ධනය කිරීමේ අදිටනින් 2012 වසරේද සිංහල හා හිංදු අලුත් අවුරුද්ද වෙනුවෙන් ඒකක කඳවුරු පරිශ්‍රය තුල ජන ක්‍රීඩා වලට මුල්තැන දෙමින් ඉතා විශිෂ්ඨ බක්මහ උළෙලක් පවත්වන ලදි.

පැවති තිස් වසරක යුද්ධය නිමාවෙන් පසු තම යුතුකම් හා වගකීම් කිසිවක් අමතක නොකරමින් සියලු ජාති ආගම් භේද නොසලකා ජනතාවට සේවය කිරීමේ උදාර කාර්යයට මේ වන විට 9 වන සංඥා බළකාය පියවර තබා ඇත. ඒ අනුව ආසේමු (කිලි) ආඥාපති තුමාගේ උපදෙස් පරිදි ඒකක අණදෙන නිළධාරි තුමාගේ මගපෙන්වීම හා අධීක්ෂණය යටතේ පරන්තන් හා මාන්කුලම් යන ප්‍රදේශවල පාසල් සිසුන්ගේ පරිගණක හා තොරතුරු තාක්ෂණික දැනුම වැඩිදියුණු කිරීම සඳහා නැණසල මධ්‍යස්ථාන 02 ක් එම ප්‍රදේශ වල ඉදිකර එහි සියලු වැඩ මේ වන විට නිමකර ඇත.

සිව්වසරක පමණ ඉතා පුංචි ඉතිහාසයක් ඇති 9 වන සංඥා බළකාය මේ වන විට තම වගකීම් හා යුතුකම් ඉතා විශිෂ්ඨ අයුරින් ඉටුකරමින් මහා පර්වතයක් සේ නොසැලී සියලු බාධක ජයගනිමින් සාර්ථක ගමන් මගකට පිවිස ඇත. ඒ සදහා කැපවූ හිටපු අණදෙන නිළධාරිතුමන්ලා වන ලුතිතන් කර්නල් ඩීඑම්පීපී දසනායක, ලුතිතන් කර්නල් කේඒඩබ්එස් රත්නායක, අනෙකුත් නිළධාරින් හා සෙනින් මෙහිදී ඉතා ගෞරවයෙන් සිහිපත් කරන අතර, වර්ථමාන අණදෙන නිළධාරිතුමාගේ නායකත්වය හා මාර්ගෝපදේශණය තුලින් සීග්‍ර දියුණුවක් ලබා තිබෙන මෙම 9 වන ශ්‍රී ලංකා සංඥා බළකාය නුදුරේදී ශ්‍රී ලංකා යුද හමුදාව තුල දිදුලන ඒකකයක් බවට පත්වන බැව් නොඅනුමානය.


2011.10.29 වන දින ප්‍රධාන සංඥා නිළධාරිගේ ඒකක සංචාරය


2012.01.22 දින සංඥා බළකාධිපතිගේ ඒකක සංචාරය


2012.01.22 දින සංඥා බළකාධිපති විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම


2012.01.22 දින සංඥා බළකාධිපති විසින් සියළු නිලයින් ඇමතීම



2012.01.23 දින ඒකක අණදෙන නිළධාරි අතින් අභිනවයෙන් ඉදිකරන ලද බනි හා සැරයන් නිවස්න භෝජනාගාරය විවෘත කරනු ලැබූ අවස්ථාව




2012 වර්ෂයේ පැවැත්වූ අන්තර් ඒකක සරඹ තරගාවලියේ ශූරතාවය දිනාගත් කණ්ඩායම



2012 වර්ෂයේ පැවති බක්මහ උළෙල



2012 වර්ෂයේ පැවැත්වූ ශාරීරික අභ්‍යාස උපදේශක පාඨමාලාවේ හොඳම ක්‍රීඩකයාට හිමි සම්මානය දිනාගත් සෙ/278474 කෝප්‍රල් මාලගම්මන ඕපීසීකේ




2012 වර්ෂයේ ඒකකය විසින් නිර්මාණය කල වෙසක් පහන් කූඩුව

# 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය

ශ්‍රී ලංකා සංඥා බළකාය යටතේ 1991 අගෝස්තු 23 වන දින විද්‍යුත් දත්ත සැකසුම් ඒකකය නමින් ආරම්භ කරන ලද මෙම ඒකකය අනෙකුත් සංඥා ඒකක හා සමගාමීව ක්‍රියාත්මකවීම වස් 2010 සැප්තැම්බර් මස 21 වන දින 11 වන රෙජිමේන්තුව නමින් ශ්‍රී ලංකා සංඥා බළකායේ නව ඒකකයක් වශයෙන් නගා සිටුවන ලදි.

ආරම්භයේදී තොරතුරු තාක්‍ෂණ නිළධාරීන් 39 දෙනෙකුගෙන් හා සෙනින් 524 කින් සමන්විතවූ මෙම ඒකකය වර්තමානයේදී නිළධාරීන් 64 සහ සෙනින් 739 දක්වා වර්ධනය වී ඇත. සමස්ත යුධ හමුදාවම ආවරණය වන පරිදි තොරතුරු තාක්ෂණ සේවා සැපයීම සහ පරිගණක රාජකාරීන් ඉටුකිරීම මෙම ඒකකය මගින් සිදුකරනු ලබයි.

තවද යුධ හමුදාව තුළ තොරතුරු තාක්‍ෂණය ව්‍යාප්ත කිරීම පිණිස රණවිරු තොරතුරු තාක්‍ෂණ පුහුණු ආයතනය මගින් පරිගණක පාඨමාලාවන් පැවැත්වීමද සිදුකරනු ලබයි. මීට අමතරව යුධ හමුදා මූලස්ථානය, සංඥා රෙජිමේන්තු පරිශ්‍රය සහ කොකාවිල් යන ස්ථානයන්හි පිහිටුවා ඇති පරිගණක වැඩපල වෙතින් සියලුම පරිගණක හා පරිගණක උපාංගයන්හි අලුත්වැඩියා කටයුතු සිදුකරනු ලබයි. මෙම සේවාවන් සැපයීම සඳහා පරිගණක දැනුමින් පරිපූර්ණ නිළධාරීන් සහ සෙනීන් ඒකකය වෙත බඳවා ගැනීමට කටයුතු කර ඇත.

බහුමාධ්‍ය හැසිරවීම සඳහා ඉදිරි පියවරක් තබමින් ඒකකය වෙත නවතමයෙන් එක්වූ LED තිර පද්ධතිය මගින් මෙම බළකායේ සේවය මේ වන විට සමස්ථ යුධ හමුදාවේ විවිධ උත්සව අවස්ථා සඳහා සැපයීම සිදුකරනු ලබයි. ඒ පිළිබඳ විශේෂ පුහුණුවක් ලද ඒකකයේ නිළධාරීන් හා කාර්මික සෙනින් විසින් මෙම වසරේදී යුධ හමුදා ටැටෝ සංදර්ශණයල විරු දරු ක්‍රීඩා උළෙල වැනි උත්සව බොහොමයක් සාර්ථකව ආවරණය කිරීමට කටයුතු කරන ලදි. තවද ඉදිරියේදී මෙම සේවාව සිවිල් ආයතන වෙතද ලබාදී යුධ හමුදාව වෙත එමගින් මුදල් උපයාදීමේ ව්‍යාපෘතියක් වෙනුවෙන් ද මුලපුරා ඇත.

මීට අමතරව නව තාක්‍ෂණය හා මුසු වෙමින් ටෙලිප්‍රොම්ටර් තාක්ෂණික උපකරණ සේවාවද අප ඒකකය මගින් සිදුකරනු ලැබේ. තවද යුද හමුදා හඬ/දත්ත ජාලගත කිරීමේ වැඩසටහන (Army Voice/Data Network) තවදුරටත් විහිදුවා හරිමින් ලෙබනන් හා හයිටි යන රාජ්‍යයනහි ස්ථාපිත ශ්‍රී ලාංකික සාම සාධක බළඇණි වෙතද ව්‍යාප්ත කර ඇත.

වෘත්තිමය කටයුතු වලට පරිබාහිරව ක්‍රීඩා ක්ෂේත්‍රයෙන්ද මෙම ඒකක නිළධාරීන් හා සෙනින් දක්ෂතා දක්වා ඇත. 2011 වසරේ සංඥා වර්ණ ප්‍රධාන උළෙලේදී නිළධාරීන් හා සෙනින් වර්ණ ලබා ගන්නා ලදි.

2011 වසරේ අන්තර් රෙජිමේන්තු මේස පන්දු තරඟාවලියේ කාන්තා අංශයේ අනුශූරතාවය දිනාගැනීමට මෙම ඒකක කාන්තා මේස පන්දු කණ්ඩායම සමත්විය. තවද 2012 මැයි 24 වන දින කොතලාවල ආරක්‍ෂක විශ්ව විද්‍යාල පරිශ්‍රයේ පැවැත්වූ අන්තර් රෙජිමේන්තු ගොඩ ඔරු පැදීමේ තරඟාවලියේ තුන්වන ස්ථානය අප ඒකක කාන්තා ගෘහස්ථ ඔරු පැදීමේ කණ්ඩායම විසින් දිනා ගන්නා ලදි.

2012 අප්‍රේල් මස 26 දින රෙජිමේන්තු මධ්‍යස්ථාන පැසිපන්දු පිටියේදී පැවැත්වූ අන්තර් ඒකක පැසිපන්දු තරඟාවලියේ තුන්වන ස්ථානයද 11 වන රෙජිමේන්තුව, ශ්‍රීලංසංබ විසින් හිමිකර ගන්නා ලදි.



2011 වර්ශයේ පැවැති ආරක්‍ෂක සම්මන්ත්‍රණයට දායක වූ නිළධාරින්



ඒකකයේ 1 වන සංවත්සරයට සමගාමීව අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් ජීඑන්යූ ජයරත්න විසින් කඳවුරු මුරය පිරික්සීම



ශ්‍රී ලංකා යුධ හමුදා දත්ත ජාලකරණය පිළිබඳ දැනුවත් කිරීමේ පුහුණු සැසියක්



ඒකකයේ 1 වන සංවත්සරයට සමගාමීව අණදෙන නිළධාරී ලුතිතන් කර්නල් ජීඑන්යූ ජයරත්න හට පිරිනැමූ ආචාර පෙළපාලිය




ශ්‍රී ලංකා සංඥා බලකා සේවා වනිතා ශාඛාව මගින් 2012 පොසොන් පොහෝ දින සංවිධානය කරන ලද බැති ගී සංදර්ශණය සඳහා මෙම ඒකකයේ දායකත්වය



ඒකකයේ 1 වන සංවත්සරයට සමගාමීව පවත්වනු ලැබූ සියළු නිළ දිවා භොජන සංග්‍රහය

11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බළකායේ සෙ/283751 කෝප්‍රල් සේනක ඩබ්ලිව්ජී වසර 1995 ජනවාරි මස ආධුනික සෙබලෙකු ලෙස ශ්‍රී ලංකා යුද්ධ හමුදාවට බැඳී මූලික යුධ පුහුණුව ශ්‍රී ලංකා සංඥා බළකාය වෙතින් ලැබූ ඔහු මාතර රාහුල මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වන අතර 2011 මැයි මස දින යුද්ධ හමුදා මාධ්‍ය අම වෙතින් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ පවත්වනු ලැබූ මූලික නිවේදන කටයුතු පාඨමාලාව සාර්ථකව හැදෑරීමෙන් අනතුරුව එසේ පවත්වනු ලැබූ පාඨමාලාව 03 කින් පසු දක්ෂතාවයන්ගෙන් පරිපූර්ණ වු එවැනි අයවලුන් 35 දෙනෙකු තෝරා ගෙන නැවත උසස් නිවේදන කටයුතු පාඨමාලාවක් මාස 03 ක කාලයක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථා පරිශ්‍රයේදී පවත්න ලදි. එයින් උසස් ලෙස සමත් ඔහු දැනට 11 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා බලකායට අනුයුක්තව රාජකාරි කරගෙන යනු ලබන අතර, ඔහු විසින් සංඥා රෙජිමේන්තුව විසින් පවත්වනු ලබන සියලුම උත්සව කටයුතු වලදී තම දායකත්වය ලබාදෙමින් ඔහුගේ ක්ෂේත්‍රයේ දිගු ගමනක් යෑමට මුල පුරන්නෙකි. තවද මෙතෙක් ඔහු විසින් ඉදිරිපත් කරන ලද වැඩසටහන් අතරින් ශ්‍රී ලංකා සංඥා බලකා වර්ණ රාත්‍රිය - 2012 සහ ජාතික ව්‍යාපාර කලමණාකාරිත්ව ආයතනය විසින් සංවිධානය කරන ලද රණවිරු දුවාදරුවන් වෙනුවෙන් ශිෂ්‍යත්ව පිරිනැමීම යන උත්සව හැඳින්විය හැක. ඔහුගේ දිප්තිමත් අනාගතය වෙනුවෙන් ඒකකයේ අණදෙන නිළධාරි තුමාගේ සහ සියලුම නිළධාරින්ගේ දිරිමත් කිරීම් නිරන්ත ලබාදෙන අතර, ඔහුගේ අනාගතය වෙනුවෙන් ඒකකය නිරන්තර සුභාසිංෂන ගෙන එමි.





ලුතිතන් කර්නල් එස්පීපී පක්ෂවීර කරාතේ ක්‍රීඩාව සඳහා යුධ හමුදා වර්ණාද මේසපන්දු, බිලියඩ් සහ කරාතේ ක්‍රීඩාවන් සඳහා සංඥා බළකා වර්ණාද ලබාගැනීම



ලා/කෝ අතුකෝරල එස්පීපී කරාතේ ක්‍රීඩාව සඳහා සංඥා බළකා වර්ණ ලබාගැනීම



2012 01 20 වන දින සිට 2012 03 10 වන දින දක්වා ඒකකයේ පවත්වන ලද සංඥා සෙබල සිට ලා/කෝ දක්වා නිළ උසස් කිරීමේ පාඨමාලාව

# සංඥා පුහුණු පාසල

වර්ෂ 1964 දී පලවන සංඥා බලකාය යටතේ පනාගොඩ ස්ථාපිතව පැවති අභ්‍යාස සංඥා බලඝණය පුහුණු පාසලක් වශයෙන් වර්ෂ 1991 ජූලි මස 15 වන දින ලෝක උරුම නගරයක් වන ඓතිහාසික මහනුවර සෙංකඩගල පුරවරයේ මනරම් කඳු මුදුනක ස්ථාපනය කර සංඥා පුහුණු කටයුතු ආරම්භ කරන ලදි. යුද්ධ හමුදාවේ ව්‍යාප්තියත් සමග වර්ෂ 1995 සිට මෙම පුහුණු පාසල සංඥා පාඨමාලාවන් සඳහා පමණක් සීමානොවී අනෙකුත් පුහුණු පාඨමාලාවන් පැවැත්වීමට සුදුසු පරිදි පහසුකම් සලසා යුධ හමුදා පුහුණු පාසලක් වශයෙන් පුළුල් පරාසයක් තුල සිය පුහුණු කටයුතු ආරම්භ කරන ලදි. එතැන් සිට "තාක්ෂණයෙන් පිරිපුන්ව"යන උද්ධෘත පාඨය යටතේ විවිධ ක්ෂේත්‍රයන්හි නිපුණත්වය විදහා පාමින් මෙම පුහුණු පාසල ශ්‍රී ලංකා සංඥා බලකායට මහත් කීර්තියක් ගෙන දෙන ලදි.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ පුහුණු කටයුතු වලට පමණක් සීමා නොවී සමස්ථ ත්‍රිවිධ හමුදාවේම නිලධාරි/සෙසුනිලයින් වෙනුවෙන් සංඥා/වෙනත් පුහුණු පාඨමාලාවන් සහ සේවයේ නියුතු/විශ්‍රාමික සහ මියගිය නිලධාරි/සෙසුනිලයින්ගේ දූ දරුවන් වෙනුවෙන් පරිගණක පුහුණු පාඨමාලාවන් ආදිය පවත්වමින් වචනයේ පරිසමාප්ත අර්ථයෙන් පුහුණු පාසලකින් ඉටුවිය යුතු කාර්යභාරය වගකීමෙන් යුතුව මෙම පුහුණු පාසල වෙතින් මැනවින් ඉටුකරනු ලබයි.

තවද පුහුණු ක්ෂේත්‍රයේ විවිධ අභියෝගයන්ට මුහුණ දෙමින් දේශයට අභිමානවත් දූ පුතුන් බිහිකිරීමේ අරමුණින් යුතුව අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ නිර්දේශය මත විශ්ව විද්‍යාල වලට ඇතුලත් වීමට සුදුසුකම් සපුරා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙනුවෙන් නායක්තව හා ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමේ පුහුණු පාඨමාලාවන් ඉතා සාර්ථක ලෙස පවත්වමින් රජයේ මෙන්ම එම සිසු දරු දැරියන්ගේද ප්‍රශංසාත්මක ඇගයීමට ලක්වීමට තරම් මෙම පුහුණු පාසල භාග්‍යවන්ත විය.

පුහුණු කටයුතු වලට අමතරව මෙම බල ප්‍රදේශය තුල ඇති වන නායයාම්, හදිසි ගිණි ගැනීම් සහ වෙනත් හදිසි අපදා තත්වයන් ඇති වු අවස්ථාවන්හිදි, යුධමය තත්වයන් වලදි මෙන්ම අනෙකුත් අවස්ථාවන්හිදි සිවිල් මහ ජනතාව ආරක්ෂා කිරීමේ වගකීම පෙර දැරි කොට දැරූ කැපවීමෙන් සහ සාමුහික හැඟීමෙන් කටයුතු කර එම ආපදා තත්වයන් මැඩ පැවැත්වීම හේතුවෙන් මෙම පුහුණු පාසල සෙංකඩගල පුරවරයේ ජනප්‍රසාදයට පත්ව සිටින බැව් ඉමහත් ආඩම්බරයෙන් ප්‍රකාශ කර සිටිමි. තවද, මෙම පුහුණු පාසල ආසන්නයේ පිහිටි මහනුවර ඓතිහාසික ශ්‍රී දළදා මාලිගාව සහ කඳවුර අසල පිහිටි වෙහෙර විහාරස්ථාන වලත් ප්‍රදේශයේ අනෙකුත් පොදු කටයුතු උදෙසාත් සෑම අතින්ම කැප වී ඒ සඳහා උදව් උපකාර කරමින් කටයුතු කිරීම හේතුවෙන්ද මෙම පුහුණු පාසල මෙම පුදේශයේ මහජන ගෞරවයට පත්ව ඇත.

එමෙන්ම සංඥා බලකායට මෙන්ම සමස්ථ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවටද කිර්තියක් අත්පත් කර දෙමින් විවිධ ක්ෂේත්‍රයන්හි මනා නිපුණතාවයන් දක්වමින් ආදර්ශමත්ව දිගු ගමනක යෙදී සිටින සංඥා පුහුණු පාසල ප්‍රධාන උපදේශක කපිතන් කේඑම්ආර්පී කරුණාතිලක යන නිලධාරිගේ අණදීම යටතේ පලමු පියවර තබා පසුව මේජර්ඒඒ පෙරේරා යන ජ්‍යෙෂ්ඨ නිලධාරි සේනාවිධායක තනතුර හොබවමින් ඇරඹූ සංඥා පුහුණු පාසල මේ දක්වා සේනාවිධායකවරුන් 20 නෙකු සහ ප්‍රධාන උපදේශකවරුන් 23 දෙනෙකුගේ මග පෙන්වීම යටතේ තම ඉදිරි ගමන සිදුකර ඇත. මෙම පුහුණු පාසලේ වත්මන් සේනාවිධායක වශයෙන් ලුතිතන් කර්නල් ආර් ඇල්වීටිගල යන ජ්‍යෙෂ්ඨ නිලධාරි කටයුතු කරනු ලබන අතර, ප්‍රධාන උපදේශක වශයෙන් මේජර් ඩීඑම්එස් දිසානායක පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි කටයුතු කරනු ලබයි.

සංඥා පුහුණු පාසලේ සේනාවිධායක වශයෙන් කටයුතු කරන ලද ලුතිතන් කර්නල් ඩබ්ල්ව්ඊඑන් වරකාගොඩ පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි වර්ෂ 2012.03.26 වන දින එම තනතුරෙන් නික්ම යාම හේතුවෙන් සම්මාන මුරයක් සහ අලංකාර සම්මාන පෙළපාලියක් පවත්වා සියලු නිලයින්ගේ සහභාගිත්වයෙන් ප්‍රනීත දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීමට කටයුතු කරන ලදි.




2012.03.26 දින සේනාවිධායක තනතුරෙන් සමුගත් ලුතිතන් කර්නල් ඩබ්ල්ව්ඊඑන් වරකාගොඩ පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් කැදවුරු මුරය පරීක්ෂා කිරීම



2012.03.26 දින සේනාවිධායක තනතුරෙන් සමුගත් ලුතිතන් කර්නල් ඩබ්ල්ව්ඊඑන් වරකාගොඩ පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි හට පිරිනමන ලද ආචාර පෙළපාලිය



2012.03.26 දින සේනාවිධායක තනතුරෙන් සමුගත් ලුතිතන් කර්නල් ඩබ්ල්ව්ඊඑන් වරකාගොඩ පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරිගේ ප්‍රධානත්වයෙන් පැවැති සියලු නිලයින්ගේ දිවා භෝජන සංග්‍රහය

සංඥා පුහුණු පාසල ඉතිහාසයේ නව පිටුවක් දිග හරිමින් වත්මන් සේනාවිධායක වශයෙන් කටයුතු කරනු ලබන ලුතිතන් කර්නල් ආර් ඇල්විටිගල යන ජ්‍යෙෂ්ඨ නිලධාරි එම තනතුරේ රාජකාරි භාර ගැනිම හේතුවෙන් වර්ෂ 2012.03.27 වන දින සම්මාන මුරයක් සහ අලංකාර සම්මාන පෙළපාලියක් පවත්වා එදින සෙත් පිරිත් සජ්ඣායනා මධ්‍යයේ ඉතා චාම් ලෙස සේනාවිධායක තනතුරෙහි රාජකාරි භාර ගන්නා ලදි.



2012.03.27 වන දින 23 වන සේනාවිධායක වශයෙන් ලුතිතන් කර්නල් ආර් ඇල්විටිගල යන ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් නව තනතුරේ රාජකාරි භාර ගැනීම වෙනුවෙන් පැවැති කැදවුරු මුරය පරීක්ෂා කිරීම



2012.03.27 වන දින 23 වන සේනාවිධායක වශයෙන් ලුතිතන් කර්නල් ආර් ඇල්විටිගල යන ජ්‍යෙෂ්ඨ නිලධාරි තනතුරේ වැඩ භාර ගැනිම වෙනුවෙන් පැවැති අචාර පෙළපාලිය




2012.03.27 වන දින 23 වන සේනාවිධායක වශයෙන් ලුතිතන් කර්නල් ආර් ඇල්විටිගල යන ජ්‍යෙෂ්ඨ නිලධාරි සුභ මොහොතින් නව තනතුරේ වැඩ භාර ගැනීම

බාහිර ක්‍රියාකරකම්

වර්ෂ 2012.05.22 දින කඳවුර අසල ධර්මරාජ විද්‍යාල භූමියට මායිම්ව ඇති වු හදිසි ගින්නක් මෙම පුහුණු පාසලේ භඨ පිරිස් විසින් සාර්ථකව මැඩ පැවැත්වීමට දායකත්වය ලබා දෙන ලදි.

කඳවුරට පිවිසෙන මාර්ගයේ පිහිටි බෝධි රාජාරාම විහාරස්ථානයේ චෛත්‍ය ඉදිකිරීම සඳහා වු මුල්ගල තැබීමේ උත්සවය වෙනුවෙන් මෙම පුහුණු පාසලේ පාඨමාලා හදාරනු ලබන සෙනින් හා නිත්‍ය කාර්යය මණ්ඩල සෙනින්ගේ සහභාගිත්වයෙන් ශ්‍රමදායකත්වයක් ලබා දෙන ලදි

දිගන නගරයේ පිහිටි රජයේ ආබාධිත අයවලුන්ගේ රෝහලක් පිරිසිදු කිරීම සඳහා ශ්‍රම දායකත්වය ලබාදීමට කටයුතු කරන ලදි.

11 සේනාංක මුලස්ථානයේ උපදෙස් පරිදි වෙසක් පුන් පෝහෝය දිනය නිමිති කොට ගෙන පේරාදෙණිය කොළඹ නව මාර්ගයේ දෙපස වෙසක් කූඩු සවි කිරීම හා ප්‍රධාන මාර්ගයේ සිට කඳවුරට පිවිසෙන ශ්‍රී බෝධිරාජාරාම මාර්ගය දෙපස වෙසක් කූඩු එල්ලා අලංකාර කිරීමට කටයුතු කරන ලදි.







සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය සියලු නිලයින්ගේ සහ එම පවුල්වල සාමාජිකයින්ගේ සහභාගිත්වයෙන් වර්ෂ 2012.04.10 දින මෙම පුහුණු පාසලේ ක්‍රීඩා භූමියේදී පැවැත්වීමට කටයුතු කල අතර,රාත්‍රී සංගීත සන්ධ්‍යාවක්ද පැවැත්වීමට කටයුතු කරන ලදි.







නවීකරණ කටයුතු සහ ඉදිකිරීම්

- නවතමයෙන් ඉදිකරන ලද නිලධාරි නිවස්නයේ ආරක්ෂාව සඳහා ගල් බැම්මක් ඉදිකිරීම.
- දේශණ ශාලාව වායු සමණය කිරීම සහ තිර රෙදි හා බිම ඇතිරිලි යොදා නවීකරණය කිරීම.
- නිවාඩු නිකේතනය සඳහා අමතර කාමරයක් ඇතුලත් වනසේ නවීකරණය කිරීම.
- සෙසුනිල ප්‍රධාන මුලුතැන්ගෙයි නවීකරණ කටයුතු සිදු කිරීම, එහි අපද්‍රව්‍ය බැහැරව යන කාණු පද්ධතිය සහ කඳවුරේ නාය යන ස්ථාන හියුම් පයිප්ප යොදා සකස් කිරීම.
- බනි/සැරයන් නිවස්නයේ ඉඩ පහසුකම් ප්‍රමාණවත් නොවන බැවින් ඒ සඳහා නවතමයෙන් කාමර 03 ක් ඉදිකරමින් පැවතීම.










සුභසාධන කටයුතු

සංඥා පුහුණු පාසලේ රාජකාරි කරනු ලබන සෙසුනිලයන්ගේ සුභසාධනය සඳහා රෙඅාස වෙතින් ලබා දෙනු ලැබු රු: 5000.00 ක තාවකාලික ණය මුදල රු: 10000.00 ක් දක්වා වැඩි කිරීමට කටයුතු කිරීම.

පුහුණු කටයුතු

2010.09.14 වන දින ආරම්භ කරන ලද රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය මගින් ශ්‍රී ලංකා යුද හමුදාවේ දැනට සේවයේ යෙදී සිටින, සේවයේ යෙදී සිටියදී මියගිය, විශ්‍රාමික හා ආබාධිත නිලධාරි/සෙසුනිලයින්ගේ සහ සිවිල් සේවක මහත්ම මහත්මීන්ගේ පවුල්වල දූදරුවන් සඳහා ප්‍රධාන සංඥා නිලධාරි මූලස්ථානයේ උපදෙස් මත පහත සඳහන් පාඨමාලාවන් පවත්වා ගෙන යනු ලබයි .

- ශ්‍රී ලංකා පරිගණක ධාවන බලපත්‍ර පාඨමාලාව
  දැනට සිසු සිසුවියන් 73 දෙනෙකු පාඨමාලාව සාර්ථකව හදාරා ඇත.
- තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික පාඨමාලාව
  දැනට සිසු සිසුවියන් 105 දෙනෙකු පාඨමාලාව සාර්ථකව හදාරා ඇත.

මීට අමතරව ප්‍රධාන සංඥා නිලධාරි මූලස්ථානයේ උපදෙස් මත යුධ හමුදා සාමාජිකයින් 43 දෙනෙකු හට රණවිරු තොරතුරු තාක්ෂණ පුහුණු ආයතනය මගින් පරිගණක පුහුණුව ලබා දෙන ලදි.





රෙජිමේන්තු සංඥා නිලධාරි පාඨමාලාව

ශ්‍රී ලංකා යුධ හමුදාවට අයත් වෙනත් ඒකක නිලධාරින් හට සංඥා රාජකාරි සැබෑදිව දැනුමක් හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදෙනු ලබන අතර, වර්ෂ 2012 දී වෙනත් ඒකක නිලධාරින් 12 දෙනෙකු මෙම පාඨමාලාව ඉතා සාර්ථක අන්දමින් හදාරන ලදි.





වෙනත් ඒකක සංඥා පාඨමාලාව

වෙනත් ඒකක සෙනීන්හට තම ඒකක සංඥා අංශ සෙනින් ලෙස කටයුතු කිරීම සඳහා අවශ්‍ය මූලික න්‍යායික, ප්‍රායෝගික සංඥා දැනුම ලබාදීම හා ඒ වෙනුවෙන් ඔවුන් පුහුණු කිරීම. වර්ෂ 2012 දී වෙනත් ඒකක සෙනීන් 134 දෙනෙකු මෙම පාඨමාලාව ඉතා සාර්ථක අන්දමින් හදාරන ලදි.



විද්‍යුත් සංග්‍රාමික පාඨමාලාව

ත්‍රිවිධ හමුදා අයවලුන් හට විද්‍යුත් සංග්‍රාමික ක්‍රියාකරුවන් ලෙස රාජකාරින් කිරීම පිණිස, විද්‍යුත් සංග්‍රාමික න්‍යායන්හි මූලික දැනුම ලබාදීම හා ඒ සැබැඳි වන මූලික පුහුණුව ප්‍රායෝගිකව ලබාදීම. වර්ෂ 2012 දී සෙනීන් 22 කු මෙම පාඨමාලාව ඉතා සාර්ථක අන්දමින් නීමකරන ලදි.



මූලික පරිශණක පාඨමාලාව

ශ්‍රී ලංකා යුධ හමුදාවේ ලිපිකරුවන්/අනෙකුත් වෘත්තීන් වල නියැලි අයවලුන් හට පරිගණක ක්‍රියාකරුවන් ලෙස ක්‍රියාකිරීම සඳහා මූලික පරිගණක පුහුණුවක් ලබාදීම. වර්ෂ 2012 දී මෙම පාඨමාලාව සෙනීන් 128 දෙනෙකු ඉතා සාර්ථක අන්දමින් නිමකරන ලදි. මේ සඳහා සංඥා පාසල් රෙආාස අරමුදලින්, නැවත ප්‍රතිපූර්ණ කිරීමේ පදනම මත නව පරිගණක යන්ත්‍ර 25 ක් මිලදී ගන්නා ලදි.



සංඥා උපදේශක පාඨමාලාව

වෙනත් ඒකක සංඥා අංශ භාර කොනොනි / ජේකොනොනින් හට තම ඒකකවල සංඥා උපදේශකයෙකු වශයෙන් රාජකාරි කිරීම සඳහා අවශ්‍ය න්‍යායික හා ප්‍රායෝගික දැනුම ලබාදීම. වර්ෂ 2012 දී සෙනින් 08 දෙනෙකු මෙම පාඨමාලාව සාර්ථක අන්දමින් නිමකරන ලදි.



තරුණ සංඥා නිලධාරි පාඨමාලාව

ඉඳුරාම සංඥා බලකායට බඳවා ගන්නා ලද නිලධාරින් හට සංඥා ඒකකයන් තුල ඇති රාජකාරි හා සියළු සංඥා උපකරණ සැබැඳිව දැනුම සහ ප්‍රායෝගික පුහුණුව ලබාදීම. වර්ෂ 2012 දී නිලධාරින් 17 දෙනෙකු මෙම පාඨමාලාව ඉතා සාර්ථක අන්දමින් නිමකරන ලදි.



ජේකොනොනි නායකත්ව හා කළමනාකරණ පාඨමාලාව

සංඥා බළකායට අයත් ජේකොනොනින්ගේ නායකත්ව කළමනාකරණය හා සංඥා බළකායට අයත් සියළුම විෂයන් පිළිබඳව දැනුම වර්ධනය කිරීම. වර්ෂ 2012 දී ඒකකයන් වෙතින් තත් පාඨමාලාව සඳහා ප්‍රමාණවත් පරිදි ජේකොනොනින් රපෝර්තු නොකරවීම හේතුවෙන් අදාල පාඨමාලාව අවලංගු කරන ලදි.

වෘත්තීය පරීක්ෂණ 1 වන ශ්‍රේණිය

ශ්‍රී ලංකා යුද්ධ හමුදා සංඥා බලකායට අයත් ගුවන් විදුලි යන්ත්‍ර ක්‍රියාකරුවන්, සංඥා මධ්‍යස්ථාන ක්‍රියාකරුවන්, දුරකථන මාර්ග නඩත්තුකරුවන් සඳහා වෘත්තීය පරීක්ෂණ I වන ශ්‍රේණිය පාඨමාලාව පැවැත්වීම. වර්ෂ 2012 දී මෙම පාඨමාලාව කොනොනීන් 39 දෙනෙකු ඉතා සාර්ථක අන්දමින් නිම කරන ලදි.



කෝප්‍රල් සිට සැරයන් දක්වා නිළ උසස් කිරීමේ පාඨමාලාව

බණ්ඩ භාර සැරයන්වරයෙකු වශයෙන් රාජකාරි කිරීම සඳහා අවශ්‍ය හමුදාමය දැනුම පිළිබඳ නිසි අවබෝධයක් හා ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම. වර්ෂ 2012 දී ජේකොනොනි / කොනොනින් 72 කු මෙම පාඨමාලාව සාර්ථක අන්දමින් නිමකරන ලදි.



රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ පූර්ණ අනුමැතිය ඇතිව නුදුරේදී යුද හමුදාවෙන් විශ්‍රාම යාමට නියමිත අයවළුන් සඳහා පහත සඳහන් පාඨමාලා පවත්වන ලදි.

## ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාම යාමට නීයමිත අයවළුන් සඳහා දුරකථන ක්‍රියාකරු පුහුණු පාඨමාලාව

විශ්‍රාම ගැනීමට නියමිත ත්‍රිවිධ හමුදා අයවළුන් සඳහා දුරකථන ක්‍රියාකරුවෙකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය වෘත්තීමය දැනුම ලබාදීම. වර්ෂ 2012 දී ත්‍රිවිධ හමුදාවේ බළලත් නිලධාරි/ජේකොනොනීන් 08 දෙනෙකු මෙම පාඨමාලාව සාර්ථක අන්දමින් නිමකරන ලදි.



## ත්‍රිවිධ හමුදාවේ විශ්‍රාම යාමට නියමිත අයවළුන් සඳහා පරිගණක ක්‍රියාකරු පුහුණු පාඨමාලාව

විශ්‍රාම ගැනීමට නියමිත ත්‍රිවිධ හමුදා අයවළුන් සඳහා පරිගණක ක්‍රියාකරුවෙකු ලෙස කටයුතු කිරීමට අවශ්‍ය මූලික පරිගණක දැනුම ලබාදීම. වර්ෂ 2012 දී ත්‍රිවිධ හමුදාවේ බළලත් නිලධාරි/ජේකොනොනීන් 08 දෙනෙකු මෙම පාඨමාලාව සාර්ථක අන්දමින් නිමකරන ලදි.



## මානව හිමිකම් දේශන පැවැත්වීම

මෙම පුහුණු පාසැලේ පුහුණු ලබන සියළුම පාඨමාලාවන් සඳහා මානවහිමිකම් දේශන පැවැත්වීම.



සරසවි සිසුන් වෙනුවෙන් පවත්වනු ලබන නායකත්ව හා ධනාත්මක ආකල්ප වර්ධනය කිරීමේ පාඨමාලාව

උසස් අධ්‍යාපන ඇමතිතුමාගේ සංකල්පයකට අනුව රාජ්‍ය ආරක්‍ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි, යුහ පුහුණු අධ්‍යක්‍ෂ මණ්ඩලයේ පූර්ණ අනුමැතිය ඇතිව විශ්ව විද්‍යාල වලට ඇතුලත් විමට සුදුසුකම් සපුරා ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ නායක්තව හා ධනාත්මක ආකල්ප වර්ධනය කිරිම වෙනුවෙන් මෙවරද අධියර දෙකක් යටතේ සිසු සිසුවියන් 400 දෙනෙකු පුහුණු කිරීම සඳහා සියළු කටයුතු සූදානම් කර ඇත.

ජ්‍යෙෂ්ඨ නිළධාරි සංචාර

2012.07.06 වන දින ආඥාපති යුද්ධ හමුදා පුහුණු (Army Training Command) වශයෙන් කටයුතු කරනු ලබන මේජර් ජෙනරාල් එච්ඒටීඑච්ජ් හේරත් පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි සංඥා පුහුණු පාසලේ නිරීක්‍ෂණ චාරිකාවක නිරත වියී

ප්‍රධාන සංඥා නිළධාරි වශයෙන් කටයුතු කරනු ලබන බ්‍රිගේඩියර් ආර්ජ් කඩුවෙල යන ජ්‍යෙෂ්ඨ නිලධාරි වර්ෂ 2012.07.09 වන දින සංඥා පුහුණු පාසලේ නිරීක්‍ෂණ චාරිකාවක නිරත විය.


2012.07.06 වන දින ආඥාපති යුද්ධ හමුදා පුහුණුගේ කඳවුරු සංචාරය සිහිකිරීම වස් පැලයක් රෝපණය කිරීම


2012.07.09 වන දින ප්‍රධාන සංඥා නිළධාරි විසින් කඳවුරු මුරය පිරික්සීම


2012.07.06 වන දින ආඥාපති යුද්ධ හමුදා පුහුණු විසින් පුහුණුවීම් නිරීක්‍ෂණය කිරිම



2012.07.09 වන දින ප්‍රධාන සංඥා නිළධාරිගේ කඳවුරු සංචාරය




# සංඥා මූලික වැඩපල

සංඥා මූලික වැඩපල සිය 11 වන සංවත්සරය 2011.08.13 දින සැමරන ලද අතර, ඊට සමගාමීව වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරන ලදි. ඒ අනුව හෝමාගම මුල්ලේගම මහ විද්‍යාලයේ ඉගනුම ලබන ලමුන්ට හා ගරුවරුන්ට විශාල අඩුපාඩුවක්ව පැවති වැසිකිලි පද්ධතිය මෙම ඒකක නිළධාරි හා සෙසුනිළයින්ගේ ශ්‍රමධායකත්වයෙන් හා ඒකක අරමුදලින් සිදු කරන ලද අතර, මෙම ඒකක සෙසුනිළ හට නිවාසයේ වැසිකිලි පද්ධතිය අලුත් වැඩියා කිරීම සිදුකරන ලදි.

මෙම ඒකක සේනාවිධායක තනතුරේ පුරා වසර දෙදකට වැඩි කාලසිමාවක් එනම් 2009.08.11 දින සිට 2011.11.15 දින දක්වා රාජකාරි කර ලුතිතන් කර්නල් විඑල්කේ ජයරත්න පිඑස්සි යන නිළධාරි මෙම ඒකක සේනාවිධායක තනතුරෙන් හා ශ්‍රි ලංකා යුධ හමුදාවෙන් විශ්‍රාම ලබා විදේශ ගතවිම පසුගිය වසරේදී සිදු වු අතර, එදින සිට සංඥා මූලික වැඩපල සේනාවිධායක තනතුර ලුතිතන් කර්නල් ඩබ්ලිව්එල් ප්‍රේමසිරි විසින් භාර ගන්නා ලදි.

යුද්ධය අවසන් වි වසර තුනක් ගෙවිමෙන් පසු 64 වන නිදහස් දින උත්සවය, දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශණය හා තුන්වන වරට පැවැත්වුනු විජයග්‍රහන පෙළපාලිය මෙම වසරදීත් අති උත්කර්ෂවත් ආකරයෙන් පැවැත්වීය. මෙම උත්සව වල සියලුම ජන ඇමතුම් රාජකාරි මෙම ඒකකය වෙත පැවරුනු අතර, මෙම ඒකක නිළධාරි හා සෙසුනිළයින් විසින් ඉතාමත් සාර්ථකව එම සේවාවාන් අවසන් කිරීමට හැකිවීම මෙන්ම විජයග්‍රහන පෙළපාලියේ මෙම ඒකකය විසින් සංවිධානය කරන ලද ගුවන් විදුලි යන්ත්‍ර රැගත් රථ පෙළපාලිය ඉතාමත් උසස් අයුරින් සංවිධානය කරගැනිමට හැකිවිම අප ලැබූ තවත් ජයග්‍රහනයක් සේ සැලකිය හැකිය.

මෙම මූලික වැඩපල කාර්මික නිළධාරි /සෙසුනිලයින් කාර්මික රාජකාරින්ට අමතරව ගිය වසරේ මෙන්ම මෙම වසරේද අන්තර් සංඥා ඒකක ක්‍රීඩා කටයුතු හා වෙනත් ක්‍රීඩා කටයුතු වෙනුවෙන් සහභාගිවි ජයග්‍රහන රාශියක් ලබා ගන්නා ලදි. එමෙන්ම 2012 වසරේ අන්තර් ඒකක එල්ලේ තරගාවලිය හා අන්තර් ඒකක ස්කොෂ් යන ක්‍රීඩා සංවිධානය කර පැවැත්විමටද මෙම මූලික වැඩපල වෙත පැවරුනි. එම තරග මාලාවන් පැවැත්විම සඳහා වෙනත් සංඥා ඒකකයන් නියෝජනය කරන ක්‍රීඩා කණ්ඩායම් මෙම ඒකකය වෙත ගෙන්වා ඉතාමත් උසස් අන්දමින් පැවැත්විම සඳහා හැකියාව ලැබුනි.

තවද 2012 වසරේ වෙසක් උත්සවය නිමිත්තෙන් රාජ්‍ය ආරක්‍ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය විසින් කොළඹ ගංගාරාම විහාරස්ථානය කේන්ද්‍රකොට බුද්ධ රශ්මි ජාතික වෙසක් කලාපය පැවැත්විය. මෙම වෙසක් කලාපය සඳහා සංඥා බලකාය වෙතින් ඉදිරිපත් කරනු ලබන වෙසක් පහන් කූඩුව නිර්මාණය කිරිමේ කටයුතු මෙම ඒකකය වෙත පැවරනු ලැබූ අතර, මෙම ඒකක කාර්මික නිළධාරි/සෙසුනිළයින් විසින් නලපාන ජාතකය පිළිබිඹු වන පරිදි යන්ත්‍රානුසාරයෙන් දර්ශණීය පහන් කූඩුවක් නිර්මාණය කර ප්‍රදර්ශණය කරන ලදි. එම පහන් කූඩුව පොසොන් උත්සවය නිමිත්තෙන් හම්බන්තොට හක්මන ප්‍රදේශයේ පැවැත් වූ පොසොන් කලාපයේද ප්‍රදර්ශනය කරන ලදි.

මෙම ඒකකයේ 12 වන සංවත්සරය 2012 අගෝස්තු මස 13 වන දිනට යෙදී ඇති අතර, ඒ වෙනුවෙන් සමාජයේ පොදු වැදගත් ස්ථානයක් තෝරාගෙන එහි අලුත්වැඩියා කටයුත්තක් හෝ නව ඉදිකරදීමක් කිරිමටත් සංඥා මූලික වැඩපල සෙසුනිළයින්ගේ සුභසාධනය පිණිස ව්‍යාපෘති කිපයක් මෙම ඒකක අරමුදලින් හා ශ්‍රම දායකත්වයෙන් සිදු කිරිම සඳහා දැනටමත් කටයුතු සිදු කර ඇත.

එළඹෙන වසරේදී සංඥා මූලික වැඩපල නිලධාරීන්ට හා සෙසුනිලයින්ට ගිය වසරේ මෙන්ම සංඥා බලකායට කීර්තියක් ලබාදීමට හැකියාවක් ඇති වන පරිදි ලෝකයේ දියුණු වන තාක්ෂණයට සමගාමීව දේශීය/විදේශීය පාඨමාලාවන් ලබාදීම තුලින් වෘත්තිය දැනුම වැඩි දියුණු කිරීම තුලින් යුධ හමුදාවට ඇවැසි කාර්මික දැනුම ඵලදායී ලෙස ලබාදීමේ අදිටනින් එළඹෙන අභියෝගයන්ට සාර්ථකව මුහුණදීමට අප බලාපොරොත්තු වෙමු.



2011.11.16 වන දින සේනාවිධායක තනතුරෙන් සමුගත් ලුතිතන් කර්නල් වීඑල්කේ ජයරත්න පීඑස්සී යන ජ්‍යෙෂ්ඨ නිලධාරි විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම



2011.11.16 වන දින නව සේනාවිධායක වශයෙන් ලුතිතන් කර්නල් ඩබ්ලිව්එල් ප්‍රේමසිරි එම තනතුරෙහි වැඩ භාර ගැනීම සඳහා පැමිණි අවස්ථාව



2011.11.16 වන දින නව සේනාවිධායක වශයෙන් ලුතිතන් කර්නල් ඩබ්ලිව්එල් ප්‍රේමසිරි එම තනතුරෙහි සුභ මොහොතින් වැඩ භාර ගැනීම



2012..02.04 දින සිට 2012.02.10 දින දක්වා අනුරාධපුර ඔයාමඩුව ප්‍රදේශයේ පැවැත්වූ දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශණයේ සංඥා බළකාය නියෝජනය කරමින් සංඥා මූලික වැඩපල වෙතින් ඉදි කරන ලද ප්‍රදර්ශණ කුටිය




2012..02.04 දින 2012.02.10 දින දක්වා අනුරාධපුර ඔයාමඩුව ප්‍රදේශයේ පැවැත්වූ දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශණයේ සංඥා බළකාය නියෝජනය කරමින් සංඥා මූලික වැඩපල වෙතින් සහභාගි වූ නිලධාරි/සෙසු නිළයින්

# 2(සෙව්) රෙජිමේන්තුව ශ්‍රීලංකා සංඥා බලකාය

2 වන ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්), ශ්‍රී ලංකා සංඥා බළසේනාව යටතේ 1 වන බළඝණය ශ්‍රී ලංකා සංඥා බළකාය ලෙස 1980 අගෝස්තු මස 07 දින හවනි 21/80 නගාසිටුවීමේ උපදෙස් මගින් නිළධාරින් 8 දෙනෙකු හා සෙසුනිළයින් 200 දෙනෙකුගෙන් යුතුව, බළඝණාධිපති වරයෙකුගේ අණදීම යටතේ බළඝණයක් වශයෙන් ආරම්භ කරන ලදි.

මෙම බළඝණය 1 ශ්‍රීලංසංබ අණදෙන නිළධාරිගේ පාලනය යටතේ රාජකාරි නිරතවූ අතර, 1989 ජනවාරි මස 26 දින හවනි 05/89 නගාසිටවීමේ උපදෙස් මත 1980 අප්‍රේල් මස 25 දින සිට බලපැවැත්වෙන සේ ඒකකයක් වශයෙන් නගා සිටුවීමට අනුමැතිය ලද අතර, 1999 අප්‍රේල් මස 15 දින සිට නව ඒකකයක් ලෙස රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රය තුල ආරම්භ විය.

2006 අප්‍රේල් මස 06 දින හවනි 15/2006 නගාසිටුවීමේ උපදෙස් මත නිළධාරින් 21 දෙනෙකුගෙන් සහ සෙසුනිළයින් 464 දෙනෙකුගෙන් යුතු නව සංස්ථාව අනුමත වීමෙන් පසුව 2 වන ශ්‍රී ලංකා සංඥා බළකාය(සෙව්) ලෙස ඒකකය ආරම්භ කරන ලදි.

රෙජිමේන්තු මධ්‍යස්ථානයේ ස්ථානගතව පැවති මෙම ඒකකය 2009.05.13 දින සිට සංඥා රාජකාරි කිරීම සඳහා ආසේමු(නැ) වැලිකන්ද ප්‍රදේශයේ ස්ථානගතවන ලදි.

මෙම ඒකකය ආසේමු(නැ) බළප්‍රදේශයේ ස්ථනගත වීමෙන් පසු සෙසුනිළයින් වෙත ලැබිය යුතු වරප්‍රසාදයන් වන බිනි/සැර නිවස්නය, කොනොනි සමාජශාලාව, සෙසුනිළ භෝජනාගාරය නිසි අයුරු පවත්වා ගෙන යාමට අවස්ථාව උදා වී ඇත.

2012 අප්‍රේල් මස 25 වන දින ඒකකයේ තිස් දෙවන සංවත්සර දිනය ආගමික වතාවත් වලට මුල්තැන දෙමින් සිදුකල අතර, එම දිනය නිමිති කොටගෙන 2010.04.24 දින සවස ඒකක බොමලුව අසලදී බෝධි පූජාවක් පැවැවීම, 2012.04.25 දින අණදෙන නිළධාරි වෙනුවෙන් සම්මාන මුරයක් හා ආචාර පෙළපාලියක් පැවැත්වීම, සියලු නිළ දිවා භෝජන සංග්‍රහයක් පැවැත්වීම, 2012.04.26 දින සෙසුනිළයන් සඳහා වලලතිව් වෙරළ තීරය අසල සුහද හමුවක් පැවැත්වීම හා 2012.04.27 දින රාත්‍රී බළලත් නිළධාරි සහ සැරයන් නිවස්නයේ සාදයක් පැවැත්වීම සිදු කරන ලදි.

2 වන රෙජිමේන්තුව ශ්‍රී ලංකා සංඥා බලකාය(සෙව්) ආසේමු(නැ) බලප්‍රදේශය සංඥා රාජකාරි භාරගෙන වැලිකන්ද ප්‍රදේශයේ ස්ථාන ගතවීමෙන් පසු සංඥා බළකායේ ජ්‍යෙෂ්ඨ නිළධාරින් අවස්ථා කිහිපයක සංචාරය කර ඒකකයේ ඉදිරි වැඩ කටයුතු හා දියුණුව සඳහා උපදෙස් ලබාදෙන ලදි.

- 2012.02.22 දින ප්‍රධාන සංඥා නිළධාරි තුමන්ගේ සංචාරය.
- 2012.04.30 වන දින සංඥා බළකාධිපති තුමන්ගේ සංචාරය.

මෙම ඒකකයේ අණදෙන නිළධාරි රාජකාරි නියුතුව සිටි ලුතිතන් කර්නල් ඒආර් ඔබේසේකර යන ජ්‍යෙෂ්ඨ නිළධාරි 2011.12.28 දින අණදෙන නිළධාරි තනතුර අත්හරින ලද අතර.2011.12.29 දින සිට නව අණදෙන නිළධාරි ලෙස ලුතිතන් කර්නල් එච්ඩබ්කේසී වඩුගොඩ යන ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් භාර ගන්නා ලදි.

මෙම ඒකකය වෙතින් සංඥා රාජකාරින් වලට අමතරව පොළොන්නරුව මහරෝහලේ හා වැලිකන්ද රෝහලේ නේවාසික වාට්ටු සුද්ද පවිත්‍ර කිරීම හා තීන්ත අලේප කරන ලදි. එසේම වැලිකන්ද මහා විද්‍යාලය සුද්ද පවිත්‍ර කර පිලිසකර කිරීම සිදු කරන ලදි.

එසේම අපි වෙනුවෙන් අපි නිවාස වැඩසටහන යටතේ ආසේමු(නැ) වෙතින් 24ශ්‍රිලංජාආබමු ඒකකයට අයත් රණවිරු ගම්මානය අංක 383 වැලිකන්ද පදිංචි සෙ/24කිපු00081 කෝප්‍රල් නන්දසිරි එස්පීසී යන රණවිරුවාගේ නිවසෙහි ගෙවතු අලංකාරය කිරීම සඳහා භාරදී තිබු අතර, මෙම ඒකක භට පිරිස් යොදවා ගෙවත්ත අලංකාර කරන ලදි.



2011.12.28 දින අණ දෙන නිළධාරි තනතුරෙන් සමුගත් ලුතිතන් කර්නල් ඒආර් ඔබේසේකර යන ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් කඳවුරු මුරය පරීක්‍ෂා කිරීම



2011.12.29 දින 5 වන අණදෙන නිළධාරි වශයෙන් ලුතිතන් කර්නල් එච්ඩබ්කේසී වඩුගොඩ යන ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් කඳවුරු මුරය පරීක්‍ෂා කිරීම



2011.12.29 දින ලුතිතන් කර්නල් එච්ඩබ්කේසී වඩුගොඩ යන ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් අණදෙන නිළධාරි තනතුර භාරගැනීම නිමිත්තෙන් චාරිත්‍රානුකූලව පොල්තෙල් පහන දැල්වීම



2011.12.29 දින ලුතිතන් කර්නල් එච්ඩබ්කේසී වඩුගොඩ යන ජ්‍යෙෂ්ඨ නිළධාරි විසින් ඒකකයේ 5 වන අණදෙන නිළධාරි ලෙස සුභ මොහොතින් තනතුරේ වැඩ භාරගැනීම



2012.02.22 දින ප්‍රධාන සංඥා නිළධාරි තුමන්ගේ ඒකක සංචාරය



2012.03.29 දින අභිනවයෙන් ඉදිකරන ලද සෙසුනිළ භඨනිවාසය ඒකක අණදෙන නිළධාරි විසින් විවෘත කිරීම




2012.04.25 දින 32 වන ඒකක සංවත්සර වෙනුවෙන් සියළු නිළයින් සඳහා පැවැත්වූ භොජන සංග්‍රහය



2012.04.24 දින 32 වන ඒකක සංවත්සරය නිමිති කොටගෙන පවත්වන ලද බෝධිපුජා පිංකම



2012.04.30 වන දින සංඥා බළකාධිපතිගේ ඒකක සංචාරය



2012.04.25 දින 32 වන ඒකක සංවත්සරය වෙනුවෙන් අණදෙන නිළධාරි තුමා විසින් කඳවුරු මුරය පරීක්ෂා කිරීම



2012.04.30 වන දින සංඥා බළකාධිපතිගේ ඒකක සංචාරය සිහි වනු වස් පැළයක් රෝපණය කිරීම




# සංඥා මුක්ත භට සංගමය

## 57th Anniversary of the Army Signals Association

Army Signal Association was established on 15th December 1955. Since then personnel, after their retirement kept in joining the association every year. Members of the association participate at the Annual General Meeting and Get together with their families every year to meet, enjoy and reminisces of the past.

This year too (2012) Army Signals Association held is Annual General Meeting and the Families Get together at the Army Holiday Resort on 8th April 2012 amidst a large gathering. The event was fully sponsored by the Corps of Signals. The Chief Guest was the Colonel Commandant Major General E P de Z Abeysekera USP and the Guest of Honour was the Patron of the Signals Association Major General C J Abeyratna VSP USP (retd). The President and the members of the Association are very much thankful to the Colonel Commandant for his kind gesture of donating Rs. 100,00/- to start the newly proposed "Suwa" Seva Fund", a fund established to meet the need of old & sick retired members.



Observing 2 minutes silence for remembering those who left us



Delivering Welcome Address by the president of the Army Signals Association Wadduwa Army Resort



Arrival of the Chief Guest
Major General E P de Z Abeysekara USP,
Colonel Commandant of the Corps of Signal and
Major General C J Abeyratna VSP USP (retd),
the Patron of the Association



Address by the Colonel Commandant
Major General E P de Z Abeysekara USP



Section of the gathering at the Annual General Meeting



Family get together



President of the Army Signals Association attending the 31st Royal Commonwealth Ex-Services League conference held in Malta on 05th - 10 May 2012



Family get together



Members enjoying lunch with Signals Calypso Group in attendance



Sports competition

# ශ්‍රීලංසංබ සේවා වනිතා ශාඛාවේ යුග මෙහෙවර

පසුගිය කාලවකවානුව තුලදී ශ්‍රීලංකා සංඥා බළකායට අයත් සේවා වනිතා ශාඛාව මගින් යුද්ධයේදී මියගිය නිළධාරින් සහ සෙසුහිළයින්ගේ ලගම ඥාතින් වෙනුවෙන් සහ යුද්ධයේදී ආබාධිතවූ නිළධාරි/සෙසුනිළයන් වෙනුවෙන්ද සේවයේ යෙදී සිටින රණවිරුවන් වෙනුවෙන්ද පසුගිය වර්ෂය තුල සිදුකලාවූ සුභසාධන මෙහෙවර අති මහත්වූවකි.

දශක තුනක අධික වූ කුරිරු ත්‍රස්ථවාදින්ගෙන් මාතෘ භූමිය මුදවාලීම සඳහා අපිරිමිත මෙහෙයක් කලාවූ සංඥා බළකායට අයත් රණවිරුවන්ගේ ඉදිරි දිවිය වඩාත් අර්තාන්විත හා ප්‍රීතිමත් කරලිමේ අරමුණින් සංඥා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය සහ එහි සාමාජිකාවන් ඉටුකරනු ලැබූ වගකීම් සම්භාරය අන්කවරදාටත් වඩා කැපී පෙණෙන මුහුණුවරක් ගෙන ඇත. තවද ඔවුන්ගේ සමාජ සත්කාරය මේ වන විට සිවිල් සාමාජය සහ මුළුමහත් යුද්ධ හමුදාවේම සුභසාධනය පිණිස වූ ව්‍යප්තිය පසුගිය කාලවකවානුව තුල සිදුවූ කැපීපෙණෙන සිදුවීම් බැව් කිවයුතුය. ඒ අතුරින් 2011 වර්ෂයේ අගෝස්තු මස සිට මේ දක්වා එම ශාඛාවේ මහගු රණවිරු සහ සමාජ සත්කාර්යය "ද සිග්නල් සගරාවේ" පිටු අතර මෙලෙස සටහන් තබනු ලැබේ.

2011 සැප්තැම්බර් මස





සංඥා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිහිය සහ සාමාජිකාවන් විසින් 2011 අගෝස්තු 27 වන දින ගාල්ල 533 බසේමූ පරිශ්‍රයේදී ශ්‍රීලංකා සංඥා බළකායට අයත් සේවයේ යෙදී සිටින රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් 1000 කගේ සහභාගිත්වයෙන් සුහද හමුවක් පැවැත්වූ අතර, එය එම රණවිරු දූ පුතුන් හට මෙන්ම වැඩිහිටියන්ටද නැවුම් අත්දැකිමක් විය.

2011 ඔක්තෝම්බර් මස



ශ්‍රීලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිතුමියගේ මාර්ගොපදේශකත්වයෙන් සංඥා ළමා සාමජය විසින් ලෝක ළමා දිනය සමරා මත්තේගොඩ පිහිටි කැම්ලා හවුස් ළමා නිවසේහි නේවාසික ප්‍රථිකාර ලබන මන්ද මානසික ළමුන් වෙනුවෙන් බෙහෙත් සහ වියළි ආහාර ද්‍රව්‍යමය පරිත්‍යාග කරන ලදි.





68 වන සංඥා බළකා දිනය වෙනුවෙන් සංඥා සේවා වනිතා සාමජිකාවන් මියගිය සංඥා රණවිරුවන්ගේ ලගම ඥාතින්ට පරිත්‍යාග ද්‍රව්‍ය බෙදාදුන් අතර දානමය පිංකම මහත් භක්තියෙන් යුතුව සංවිධානයකොට මියගිය/ආබාධිත සහ සේවයේ යෙදී සිටින සංඥා රණවිරුවන් වෙත පිං අනුමෝදන් කිරීම සහ සෙත් පැතීම සිදු කලේය.

<u>2011 නොවැම්බර් මස</u>



යුද්ධයේදී ආබාධිත වූ සංඥා රණවිරුවන් රැකබලා ගැනීමේ වගකීම තම දෙවුර මතට ගත් ගරු සභාපතිනියගේ සංකල්පයකට අනුව ශ්‍රීලංසංබ රෙජිමූලයට අයත් භඨනිවාසය රු.200,000 ක වියදමින් සම්පූර්ණයෙන්ම ප්‍රථිසංස්කරණය කරන ලදි. එමගින් ආබාධිත රණවිරුවන් හට පිගල් ගඩොල් ඇතිරූ භඨනිවාසයක් මෙන්ම අති නවීන පහසුකම් වලින් සමන්විත වැසිකිලි පද්ධතියක් හිමිවු අතර ඔවුන්ගේ ඒදිනෙදා වැඩ කටයුතු පහසුකරලීමට එය මේ වන විට මහඟු පිටුවහලක් වී ඇත.





ගරු සභාපතිණියගේ ප්‍රධානත්වයෙන් 2011 වර්ෂයේ වාර්ෂික මහා සභා රැස්වීම සාමාජිකාවන් 100 කට ආසන්න ප්‍රමාණයකින් පැවැත්වීමට හැකිවීම සුවිශේෂි කරුණකි. එහිදී මියගිය සහ ආබාධිත තත්වයට පත් රණවිරු දු දරුවන් වෙත අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීමක්ද සිදුවිය.

ගරු සභාපතිණියගේ සංකල්පයක් මත රණවිරු සුභසාධනය උදෙසා අරමුදල් රැස්කිරීම වස් දිවයිනේ ජනප්‍රිය සංගීත කණ්ඩායමක් වන සන්ෆලවර්ස් සංගිත කණ්ඩායමේ සහභාගිත්වයෙන් සංඥා මියැසිය නමින් සංගීත ප්‍රසංගයක් හෝමාගමදී පැවැත්විය. එමගින් ලත් ආදායමෙන් කොටසක් වැයකොට සංඥා බළකායට අයත් ආබාධිත රණවිරුවෙකු වෙනුවෙන් නිවසක් සෑදීමට කටයුතු යොදා ඇති අතර, ඉතිරි මුදල් යොදවා සිදු කිරීමට නියමිත අනෙකුත් සුභසාධන ව්‍යපෘතීන්හි ප්‍රතිලාබ සංඥා රණවිරුවන් වෙත ඉදිරියේදී ලබා දීමට නියමිතය.

<u>2011 දෙසැම්බර් මස</u>

සංඥා බළකායට අයත් ආබාධිත තත්වයට පත් රණවිරුවන් යාපනය ප්‍රදේශයේ සංචාරයක රැගෙන යාම ගරු සාභාපතිනියගේ ප්‍රධානත්වයෙන් එම මාසයේදී සිදුවූ අතර, ඒ තුලින් ඔවුන්ගේ මානසිකත්වය ඉතාමත් ඉහල තලයකට ගෙන ඒමට හැකි විය.

2011 නත්තල් දිනය වෙනුවෙන් වාද්දුව යුධ හමුදා නිවාඩු නිකේතනයේදී සංඥා සේවා වනිතා සාමාජිකාවන් විසින් ආබාධිත රණවිරුවන් සහ ඔවුන්ගේ ළමුන් වෙනුවෙන් සංවිධානය කල නත්තල් උත්සවය සැමදෙනාගේ සිත් ඇදගැනීමට සමත් විය. එහිදී ආබාධිත රණවිරුවන් සහ කුඩා ළමුන් විසින් ඉදිරිපත් කල කැරෝල් ගී සහ නාට්‍ය ප්‍රසංගය පැමිණ සිටි කාගේත් සිත් ඇද ගන්නා ලදි.









2012 ජනවාරි මස





2012 වර්ෂය උදාවීමත් සමගම සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපති තුමිය හා සාමාජිකාවන් සංඥා බළකායට අයත් ආබාධිත සෙනින් හා එක්ව පනාගොඩ බෝධිරාජාරාමයේදී ආගමික වතාවත් වල නිරත වෙමින් සියලු සංඥා රණවිරුවන්ට උදාවූ නව වසර සෞභාග්‍යවත් වීම සඳහා ආගමික අශිර්වාදය ලබා ගන්නා ලදි.





ශ්‍රීලංකා ස්වීඩින් මිත්‍රත්ව සංග්‍රමය මගින් එම මාසයේදීම රු.400000.00 ක ධන පරිත්‍යාගයක් ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවට ලබා දුන් අතර, එම මුදල් යොදවා යුද්ධයේදී පූර්ණ ආබාධ තත්වයට පත් සංඥා රණවීරුවන් වෙනුවෙන් වැසිකිළි පද්ධති 4 ක් පමණ ඉදිකර ඔවුන් වෙත ලබාදීමට කටයුතු සංවිධානය කරමින් පවතී.

2012 පෙබරවාරි මස





සංඥා සේවා වනිතා ගරු සභාපතිනියගේ මග පෙන්වීම යටතේ එම ශාඛා සාමාජිකාවන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ මියගිය සහ ආබාධිත තත්වයට පත් සංඥා රණවිරුවන්ගේ සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ සුවදුක් සොයා බැලීමේ චාරිකාවක නිරත විය. එහිදී වියළි සලාක ද්‍රව්‍ය සහිත පාර්සල් ඔවුන් වෙත ලබාදිම සිදුවිය.

<u>2012 මාර්තු මස</u>



සංඥා සේවා වනිතා ශාඛාවේ සම්බන්ධීකරණයෙන් මාර්තු මාසයේදී ශිෂ්‍යත්ව දෙකක් පමණ ආබාධිත වූ සංඥා රණවිරුවන්ගේ දරුවන් වෙත ප්‍රධානය කරන ලදි. මසකට රු.1500.00 බැගින් අදාල පරිත්‍යගශීලින් විසින් එම දරුවන් වෙත ඔවුන්ගේ අධ්‍යපන කටයුතු සාර්ථක කර ගැනීම සඳහා ලබාදීමට කටයුතු කර ඇත.



මාර්තු මස මාසික රුස්වීම සාමාජිකාවන් විසිපස්දෙනකුගේ සහාභාගිත්වයෙන් පැවැත්වු අතර එම අවස්ථාවේදී සංඥා බළකායට අයත් රණවිරුදූ පුතුන් පස්දෙනකුට පමණ ශිෂ්‍යත්ව ප්‍රධානය කිරීමක් සිදු කරන ලදි. එම දූ පුතුන් වෙතද මසකට රු.1500.00 ක මුදලක් තම අධ්‍යපන කටයුතු වෙනුවෙන් මෙවන ලබාදිමට කටයුතු කර ඇත.

<u>2012 අප්‍රේල් මස</u>






අලුත් අවුරුදු උදාවත් සමගම එළඹුණු උත්සව සමය වෙනුවෙන් යුද හමුදා සේවා වනිතා ශාඛාව සංවිධානය කල රණ අරුණ උද්‍යානය අවුරුදු පොළ 2012 වෙනුවෙන් සංඥා සේවා වනිතා ශාඛාව වෙළද කුටි තුනක් පමණ පවත්වන ලදි. එහිදී උත්සව සමයට අත්‍යවශය නිමි ඇඳුම් වියළි ආහාර ද්‍රව්‍ය ඉතා සහනදායි මිළට පාරිභෝගිකයන් වෙත අලෙවි කිරීමට කටයුතු කල අතර බොහෝ රණවිරු පවුල්වල සාමාජිකයන් ද, අදාල ද්‍රව්‍ය මිදලී ගැනීමට එක්ව සිටිනු දක්නට ලැබීය.

තවද අදාල කර්තව්‍ය සාර්ථක කර ගැනීම සඳහා රු.15,0000 ක මුදලක් ඩයලොග් සහ එටිසලාට් ආයතන හා සම්බන්ධතාවයෙන් යුතුව ශ්‍රී ලංකා සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය විසින් යුහ සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිණිය වෙත භාර දෙන ලදි












2012 උදාවූ නව වසරේ අවුරුදු අසිරිය සංඥා රෙජිමේන්තු මධ්‍යස්ථානය වෙත කැඳවාලමින් සංඥා බළකා සේවා වනිතා ශාඛාව මගින් අලුත් අවුරුදු උත්සවයක් රෙම ශ්‍රීලංසංබ පරිශ්‍රයේදී බළකාධිපති තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත් විය. ඒ සඳහා සේවයේ යෙදී සිටින සහ ආබාධිත වූ සොල්දාදුවන්ද සංඥා ළමා සාමාජයට අයත් දූ දරුවන්ද ඉතා උද්යෝගයෙන් යුතුව සහාභාගීවීම කැපී පෙනෙනු දක්නට ලැබීය.

එමෙන්ම එළඹුණු අලුත් අවුරුද්දේදී ඇවුරුදු තෑගි සමගින් ශ්‍රීලංසංබ රෙජිමේන්තු මූලස්ථාන බළසණ හඨ නිවාසය වෙත ගරු සභාපතිතුමිය ඇතුලු සාමාජිකාවන් ආබාධිත සෙනින්ගේ සුවදුක් සොයා බැලීමට පැමිණියේය.

එහිදී භඨ නිවාසයට ඇඳ ඇතරිලි සහ රෝද පුටුවක් පරිත්‍යාග කිරීම සිදු වූ අතර ආබාධිත රණවිරුවෙකු සඳහා කොමඩ් කට්ටලයක් පරිත්‍යාග කිරීම එදින සිදුවිය.







**2012 මැයි මස**







2012 මැයි මස 01 වන දින අභිමංසල සුව සහන මධ්‍යස්ථානයේ නේවාසික රණවිරුවන්ගේ සුවදුක් සොයා බැලීම සඳහා ගරු සභාපතිනිය සහ සාමාජිකාවන් සංචාරයක නිරත විය.

එහිදී එම සුව සහන මධ්‍යස්ථානයේ එතෙක් විශාල අඩුවක්ව පැවති ජල තටාකයේ භෞතික චිකිත්සක අත්වාරු රුපියල් ලක්ෂ දෙකහාමාරක වියදමින් නිමකර දීමට සහ කොමඩ් කට්ටල 05 ක් පරිත්‍යග කිරීමට සංඥා සේවා වනිතා ශාඛාව මගින් කටයුතු කරන ලදි. මේ සඳහා ජපානයේ 306 සිංහ සාමාජයේ ආධාර එම ශාඛාව විසින් ලබා ගත් අතර ජපානයේ වෙසෙන ශ්‍රීලාංකික ධන පරිත්‍යගශිලියකුගේ ආධාරයෙන් යුද්ධයේදී මියගිය සංඥා රණවිරුවන් 10 දෙනකුගේ දරුවන් හට ශිෂ්‍යත්ව ආධාර ලබාදීමත් එදිනම සිදුවිය.





2012 මැයි මස මාසික රුස්වීම රෙජිමේන්තු මධ්‍යස්ථාන පරිශ්‍රයේදී ගරු සභාපතිණියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර එහිදී සභාපතිනිය සඳාමාලි අබේසේකර මැතිණියගේ පුද්ගලික ධන පරිත්‍යගයෙන් ආබාධිත රණවිරුවෙකුගේ දරුවෙක් සඳහා මාසිකව රු.2000.00 ක ශිෂ්‍යත්ව අධාරයක් ලබාදෙන ලදි.



2011 වර්ෂයේ සංවිධානය කල සංඥා මියැසි රාත්‍රිය ප්‍රසංගයේ අදායමෙන් රුපියල් මිලියනයක මුදලක් අභිමංසල 2 ඉදිකිරීම සඳහා බ්‍රේව්හාට්ස් අරමුදල වෙත පරිත්‍යග කිරීම සහ ලේ දන්දීමේ කඳවුරක් මැයි මාසයේදී සිදු කිරීමට සංඥා සේවා වනිතා සාමාජිකාවන් සමත් විය. එහිදී සංඥා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය විසින් යුහ සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය වෙත අදාල චෙක්පත ප්‍රධානය කිරීම සිදුකල අතර එම චාම් උත්සවය සඳහා අනෙකුත් රෙජිමේන්තු සේවා වනිතා ශාඛා සභාපතිනියන්ද සහභාගිවීම කැපී පෙනෙනු අංගයක් විය. එමෙන්ම ලේ දන්දීමේ ව්‍යපාරය සඳහාද, සේවා වනිතා සාමාජිකාවන් සහ යුධ හමුදා සාමාජිකයින් විශාල පිරිසක් රුධිරය පරිත්‍යාග කිරීම සඳහා දායක වන ලදි.









2012 ජූනි මස

ජූනි මාසයේ පොසොන් උදාවත් සමගම සංඥා සේවා වනිතා ශාඛාවේ සාමාජිකාවෝ පානාගොඩ බෝධිරාජාරාමයේදී පොසොන් බැති ගී ප්‍රසංගයක් පවත්වන ලදී. මේ සඳහා සංඥා බළකායට අයත් සෙබළියන්ද ළමා සාමාජයේ සාමාජික සාමාජිකාවන්ද අදාල ප්‍රසංගයේ ප්‍රාසාංගික බව ඉහල තලයකට ගෙන එමින් ඒ සඳහා දායක විය.








එමෙන්ම පොසොන් මාසයේදීම සංඥා බළකායේ යුද්ධයේදී මියගිය රණවිරුවන්ට පින් පැමිණිවීමටත්, ආබාධිත වුවන්ට සෙත්පැතීමටත් මෙහෙනින් වහන්සේලා දෙලොස් නමක් වෙනුවෙන් දානමය පිංකමක් ගරු සභාපතිනිය සහ සාමාජිකාවන්ගේ සංවිධානයෙන් යුතුව රෙජිමේන්තු මූලස්ථාන පරිශ්‍රයේදී පැවැත්විය.

මේ සඳහා ළමා සාමාජයේ සාමාජික සාමාජිකාවන් මෙන්ම ආබාධිත තත්වයට පත් සංඥා බළකා රණවිරුවන්ද සහාභාගි වන ලදි. තවද, එදිනම මාසික සභා රුස්වීම ගරු සභාපතිනියගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ අතර, එහිදී මියගිය සංඥා රණවිරුවකුගේ දියණියකට ශිෂ්‍යත්වයක් ප්‍රධානය කිරීම ද සංඥා බළකා ආබාධිත වෝලිබෝල් කණ්ඩායමට අයත් රණවිරුවන් හට ක්‍රීඩාවට උචිත කෘතිම පාද ප්‍රධානයක්ද සිදුකරනු ලැබීය.









# SIGNAL JUNIOR'S CLUB

## OUR LOGO

**OUR MOTO** : *"Together we can do better"*

**OUR MISSION** : *To provide development opportunities that empower young children to create positive change*

**OUR VISION** : *To be the leading club of young active citizens*

| | | |
|---|---|---|
| **S** | - | Social |
| **I** | - | Intelligence |
| **G** | - | Gigantic |
| **N** | - | Naughty |
| **A** | - | Attractive |
| **L** | - | Lovable |
| | | |
| **J** | - | Joy |
| **U** | - | Unit |
| **N** | - | Negotiating |
| **I** | - | Interacting |
| **O** | - | Organised |
| **R** | - | Rare to Find |
| **S** | - | Super |
| | | |
| **C** | - | Confident |
| **L** | - | Lend and Hand |
| **U** | - | Under Control |
| **B** | - | Best of the best |

ශ්‍රී ලංකා සංඥා බළකා ළමා සමාජය සංඥා බළකා සේවා වනිතා ශාඛාවේ මගපෙන්වීම යටතේ 2009 මාර්තු මස 01 වන දින පිහිටුවන ලදි. "Together We Can Do Better" යන ආදර්ශ පාඨය යටතේ ක්‍රියාත්මක වන ළමා සමාජය මගින් මෙම වසර තුලදීද ක්‍රියාකාරකම් රැසක් සිදුකරන ලදි.

2012 රාජ්‍ය අරුණ උදානය අවුරුදු පොළෙහි සංඥා බළකා වෙළඳ කුටි අතරින් නිමි ඇඳුම් වෙළඳ කුටිය ළමා සමාජය මගින් මෙහෙයවන ලදි





තවද කාලතුවක්කු හමුදා රෙජිමේන්තු පරිශ්‍රයේදී පැවති 2012 විරුදරු බක්මහ උළෙලෙහි ගම ගෙදර අංගයද සංඥා බළකා ළමා සමාජය මගින් ඉදිරිපත් කරන ලදි.




බක්මහ උළෙලේ සෑම තරඟ ඉසව්වක් සඳහාම සංඥා බළකා ළමා සමාජයේ සාමාජික සාමාජිකාවන් ඉදිරිපත් වන ලද අතර, ප්‍රධාන ආරාධිත අමුත්තා වු යුධ හමුදා සේවා වනිතා ශාඛාවේ ගරු සභාපතිනිය පිළිගැනීම සඳහා රංගනයක්ද ඉදිරිපත් කෙරිණි. ගම ගෙදර නිර්මාණය සහ එම රංගනය සඳහා 4 වන ස්ථානය දිනාගැනීමටද සංඥා බළකා ළමා සමාජය සමත්විණි





වෙසක් උත්සවය සැමරීම සඳහා මල්, හඳුන්කූරු, මැටි පහන් හා පහන්තිර දන්සැලක් 2012 මැයි මස 05 වන දින යුධ හමුදා බෝධි රාජාරාමයේ පිවිසුම් දොරටුව අභියසදී සංඥා බළකා ළමා සමාජය මගින් පවත්වන ලදි.






තවද යංග් කුගර්ස් ළමා සමාජය විසින් සංවිධානය කර අඹේපුස්ස ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තු ක්‍රීඩා පිටියේදී පැවැත්වූ යංග් කුගර්ස් ක්‍රිකට් ෆියෙස්ටා තරඟාවලිය සඳහා සංඥා බළකා ළමා සමාජය නියෝජනය කරමින් සය දෙනෙකුගෙන් සමන්විත ක්‍රීඩක කණ්ඩායමක් සහභාගී වන ලදි.

SIGNAL Sports Hits

කෙළි බිම

## ටේබල් ටෙනිස්


2/ලුතිතන් එල්එස් කාවින්ද
2(සෙව්)ශ්‍රීලංසංබ

මෙම වසරේදී ටේබල් ටෙනිස් තරඟය 2(සෙව්)ශ්‍රීලංසංබ ඒකකය වෙතින් සංවිධානය කරන ලද අතර, එහි ශූරතාවය දිනාගැනීමට හැකිවිය. දැනට ටේබල් ටෙනිස් තරඟ සඳහා ජාතික මට්ටමේ ක්‍රීඩකයින් දෙදෙනෙකු ඒකකය නියෝජනය කරනු ලබයි

- 2/ලුතිතන් ජේඒවයිඑස් ජයකොඩි - 2(සෙව්)ශ්‍රීලංසංබ
- 2/ලුතිතන් එල්එස් කාවින්ද - 2(සෙව්)ශ්‍රීලංසංබ

## මිටිය විසිකිරීම


මා/සැරයන් වනසිංහ බංඩා බීඑම්
4 ශ්‍රීලංසංබ

ශ්‍රී ලංකා සංඥා බළකායේ 4 වන රෙජිමේන්තුවේ සෙ/276488 මා/සැරයන් වනසිංහ බංඩා බීඑම් යන ජ්‍යෙෂ්ඨ කොනොනි වසර 02 ක් වැනි ඉතා කෙටි කාලයක් ඇතුලත මිටිය විසිකිරීමේ ක්‍රීඩාවෙන් (Hammer Throw) සංඥා බළකාය තුල ඉතා විශිෂ්ඨ දස්කම් දැක්වූ ක්‍රීඩකයෙකි. ඔහු 2011 වර්ෂයේ පැවති අන්තර් ඒකක ක්‍රීඩා තරඟාවලියේදී මීටර් 16.53 ක් පමණ දුරක් මිටිය විසිකිරීමෙන් එහි ප්‍රථම ස්ථානය හිමිකරගන්නා ලදි.

ඉතා උසස් නායකත්වයකින්, දක්ෂ උපදේශක හැකියාවකින් හා දැඩි ආත්ම විශ්වාසයකින් හෙබි මෙම ක්‍රීඩකයා 4 ශ්‍රීලංසංබ ඒකක පුහුණු පාසලේ ප්‍රධාන සරඹ උපදේශක වශයෙන් කටයුතු කරන අතරතුර ඔහු ක්‍රීඩාවට දක්වන කැමැත්ත නිසාම 2012 වර්ෂයේද දීර්ඝ පුහුණුවීම් වලින්ද තොරව මීටර් 18.74 ක පමණ දුරක් මිටිය විසිකර 2011 වසරේ ඔහු විසින්ම තබා තිබූ වාර්ථාව බිඳ හෙලමින් ඉසව්වේ ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා ලදි.

## ටයිකොන්ඩෝ

### සෙ/279646 ලා/කෝ සිරිසේන එස්පි (3 ශ්‍රීලංසංබ)



යුද හමුදා රෙජිමේන්තු අතර පැවති ටයිකොන්ඩෝ තරඟාවලිය 2011 හි ෆෙදර් බර පන්තිය සඳහා සහභාගිවී තෙවන ස්ථානය ලබාගනිමින් ලෝකඩ පදක්කම දිනා ගන්නා ලදි.

## ඔරු පැදීම



සෙ/284233 සංසෙ මඩවල වයිඑම්ඇයිඩබ්එම්ජී
11 ශ්‍රීලංසංබ

අන්තර් රෙජිමේන්ත ගෘහස්ථ ඔරු පැදීමේ තරඟාවලියේ වයස 25-31 අතර පිරිමි කේවල ප්‍රථම ස්ථානය සහ සහය දෙවන ස්ථානය ලබා ගත් 11 වන රෙජිමේන්තුවේ සෙ/284233 සංසෙ මඩවල වයිඑම්ඇයිඩබ්එම්ජී හා වයස 25-31 අතර පිරිමි කේවල දෙවන ස්ථානය ලබා ගත් 5 වන රෙජිමේන්තුවේ සෙ/280496 සංසෙ ප්‍රභාත් කුමාර ටීජීඑස්



සෙ/280496 සංසෙ ප්‍රභාත් කුමාර ටීජීඑස්
5 ශ්‍රීලංසංබ

අන්තර් රෙජිමේන්ත ගොඩ ඔරු පැදීමේ තරඟාවලියේ තුන්වන ස්ථානය 11 ශ්‍රීලංසංබ කාන්තා ගෘහස්ථ ඔරු පැදීමේ කණ්ඩායම විසින් දිනා ගන්නා ලදි.



# මළල ක්‍රීඩා

## සෙ/279631 ලා/කෝ වික්‍රමසිංහ කේකේඑම්එස් - 3 ශ්‍රීලංසංබ

- ජාතික රට හරහා දිවීමේ තරඟාවලියට සමගාමීව 2012.01.29 දින පවත්වන ලද උතුරුමැද පලාත් රට හරහා දිවීමේ තරඟාවලිය 2012 හි දුර කි:මී 12 දිවීම 2 වන ස්ථානය හිමිකර ගන්නා ලදි.
- 2012.05.16 දින ජාතික යෞවන ක්‍රීඩා උළෙල සඳහා අවසන් තේරීමේ තරඟාවලියක් වශයෙන් පැවැත්වූ
- අනුරාධපුර දිස්ත්‍රික් යෞවන ක්‍රීඩා උළෙල මීටර් 10000 දිවීම ප්‍රථම ස්ථානය (කාලය විනාඩි 32 තත්පර 40)

## සෙ/2සි00708 සංසෙ විජේකාන්ත එච්එල්එස්එස් - 2(සෙව්) ශ්‍රීලංසංබ

- 2012.05.04 පවත්වන ලද 38 වන ජාතික මහා ක්‍රීඩා උළලේදී සබරගමු පළාත් ක්‍රීඩා උළලේ ඇවිදීමේ තරගයේ 2(සෙව්)ශ්‍රීලංසංබ ඒකකයට අයත් පහත නම සදහන් සෙනියා දෙවන ස්ථානය හිමි කරගෙන ඇත.

## සෙ/283557 සංසෙ තිලකරත්න කේකේපී - 3 ශ්‍රීලංසංබ



- මහනුවර දිස්ත්‍රික් ජාතික මළල ක්‍රීඩා තරඟාවලියේ
  මීටර් 400X4 සහය දිවීම ප්‍රථම ස්ථානය

  ජාතික මළල ක්‍රීඩා තරඟාවලිය කොට්ඨාශ තරඟය (මැදවච්චිය)
  මීටර් 800 දිවීම ප්‍රථම ස්ථානය
  මීටර් 1500 දිවීම ප්‍රථම ස්ථානය
  මීටර් 100X4 සහය දිවීම ප්‍රථම ස්ථානය
- මීටර් 400X4 සහය දිවීම දෙවන ස්ථානය

සෙ/284373 සංසෙ විමලසිරි ඩීඒපීජේපී - 3 ශ්‍රීලංසංබ



- 38 වන ජාතික මහා ක්‍රීඩා උළෙල කොට්ඨාශ තරගය 2012
  තුන්පිම්ම - ප්‍රථම ස්ථානය
  දුර පැනීම - ප්‍රථම ස්ථානය
  මීටර් 100 දිවීම - ප්‍රථම ස්ථානය
  (තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා)
- ජාතික මහා ක්‍රීඩා උළෙල දිස්ත්‍රික් තරගාවලිය 2012
  තුන්පිම්ම - ප්‍රථම ස්ථානය
  දුර පැනීම - ප්‍රථම ස්ථානය
  (තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා)
- ජාතික මහා ක්‍රීඩා උළෙල පළාත් තරගාවලිය 2012
  තුන්පිම්ම - දෙවන ස්ථානය
  දුර පැනීම - දෙවන ස්ථානය
  (තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා)
- තරුණ සේවා කොට්ඨාශ ක්‍රීඩා උළෙල 2012
  තුන්පිම්ම - ප්‍රථම ස්ථානය
  දුර පැනීම - ප්‍රථම ස්ථානය
  මීටර් 100 දිවීම - ප්‍රථම ස්ථානය
  (තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා)
- අන්තර් රෙජිමේන්තු මළල ක්‍රීඩා උළෙල 2012
  දුර පැනීම - ප්‍රථම ස්ථානය
  තුන්පිම්ම - දෙවන ස්ථානය
  (තරගාවලියේ දක්ෂතම ක්‍රීඩකයා)

- බී ශ්‍රේණිය යටතේ යුධ හමුදා සංචිතගත ක්‍රීඩකයෙකි.ඉසව්ව- දුර පැනීම

## කායවර්ධන

සෙ/284445 සංසෙ උපුල් නිශාන්ත කේඩීඑච් - සංමූවැ



ජාතික කායවර්ධන ශූරතාවලිය - 2012
Mr. Novice - 2012
බර පන්තිය 85kg - පළමු ස්ථානය

ජාතික කායවර්ධන ශූරතාවලිය - 2012
Mr. Sri Lanka - 2012
බර පන්තිය 85kg - පස්වන ස්ථානය

අන්තර් රෙජිමේන්තු කායවර්ධන තරගාවලිය
බර පන්තිය 80kg - තුන්වන ස්ථානය

සෙ/284580 සංසෙ පතිරණ එච්ඩීඑම් - 4 ශ්‍රීලංසංබ

ජාතික කායවර්ධන ශූරතාවලිය - 2011
Mr. Novice - 2011




# 2012 වසර අන්තර් සංඥා ඒකක ක්‍රීඩා තරඟාවලිය

| ක්‍රීඩාව | ශූරතාව | අනුශූරතාව |
|---|---|---|
| වෙඩි තැබීම | 7 ශ්‍රීලංසංබ (ආ/බ) | 6 ශ්‍රීලංසංබ (ආ/බ) |
| එල්ලේ | 6 ශ්‍රීලංසංබ (ආ/බ) | 1 ශ්‍රීලංසංබ |
| පාපන්දු | 4 ශ්‍රීලංසංබ | 1 ශ්‍රීලංසංබ |
| බිලියට් / ස්නූකර් | සංමූවැ | 9 ශ්‍රීලංසංබ |
| මුෂ්ටි ප්‍රහාර | 3 ශ්‍රීලංසංබ | 9 ශ්‍රීලංසංබ |
| පැසිපන්දු | සංමූවැ | 9 ශ්‍රීලංසංබ |
| මේසපන්දු | 2 (සෙව්) ශ්‍රීලංසංබ | 1 ශ්‍රීලංසංබ |
| වොලිබෝල් | සංමූවැ | 3 ශ්‍රීලංසංබ |
| කබඩි | 5 ශ්‍රීලංසංබ (ආ/බ) | 9 ශ්‍රීලංසංබ |
| කයවර්ධන | සංමූවැ | 7 ශ්‍රීලංසංබ (ආ/බ) |
| බර ඉසිලීම | 9 ශ්‍රීලංසංබ | 11 ශ්‍රීලංසංබ |
| බැට්මින්ටන් | සංමූවැ | 9 ශ්‍රීලංසංබ |
| මළල ක්‍රීඩා | 3 ශ්‍රීලංසංබ | 9 ශ්‍රීලංසංබ |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

# පාඨමාලා

Maj BM Jayaweera psc and Maj KACB Kodagoda RSP psc was awarded with Master of Defence Studies by The University of Kalaniya during 2012 Convocation held at BMICH on 8th February 2012



Maj B M Jayaweera psc



Maj KACB Kodagoda RSP psc

## ඉන්දියාවේ පැවති මූලික පැරිෂුට් පාඨමාලාව හදාරා සාර්ථකව නිමකර ඇති නිලධාරීන්




ලුතිතන් කේපීඑච්පී තිලකරත්න




ලුතිතන් එච්එම්සී සිසිර කුමාර

ඉන්දියාවේ භාරත් ඉලෙක්ට්‍රොනික් ආයතනය මගින් 2012.05.21 දින සිට 2012.05.26 දින දක්වා පවත්වනු ලබන HF ගුවන් විදුලි යන්ත්‍ර පිලිබඳ පාඨාලාව හදාරන ලද සංඥා මූලික වැඩපල නිළධාරි/සෙසු නිළයින්



සෙ/2සී00498 සැරයන් අනුරාධ ඩීඩීඑම් යන ජ්‍යේකොනොනි විසින් ඉන්දියාවේදී පවත්වන ලද කණිෂ්ඨ නායකත්ව පාඨමාලාව හදාරා ඉන් සමත්ව ඇත



2011.07.01 දින සිට 2011.07.22 දින දක්වා ඉන්දියාවේ පවත්වනු ලැබූ පැරිෂුට් පාඨමාලාව ප්‍රථම වරට සංඥා බළකායේ හදාරන ලද සංඥා වැඩපල ඒකකයේ සෙ/279106 කෝප්‍රල් තිලකරත්න පීඩීඑස්



# NANO TECHNOLOGY

**What is nano technology?**

Take a random selection of scientists, engineers, investors and the general public and ask them what nano technology is and you will receive a range of replies as broad as nano technology itself. For many scientists, it is nothing startlingly new; after all we have been working at the nano scale for decades, through electron microscopy, scanning probe microcopies or simply growing and analyzing thin films. For most other groups, however, nano technology means something far more ambitious, miniature submarines in the bloodstream, little cogs and gears made out of atoms, space elevators made of nano tubes, and the colonization of space. It is no wonder people often muddle up nano technology with science fiction.

**What is the nano scale?**

Although a metre is defined by the International Standards Organization as 'the length of the path travelled by light in vacuum during a time interval of 1/299 792 458 of a second' and a nanometre is by definition $10^{-9}$ of a metre, this does not help scientists to communicate the nanoscale to non-scientists. It is in human nature to relate sizes by reference to everyday objects, and the commonest definition of nanotechnology is in relation to the width of a human hair.

Unfortunately, human hairs are highly variable, ranging from tens to hundreds of microns in diameter ($10^{-6}$ of a metre), depending on the colour, type and the part of the body from which they are taken, so what is needed is a standard to which we can relate the nanoscale. Rather than asking anyone to imagine a millionth or a billionth of something, which few sane people can accomplish with ease, relating nanotechnology to atoms often makes the nanometre easier to imagine. While few non-scientists have a clear idea of how large an atom is, defining a nanometre as the size of 10 hydrogen, or 5 silicon atoms in a line is within the power of the human mind to grasp. The exact size of the atoms is less important than communicating the fact that nanotechnology is dealing with the smallest parts of matter that we can manipulate.

**PP Fernando**
**Major**
**SBW**

# COMPUTER VIRUSES

What is a computer virus? A computer virus is a program that is capable to attach itself to other programs after being executed and cause an infection. Though it is commonly called as Computer viruses, program viruses have been classified in different names. Let's have a look on some kind of program viruses.




**Ad ware**

Ad ware is a software that presents banner ads or in pop-up windows through a bar that appears on a computer screen. Those advertising spots usually can't be removed and are consequently always visible. The connection data allow many conclusions on the usage behavior and are problematic in terms of data security.

**Boot viruses**

The boot or master boot sector of hard drivers is mainly infected by boot sector viruses. They overwrite important information necessary for the system execution. One of the awkward consequences: the computer system cannot be loaded any more.

**Dialer**

The dialer is a computer program that establishes a connection to the Internet or to another computer network through the telephone line or the digital ISDN network. Fraudsters use dialers to charge users high rates when dialing up to the Internet without their knowledge.

**Gray were**

Gray ware operates in a way similar to mal ware, but it is not spread to harm the users directly. It does not affect system functionality as such. Mostly, information on the patterns use is collected in order to either sell these data or to place advertisements systematically.

**Macro viruses**

Macro viruses are programs that are written in the macro language of an application (e.g. WordBasic under WinWord 6.0) and that can normally only spread within documents of this application. Because of this, they are also called document viruses. In order to be active, they need that the corresponding applications are activated and that one of the infected macros has been executed. Unlike "normal" viruses macro viruses do consequently not attack executable files but they do attack documents of the corresponding host-application.

**Scare ware**

The term scare ware refers to software which has been designed with the intend to cause anxiety or panic. The victim could be tricked and feels threatened and usually accepts an offer to pay and have the inexistent threat removed. In some cases the victim is seduced to cause the attack himself by making him think this intervention will successfully remove the threat.

**Script Viruses and Worms**

The viruses are extremely easy to program and they can spread - if the required technology is on hand - within a few hours via email round the globe. Script viruses and worms use a script language such as Java script, VB script etc. To infiltrate in other new script or to spread by activation of operating system functions. This frequently happens via email or through the exchange of files (documents). A worm is a program that multiplies itself but that doesn't infects the host. Worms can consequently not from part of other program sequences. Worms are often the only possibility to infiltrate any kind of damaging programs on systems with restrictive security measures.

**Spy ware**

Spy wares are so called spy programs that intercept to take partial control of a computer's operation without the user's informed consent. Spy ware is designed to exploit infected computer for commercial gain, this goal include delivery of unsolicited pop-up advertisements.

**Trojan Horses (Short Trojans)**

Trojans are pretty common nowadays. We are talking about programs that pretend to have a particular function, but that show their image after execution and carry out a different function that, in most cases, is destructive. Trojan horses cannot multiply themselves, which differentiates them from viruses and worms. Most of them have an interesting name with the intention to induce the user to start the Trojan. Immediately after execution they become active and can, from example, format the hard drive. **A dropper** is a special from of Trojan that 'drops' viruses, i.e. embeds viruses on the computer system.

Though a lot of antivirus software are available in market, people are reluctant to purchase those. But ultimate result will be harmful. So its recommended to use a good antivirus program.

Capt Lakshitha Wijewantha
GSO III
Sig Bde

# රේඩියෝ ලින්ක් යනු කුමක්ද ?

ක්ෂුද්‍ර තරංග මගින් ස්ථාන දෙකක් ගුවන භාවිතා කරමින් සම්බන්ධ කරන උපකරණයකි. උදාහරණයක් ලෙස කරගහතැන්න හා මඩුකන්ද යන ස්ථාන දෙක රේඩියෝ ලින්ක් භාවිතා කරමින් ගුවන මගින් සම්බන්ධකර ඇත. එම උපකරණය මගින් එක තැනක සිට තවත් තැනකට අපට  අවශ්‍ය දත්ත එකවරම යැවිය හැක.

මෙම උපකරණය මගින් අපට අවශ්‍ය සම්බන්ධතාවය වෙන වෙනම අනෙකුත් ස්ථානයන්ට යැවිය හැක. මෙම ක්‍රමයට දැනට බහුලව භාවිතා කරන ක්‍රමය වන්නේ E1 මගින් සම්බන්ධ වීමයි. E1 එකක් යනු 2.48 kbp ධාරිතාවක් යැවිය හැකි වයර් 4 ක් එනම් TX1.2 RX1.2 යන වයර් මගින් දෙපැත්තටම එකවර දත්ත යවන ක්‍රමයයි.

උදාහරණයක් ලෙස ඔබ සිතන්න යුද හමුදා මූලස්ථානයේ ස්ථාපනය කර ඇති ස්වයංක්‍රිය විනිමයට මෙම E1 එකක් සම්බන්ධකර රේඩියෝ ලින්ක් එකක් මගින් පනාගොඩ  ඇති ස්වයංක්‍රිය විනිමයට (යුහමු සම්බන්ධ කල E1 එක) සම්බන්ධකල විට එම ස්වයංක්‍රිය විනිමයන් දෙක දෙකෙලවරක තිබුනද එක් ස්වයංක්‍රිය විනිමයක් ලෙස ක්‍රියා කරයි. එමගින් ඔබට පනාගොඩ සිට යුහමු දක්වා ස්වයංක්‍රිය විනිමය ක්‍රියාකරුවකුගේ සහය නොමැතිව  දුරකථන ඇමතුමක් අංකනය කර සම්බන්ධ විය හැක. මෙම E1 මගින් සම්බන්ධකරන එක් ක්‍රමයකි. මෙලෙස අපට අවශ්‍ය වෙනත් සම්බන්ධතා රේඩියෝ ලින්ක් මගින් පහත සඳහන් ආකාරයට සම්බන්ධ කල හැක.







කේපීයූ රත්නායක
ලුතිතන් (උපා) - ශ්‍රීලංසංබ




# IT IS A EASY WORK

අපි සිංහල අකුරු සහ ඉංග්‍රිසි අකුරු මුද්‍රණය කිරීම පහසු කර ගැනීම සඳහා කෙටි ක්‍රමයකට යමු. මෙය සිදුකල හැක්කේ Microsoft Word 2007 හි සිදුකරන ආකාරය බලමු. මේ ආකාරයට පියවරෙන් පියවර ඉදිරියට ගොස් සිදුවන්නේ කුමක්දැයි බලමු. මුලින්ම Office 2007 හි ඇති Office Button එක වෙත යමු.

WORD OPTIONS → CUSTERMIZE → ඉන්පසු Key Board Short Cut යන ස්ථානයේ ඇති Custermize වලට පිවිසෙන්න. → CUSTERMIZE KEY BOARD




මෙම මෙනුව තුළින් Catergories යන ස්ථානයෙන් Font යන්න තෝරා දිය යුතු අතර Fonts යන ස්ථානයෙන් තමන් කැමති සිංහල Font එක තෝරා Press New Shortcuts යන ස්ථානයේ Ctrl Key එක සමග Key Board එකෙහි ඇති Number Pad එකෙන් ඕනෑම අංකයක් Press කල හැක. එවිට එම ස්ථානයේ Ctrl + Num … වශයෙන් ඔබ යෙදූ අංකය දිස්වේ. (උදා:Ctrl + Num 1) මෙසේ දිස්වූ විට පහළින් ඇති Asign යන Button එක Press කල විට Current Keys යන ස්ථානයේ ඔබ යෙදූ Shortcut එක දිස්වේ. ඔබ එසේ Shortcut එක යෙදුවේ සිංහල අකුරු මුද්‍රණය සඳහා බැවින් නැවතත් ඉහත ආකාරයටම ගොස් Fonts යන ස්ථානයෙන් තමන් කැමති ඉංග්‍රීසි Font එක තෝරා Press New Shortcuts යන ස්ථානයේ Ctrl Key එක සමග Key Board එකෙහි ඇති Number Pad එකෙහි ඉහත Shortcuts එක සඳහා යෙදූ අංකය හැර වෙනත් අංකයක් Press කල හැක. එවිට එම ස්ථානයේ Ctrl + Num … වශයෙන් ඔබ යෙදූ අංකය දිස්වේ. (උදා: Ctrl + Num 0) මෙසේ දිස්වූ විට පහළින් ඇති Assign යන Button එක Press කල විට Current Keys යන ස්ථානයේ ඔබ යෙදූ Shortcut එක දිස්වේ. ඉන්පසු Close යන්න Press කර එම මෙනුවෙන් ඉවත් වන්න. ඉන්පසු ඇති මෙනුවද OK කර ඉන් ඉවත් වන්න.

දැන් බලන්න, ඔබ Word Document එකක් සිංහලෙන් Type කරමින් යන විට එය ක්ෂණිකව ඉංග්‍රීසියට පරිවර්තනය කිරීමටත් ඉංග්‍රීසියෙන් Type කරමින් යන විට එය ක්ෂණිකව සිංහලට පරිවර්තනය කිරීමටත් හැකිවන ආකාරය. එය සිදුවන්නේ ඔබ විසින් ලබාදුන් Shortcut එක අනුවයි. ඉංග්‍රීයෙන් Type කරමින් යන විට ඔබ සිංහල සඳහා යෙදූ Shortcut එක භාවිතා කල විට Home හි ඇති Font Tool Bar එකෙහි සිංහල Font එක දිස්වේ. මේ ආකාරයට සිංහලෙන් Type කරමින් යන විට ඔබ ඉංග්‍රීසි සඳහා යෙදූ Shortcut එක භාවිතා කල විට Home හි ඇති Font Tool Bar එකෙහි ඉංග්‍රිසි Font එක දිස්වේ. හරිම පහසුවෙන් Font Change කරමින් වැඩ කරගෙන යා හැක.

සැරයන් ලංකානි සිල්වා එෆ්එච්ච්ඒයු
රතොතාපුඅ-සංඥා පුහුණු පාසැල

## විද්‍යාව හා තාක්ෂණයේ දියුණුවෙන් සංවර්ධනය වූ සන්නිවේදනයේ මොබයිල් උන්මාදය

විද්‍යාව හා තාක්ෂණයේ දියුණුවත් සමගම සන්නිවේදනය ද දියුණුවී තිබෙනවා. අප ජීවත් වන්නේ අපේ ආච්චි සියා ජීවත් වුනු නැතිනම් දෙමාපියන් ජීවත්වුනු සමාජයේ නෙමෙයි. කොටින්ම කිවහොත් අප ජීවත් වන්නේ අප කුඩාකල ජීවත් වු සමාජයේ නොවෙයි. කොතරම් වේගයෙන් සමාජය සංවර්ධනය 9 තිබෙනවාද යත් සුළු මොහොතකින් එක් රටක සිටින කෙනෙකුට තවත් රටක වෙසෙන පුද්ගලයෙකු සමග අදහස් හුවමාරු කර ගැනීමට හැකි වී තිබෙනවා. මෙහිදී අන්තර් ජාලය මෙන්ම දුරකථනයට වැඩි වැදගත්කමක් හිමිවනවා. මෑත ඉතිහාසය තුළ ධනවතුන් පරිහරනය කල සුඛෝපභෝගි භාණ්ඩයක් බවට පත් ව අවසන්.



ජංගම දුරකථනය නොහොත් ~MOBIL PHONE වැඩි බලපෑමක් කර තිබෙන්නේ තරුණ පරපුරටයි. පාසල් වියේ පසුවන ළමයින් අතර පවා ජංගම දුරකථන දැකගත හැකිය. දෙමාපියන් තම දූදරුවන්ට ජංගම දුරකථනයත් ලබාදීමෙන් බලාපොරොත්තු වන්නේ හදිස්සි අවස්ථාවකදී නිවසට පණිවිඩයක් ලබාදීමටයි. නමුත් එම පරමාර්ථය සබැවින්ම ඉටුවනවාද යන්න ගැටළුවකි.

ආරක්ෂාව සඳහා ලබාදී තිබෙන මෙවැනි ජංගම දුරකථන තරුණ පරපුර විනාශය කරා ඇද දමන බැව් දෙමාපියන් මොහොතකට හෝ නොසිතන්නට ඇත. බොහෝ තරුණ තරුණියන් භාවිතා කරනු ලබන ජංගම දුරකථන සියලු පහසුකම් සහිත මිල අධික ඒවාය. මෙම ජංගම දුරකථන වල ඇති පහසුකම් උපයෝගි කර ගනිමින් අසභ්‍ය වීඩියෝපට ආදිය දුරකථනයෙන් දුරකථනයට මාරුවන බව දෙමාපියන් මොහොතකට හෝ සිතන්නට නොමැත. නොදන්නා ඇමතුම් වලින් සිදුවිය හැකි හානියද එමටය. එසේ පටන්ගත් බොහෝ ප්‍රේම වෘත්තාන්ත, මිනිමැරුම් ස්ත්‍රී දූෂණ වලින් නිමවන බවට අතිතය සාක්ෂි දරයි.

සුළු මුදලක් වැය කර ජංගම දුරකථනයක් අත්පත් කර ගැනිමේ හැකියාව අද සෑම කෙනෙකුටම තිබෙනවා. මේ නිසා ජංගම දුරකථනය අද වන විට ලංකාවේ සෑම අස්සක් මුල්ලක් නෑරම ව්‍යාප්තවී තිබෙනවා. ඇත්තෙන්ම මෙය උන්මාදයක් බවට පත්ව අවසන්.

තාක්ෂණයේ යොදාගත යුත්තේ මානව සංහතියේ යහපත උදෙසාය. ජංගම දුරකථනයද එලෙසමය. තම දියණියට හෝ පුතාට ඔහුගේ හෝ ඇයගේ උපන්දිනයට සියලු පහසුකම් සහිත ජංගම දුරකථනයක් තෑගිදෙන දෙමාපියන් ඔහු හෝ ඇය ඉන් කථාකරන්නේ කාටද, සිදුකරන්නේ මොනවාද, යන්න පිළිබඳ විමසිලිමත් විය යුතුය. නැතහොත් තමා විසින් ලබාදෙන උපන්දින තෑග්ග තම දරුවාගේ අයහපතට දොරකවුළු විවෘත කිරීමක් වනු ඇත.

සෙ/276459 කෝප්‍රල් සුභසිංහ එස්එම්ජ්ආර්
9 ශ්‍රීලංසංබ
යුධ හමුදා කඳවුර
ඉරණමඩු
කිලිනොච්චිය




## බලශක්ති විනාශයට එරෙහිව ඉලෙක්ට්‍රොනික්

අපගේ නිවසේ නිවසට බාහිරින් ඇති ඇතැම් විදුලි බුබුලු සැන්දෑවට දැල්වූ පසු යලි නිමා දාන්නේ උදේටය. මෙය මතකයෙන් හා අතින් සිදුකල යුතු කාර්යකි. ඇතැම් අවස්ථා වල සැන්දෑවේ දැල්වූ විදුලි පහන් උදෑසන පසුවී දවල් කාලය දැල්වී තිබෙන බව දැක ඇත. සුලු උනත් මෙය බලශක්තිය නිරපරාදේ වැය කිරිමක් නේද? ඉතින් මේ කාර්ය ස්වංක්‍රීය සිදුකල හැකිනම් ඔබගේ මුදල් නාස්තිය සේම රටේ බලශක්ති විනාශය යම් ප්‍රමාණයකින් හෝ අඩුකර ගතහැකි නොවේද පහත පරිපථය බලන්න. එය ඉතා සරලය. එහෙත් එයට හොඳ මතකයන් ඇත. රැය සහ දහවල හොඳින් හඳුනන නිසා රැයේ විදුලි පහන් දැල්විමටත් උදෑසනින් නිමා දමන්නටත් එයට පුලුවන. පරිපතය ඉතා කුඩා නිසා බල්බය සවිකරන හෝල්ඩරය තුල වුවද එය රඳවා තැබිය හැකිය. නමුත් LDR එකනම් ඇතුලේ සවි කරන්න නොහැකිය. එහි මුහුනට එලිය වැටෙන සේ පිටතින් සවිකල යුතුය. ඒත් බල්බයේ ආලෝකය LDR එකේ මුහුණට නොවටෙන සේ එය සවි කිරීමට ඔබ දක්ෂ විය යුතුය.




සෙ/279446 ලා/කෝ රුවන් කුමාර ඩබ්කේ
සංමුවැ - පනාගොඩ

## බාඳුරා

නැපෙන්තස් ඩිස්ටිලාටෝරියා ලෙස හඳුන්වන බාඳුරා ශාඛය ලොව මුළින්මහඳුනාගත් මාංශ භක්ෂක ශාකයයි. සතුන් ආහාරයට ගන්නා මෙම ශාඛය ලංකාවට ආවේණිකය. වැලක් ලෙස වර්ධනය වේ. සතුන් ගොදුරු කර ගැනීම සඳහා කෙණ්ඩියක ආකාර විශේෂ වර්ධනයක් මෙම ශාකයේ දක්නට ලැබේ.



එකම වැලෙහි සෑදෙන කෙණ්ඩි ආකාර තුනකි. එක් ස්වරූපයකදී කෙණ්ඩියේ පහළ සිට ඉහළට ගමන් ගන්නා සතුන් ඇතුළට වැටෙන ආකාරයට අනුවර්තනය වී ඇත. තවත් කෙණ්ඩියක් ශාකයේ පහළට ගමන් කරන සතුන් වැටෙන ආකාරයට අනුවර්තනය වී ඇත. එමෙන්ම සුළඟට ගසා ගෙන එන හෝ පියාඹා එන හෝ කුඩා කෘමි සතුන් පමණක් අල්ලා ගැනීම සඳහා අනුවර්තනය වූ කෙණ්ඩිද මෙම එකම ශාකයක දැකිය හැකිවේ.

කොළ පැහැති හෝ රතුපැහැති ශාක විශේෂ දෙකක් තෙත් කලාපයේ සිංහරාජය, කන්නෙළිය වැනි වැසි වනාන්තරයන්හි දී හමුවෙයි. රෝස පැහැති වූවිශේෂයක් මුතුරාජවෙල ප්‍රදේශයේ ඇත.බාඳුරා කෙණ්ඩියේ පියන විවර වීමට පෙර එහි ඇති ද්‍රාවණය කක්කල් කැස්සට ද වඳ බව නැති කිරීමටද ගනිතියි කියති.

පොතපත ඇසුරිනි
සෙ/2සී00697 සංසෙ පෙරේරා යූඩීආර්
2රෙපි: ශ්‍රීලංසංබ(සෙවි)

## අපේ ජාතික කොඩිය පිළිබඳ ඔබ නොදත් දේ



අපේ ජාතික කොඩිය සැම දෙනෙක්ම දැක පුරුදු දෙයකි. ජාතික වශයෙන් වැදගත් අවස්ථාවන්හි ජාතික කොඩිය ප්‍රදර්ශණය කරයි. කොඩිය සකස් වූ ආකාරය හා එහි නිරූපනය වන දේවල් පිළිබඳ ඔබ දැනුවත් කිරීම මාගේ අරමුණයි.

ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිවරයා ලෙස ඩී එස් සේනානායක මහතා විසින් 1948 වසරේ මාර්තු මස 08 වෙනිදා ජාතික කොඩිය නිර්මාණය කිරීම සඳහා කමිටුවක් පත් කලේය. එම කමිටුව සියලුම ජනවාර්ග නියෝජිතයන් ගෙන් සමන්විත වූවාය. කමිටුවේ තීරණයක් ලෙස වර්තමාන ජාතික කොඩිය නිර්මාණය කරන ලදි.

කොඩිය නිර්මාණය කිරීමේ වගකීම පැවරුනේ එවකට රජයේ කලායාතනාධිපති ජේඒඩී පෙරේරා මහතා හා එස්ජී චාර්ලිස් යන මහත්වරුන්ටය. ජාතික එකමුතුව පෙන්වීම සඳහා යොදා ගනු ලබන දේවල් අතරින් ප්‍රධාන ස්ථානයක් ගත්තේ ජාතික කොඩියයි. ජාතික කොඩිය අප සතු වස්තුවකි. ජාතික කොඩියේ අන්තර්ග දේවල් පිළිබඳ විමසා බලමු.

අපේ ජාතික කොඩියේ පසුබිම රතු පාටය. එයින් සමෘධිය සංකේතවත් කෙරේ. රතු පසුබිමේ කඩුවක් අතින් ගත් සිංහයෙකි. සිංහයා හා කඩුවේ වර්ණය කහ පාටය. කඩුවක් ඉදිරියට අල්ලාගන සිටින සිංහයාගේ එඩිතර බව සංකේතවත් කෙරේ.

රතු පසුබිමේ කොන් හතරේ බෝ කොල හතරකි. එම බෝපත් හතරින් දැක්වෙන්නේ ධර්මෂ්ඨභාවයයි. සිංහයා ඉදිරියෙන් ඇති තැඹිලි වර්ණ තීරුවෙන් මෙරට වෙසෙන ද්‍රවිඩ ජාතිකයන් සංකේතවත් කෙරේ. ඊට යාබද පිහිටි කොළ වර්ණ තීරුවෙන් සංකේතවත් කරනු ලබන්නේ මෙරට වෙසෙන මුස්ලිම් ජාතිකයින්ය. කොඩිය වටා කහ පාට තීරුවක් ඇත. ජාතික කොඩියේ සංකේතවත් වන දේවල් වෙනවෙනම ගත්තොත් මෙසේය.

| | |
|---|---|
| බෝපත් | - මෙත්තා, කරුණා, මුදිතා, උපේඛිකා, යන පරම සත්‍යය අවබෝධය |
| මෙත්තා | - රට වැසියන් එකම මගකට යොමු කිරීම |
| මුදිතා | - දුකට පත් වූවන් ඉන් මුදා ගැනිම |
| කරුණා | - සමාව, ඉවසීම, අනුන්ගේ, යහපත සැලසීම |
| උපේඛිකා | - නිහතමානකම, දානය, ප්‍රිය වචනය, අර්ථචර්‍යාව, සාමානාත්මතාව |
| සිංහයා | - සෙසු සතුන්ට වඩා සංවර ආත්ම ශක්තියෙන් යුක්තය, තමාට ගැලෙපෙන දේ පමනක් කිරීම |
| රූපයේ කහ පාට | - එඩිතරව උපන් ගති අනුව හැසිරීම |
| කේසර මාලා තුන | - බුද්ධ, ධම්ම, සංඝ යන තෙරුවන් කෙරේ විශ්වාසය තැබීම |
| ශ්‍රීවය | - පාලකයා සෘජු ශක්තිමත් අයෙකු බව |
| අයාගත් මුකය | - රාජකිය හඬ නිර්භීතව ප්‍රකාශ කිරීමට හැකියාව ඇති බව |
| නාසය | - හරි වැරදි හඳුනා ගැනීම |
| දිව | - පාලකයාගේ ප්‍රකාශ සත්‍යවාදිවත්, අවංකවත් සිදු වන බව |
| ඇස | - ජනතා ඇස තුලින් ජනතා ප්‍රශ්ණ දෙස බැලීම |
| මුකයට නැමීගිය දත් තුන | - සිත, කය, වචනය යන තුන්දොර හික්මවා විවෘතව අදහස් ප්‍රකාශ කිරීම |
| ඇස කඩුව දෙසට යොමු වීම | - පාලකයා නිසිලෙස පාලනය සිදු කරන්නේදැයි පාලිතයෝ බලා සිටි ජනතාව නිතරම අවධියෙන් සිටින බව |

| | |
|---|---|
| කේසර කැරලි 24 | - ගිහි විනය |
| හිස වලිගය මතට අකෂි ගතව තිබීම | - පාලකයා හා පාලිතයා අතර සමාන්තර තාවය ඇති බව |
| වලිගය ස්ථාන 2 කින් නැමීම | - ප්‍රථම නැමීමෙන් ජනතාවගේ දැනුම, කැපවීම පාලකයාට නොඅඩුව ලැබිය යුතු බව, දෙවන නැමීමෙන් රට වැසියන් හා පාලකයා ජාතියේ තීරනාත්මක අවස්ථාවල එකම මග ගමන් කරන බව |
| වලිගයේ කේසර කැරලි | - සැමට සුදුසු මග ආර්‍ය අෂ්ඨාංගික මාර්ගය බව ඉහලින් දැක්වේ |
| කඩුව ගත් දකුණු අත | - ආරකෂාව, ස්වාධීනත්වය, නිදහස ආරකෂා කිරීම |
| පාද | - උඨ්ඨාන සම්පදා, ආරක්ක සම්පදා, කල්යාන මිත්තා, සමජීවිකතා යන හතර |
| උඩට විහිදුන නිය | - ශ්‍රද්ධා, ශීල, ත්‍යාග, ප්‍රඥා යන ධර්ම මෙලව ජය ගැනීමට අවශ්‍ය |
| අසිපත | - අසාධාරනයේදී සටන් වැදීමත් එය ධර්මයට අනුව සිදුවීමත් කහ පාටින් දැක්වේ |
| නැවුණු තුඩු තුන | - අනිත්‍ය, දුක්ඛ, අනාත්ම තත්වයට රට ජාතියට ලක්වීම |
| අසිපත් මිටෙහි තුඩු හතර | - රට වැසියා ගොඩ නැගී ඇත්තේ අපෝ, තේජෝ, වායෝ, පටවි යන මහ භූතයන්ගෙනි |
| කඩුව අල්ලාගත් ඇඟිලි හතර | - චතුරාර්‍යය සත්‍ය |
| අත් වැස්මේ අන්ත දෙක | - රාජ්‍ය පාලනය පැත්තකට අන්තගාමී නොවීම |
| කෙලින් පිහිටි කඩු තලය | - පාලනය මධ්‍යස්ථය මධ්‍යම ප්‍රතිපදාව අනුව සිදුවිය යුතුය |
| කඩු තලය | - පාලකයා පිළිපැදිය යුතු දසරාජ ධර්මය ඇස් ඒ තලය දෙසට යොමුවීම |

ජාතික කොඩිය නිර්මාණය කිරීම සඳහා පත්කරන ලද කමිටුව

| | |
|---|---|
| එස්ඩබ්ලිව්ආර්ඩී බංඩාරනායක මහතා | - කමිටු සභාපති |
| ටීබී ජයා මහතා | - කමිටු සාමාජික |
| ශ්‍රීමත් ලලිත් රාජපකෂ මහතා | - කමිටු සාමාජික |
| ජීජී පොන්නම්බලම් මහතා | - කමිටු සාමාජික |
| ජේආර් ජයවර්ධන මහතා | - කමිටු සාමාජික |
| ශ්‍රීමත් ජෝන් කොතලාවල මහතා | - කමිටු සාමාජික |
| මහාචාර්‍ය සෙනරත් පරනවිතාන මහතා | - කමිටු ලේඛම් |

ජාතික කොඩිය ප්‍රමිති අංක 693 වර්ෂ 1985 යටතේ එය සුරකෂිත කර ඇත.
ශ්‍රීලංකා ප්‍රමිති ආයතනයේ නියමයන් අනුව සිංහයා කහ පාටින් විය යුතුය. කොඩියේ දිග පළල මෙන් දෙගුනයක් විය යුතුය.

පොතපත ඇසුරෙන් සකස්කිරීම
සෙ/276727 සැරයන් වීරසිංහ කේඒ
සංමුවැ - පනාගොඩ

# ජංගම දුරකතන බැටරි

ජංගම දුරකතනය අද අප කවුරුත් අත සුලභව දැකිය හැකි සන්නිවේදන උපකරණයක් ලෙස දැක්විය හැක. මෙම උපකරණ වල භාවිතා කරන බැටරි සම්බන්ධව කෙටි හැඳින්වීමක් මෙන්ම නිසි ලෙස හා ආරක්ෂාකාරී ලෙස භාවිතා කරන ආකාරය සහ නැවත ආරෝපණය කරන අයුරුද බැටරියේ ආයු කාලය වැඩිකරගන්නා ආකාරය පිළිබඳව යම් වැටහීමක් ලබාදීම මෙම ලිපිය මගින් සාකච්ඡා කෙරේ.



බැටරි වර්ග

| | |
|---|---|
| ලිතියම් අයන් | (Li - on) |
| ලිතියම් පොලිමන් | (Li - poly) |
| නිකල් කැඩ්මියම් | (Nicd) |
| නිකල් මෙටල් හයිඩ්‍රයි | (NiMH) |
| නිකල් සින්ක් | (NiZn) |

ජංගම දුරකතන බැටරියක විභව අන්තරය 3.7 v ලෙස සම්මත අගයක පවතින අතර විවිධ ධාරිතාවයන්ගෙන් යුතු බැටරි වෙළඳපොලෙහි පවතී. මෙම බැටරිය තුල ඇති ඉලෙක්ට්‍රෝනික පරිපථයක් මගින් බැටරිය හා ජංගම දුරකතනය සමග සම්බන්ධ වන අග්‍ර අතර සම්බන්ධතාවය පවතී.

ආරෝපණය

වෙළඳපොලෙන් ඔබ බැටරියක් ලබාගත් පසු එම බැටරිය ජංගම දුරකතනයට ඇතුලු කර ජංගම දුරකතනය මගින් බැටරිය නැවත ආරෝපණය කල යුතු බවට පණිවිඩය ලැබෙන තුරු භාවිතා කර නැවත බැටරිය සම්පූර්ණයෙන්ම ආරෝපණය වන තුරු ආරෝපණය කල යුතුය. තවද මේ සඳහා භාවිතා කරන චාජරය හොඳ තත්වයේ ගුණාත්මක බැවින් ඉහල එකක් විය යුතුය. මෙලෙස සම්පූර්ණයෙන්ම බැටරිය ආරෝපණය කිරීම ප්‍රායෝගිකව අපහසු වුවද මෙම ක්‍රමය මගින් බැටරියේ ආයු කාලය වැඩිකරගත හැකි අතර බැටරි වල ඇතිවන ධාරිතා මතකය (Memory Effect) නමැති දෝෂය ඇතිවීම තරමක් දුරට අඩුකරගත හැක.

බාහිරව ආරෝපණය

නූතනයේ තවත් ජනප්‍රිය ආරෝපණ ක්‍රමයක් ලෙස බාහිරව ආරෝපණය කිරීම දැකිය හැක. වෙළඳපොළෙහි ලබාගැනීමට ඇති මෙම චාජර් භාවිතා කිරීමේදී එම චාජර් වල විභව අන්තරය ලබාදෙන ධාරාව පිළිබඳව සැලකිලිමත් විය යුතුයි.

සැලකිය යුතුයි

ඉහත තොරතුරු පොදුවේ භාවිතා වන ජංගම දුරකතන බැටරි සඳහා දක්වා ඇති අතර නිෂ්පාදකයින් අනුව මෙයට වෙනස් බැටරිද භාවිතයේ පැවතිය හැක.




තොරතුරු

අන්තර්ජාලය හා පොතපත ඇසුරිනි.

සෙ / 281969
සංසෙ පින්නවල පීඑච්අයිඑම් - සංමුවැ

# කැටපත් පවුර

## ආදර මගේ සුදු දෝණිට

මල් පිපි සුවඳ හමන
අරුණෝදයේ
පොත් බෑගය පිටේ දරා
අකුරු කරන්නට පාසැල වෙත යන
මගේ පුංචි දෝණියේ.............

අභිමව ගිය විට
මා පැතූ ඒ මගේ ලෝකය
සියල් සතර ජය ගෙන නුඹ
දිනන්න නුඹ දිරිය ගතින්
මගේ පුංචි දෝණියේ........

රජෙක් වෙයන් හෙට දවසේ
සාමය සමගිය රජයන
පිණිබර මේ ලක් දෙරණේ
සුපිපි මලක් ලෙසින් දුවේ
දිලෙන්න නුඹ සැමදාමත්
තාත්තිගේ හද අරණේ........

සෙ/276749
කෝප්‍රල් ජයසූරිය කේබීආර්එස්
1 ශ්‍රීලංසංබ
පාපුම (මින්)

## Life

Things have gone wrong
But we're as same as it's
Day by day its crossing
Through the life
No one knows
No one realizes
We think that we're in the game
But it's not always
Time has crossed us
And they have defeated us
Even without touching the sense

2/Lt MAD Nuwan kumara
2SLSC

## අපි අපේම විය

හන්තාන කඳු මුදුනින්
එබී බලනා විට වසන්තය
වියලී ගිය මල් විකසිතව
ගොලුවී ගිය මුව කමල දොඩමළුව
සිඳී බිඳී ඉරිතලාගිය
සිත් පොකුණු දෝර ගලමින්
ස්නේහයේ මහ වැසි
සිත්පුරා ඇද හැලෙද්දී
දොරගුලු දැමු සිත් මඩල සිසාරා හැමූ
සෙනේහයේ නොමියන සුවඳින්
ඔබ මගේම විය මා ඔබේම විය

සෙ/2සී00697 සංසෙ පෙරේරා යූඩීආර්
2 (සෙව්)ශ්‍රීලංසංබ

## ස්ථාන මාරුව

හ්ම් ඔයා කවුද....
ආ..... ඔයා නේද අර ROG එක එව්වේ
හරි.. හරි... ලේස්ති වෙන්න
CO ගාවට යන්න
මොනව වේද ? අනේ මන්දා.....
පිස්සුද බය වෙන්න එපා
වැඩේ හරියයි...
කෝ RSM මේ ඉන්නේ
හරි.... කෝ Personal File එක
මේ තියෙන්නේ......
ROG පිරිලා.....
අනේ මේ පාරවත් හරි ගියොත්
බොරු තමයි ලිව්වේ
දැන් යන ක්‍රමේනේ......
අඩු වයසින් Army ආවා
අඩු වයසින් Marry කලා
Problem කෝටියයි......
ROG පිහිට තමයි
අනේ දෙවියනේ මේ පාරවත් හරියන්න.......

සෙ/283751 කෝප්‍රල් සේනක ඩබ්ලිව් ජී
මූලස්ථානය
11 ශ්‍රීලංසංබ - පනාගොඩ

## සාමය

ජාතියේ ධජය තුල
අමෝරන කඩුවේ රග
සාමයේ පරවියා
ඉගිල යන ගුවන් ගැබ
බලන් ඔය නෙත් දෙකට
සුන්දරද මේ මඩල

රුපුන් නැති මේ බිමේ
වෙඩි හඬක් නැසෙන්නට
දිනූ බිම සෙනෙහසින්
සදාකල් රැකගන්න
අත්වැල් බැඳෙමු අපි
එපා යලි වෙන්වන්න
කිසිවෙකුට බැරිවේවි
අභිව වෙන් කරවන්න

සෙ/279017
කෝප්‍රල් ප්‍රියන්ත කුමාර කේපී
5 ශ්‍රීලංසංබ
යුහ කඳවුර
සුතන්තිරපුරම්
පුදුකුඩිඉරිප්පු

## මතකය අමතක කර දමලා

නිල් කඳුවැටි අතරින් නැගෙන
සුදු මීදුම් සළු අතරින්
ඈතට ඉගිලෙන සිත
සොයා යන සුවඳට
පෙම් කරන්න බෑ මට
මල් පෙති ඇහැරෙන උදෑසනින්
පිණි කැට තැවරුණු
රෝස කුසුම් මත
නුඹෙ මතකය ලියා තියා
අරුණැල්ලේ මම සැඟව යන්නද
මතකය අමතක කර දමලා

ආසෙ අබේරත්න ඩීඑම්එස්එල්ආර්

THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2012

## අම්මා

සිහිනය අනන්ත මල්හරි සුවඳ දැනුනා
නුඹේ සුවඳ මට දැනෙන තුරා
කෝකිල නාදය මිහිරිය දැනුනා
කිකිණි නුඹේ හඬ ඇසෙන තුරා
තිස්සෙම හඳ ගැන ලස්සන ලිව්වා
සුන්දර ඔබෙ මුව දකින තුරා
තුන්සිත නුඹටම ලෙන්ගතු වුවා
අම්මේ මා මියෙන තුරා

සෙ/72412
ආසෙ කුමාරතිස්ස ඩීඑම්ජ්

## ආදරණීය ශානිට

නෙතඟ රැඳි සිහිනය
කවදාවත් සැබෑ නොවන වග දැනුනාට
සිතට දැණුනු වේදනාව
මෙතකයි කිව නොහැකි තරම්ය......
ජීවිතය පුරාවට පැතුව
සුන්දරවූ එකම බලාපොරොත්තුව
ඒ සිහිනය තුලම මියගිය වග දැනුනාට
කඳුලත් සිනහවත් සමාන කමක් දැනුනා

නුඹ කවියකි
අම්හිරි පද අහුරක් විමසා
මගේ හිතේ කුරුටු ගෑ සාංකාවට ගැයූ
කවිය නුඹයි.......
නුඹ සිතුවමකි
මනහර දර්ශනයක් විලස
මගේ හිතේ පින්තාරුවී
පාලු සිතට ලංවූ
සිතුවම නුඹයි
නුඹ සිහිනයකි
දයාබර සෙනෙහසක් විලස
මගේ හදේ ශලාගිය
මතක සුවඳේ
සිහිනය නුඹයි (ශානි)

සෙ/283667
සංසෙ වන්නිනායක ඩබ්එම්පීකේ
1 වන සංඥා බලකාය
වට්ටප්පලෙයි - මුලතිව්

## ඉදිරි දැක්ම

තම ජීවිතය හැඟීම් වලට වහල්කර
නොගන්න
බුද්ධිමත්ව සිතන්න
සිතන දේ අනුව ක්‍රියාකරන්න
සැමදා ප්‍රශංසා ලබන්නෙකු විශ්වයේ නැත
අනවශ්‍ය බලාපොරොත්තු ඇතිකර
නොගන්න
අදකල යුතු දේ අදම කරන්න
හෙටට කල් නොදමන්න
දහම් දිතුවිලි සිතමින්
ජීවිතය ඉදිරියට ගෙනයන්න
ධර්මයයි රජයන්නේ ලංකා දීපයේ
ධර්මය රකිමින් ජීවිතය ඉදිරියට ගෙනයනු
අප මිනිසුනේ......

සෙ/280000
ලා/කෝ දසනායක ඩබ්ජීජේඑච්විකේ
1ශ්‍රිලංසංබ
23 සේමු

## අහිම් ආදරය

නැවත එන්නට හිතක් නැහැ මට
නුඹ සොයා යලි කිසිදිනේ
නුඹට ලංවු දිනේ සිට මට
දුකම පමණයි හිමි වුනේ

අහිමි සෙනෙහස දැක දැකම මා
කුමට නුඹ වෙත ලංවුනේ
සදාකල් දුක විඳ දරාගෙන
තනි වුනෙමි මා අද දිනේ

දුකට පෙරලුන මගේ සිත අද
ශදන්නට බැහැ කිසි දිනේ
සතුට වෙනුවට දුකම දී මට
ඇයිද ඔබ මාහැර ගියේ

සෙ/2සී00576
ලා/කෝ ගුණරත්න ඩීඑම

## බලාපොරොත්තුව

හීන් හුලගක් එක්ක එන
දූවිලි පොද
ඇගේ දැවටීගෙනම
ඈතට ඇදී යන්නේ
ඔච්චමට වගේ
වැස්ස වලාහක දෙවියන්
අද වඩිතැයි ...... හෙට වඩිතැයි
නෙත යොමාගෙන උන්නත්
දිනෙන් දිනම
හරිත වර්ණයෙන්
පිරුණු
රූස්ස වෘක්ෂලතා පෙලම
අව පැහැගැන්වීගෙන යන දිහා
බලා ඉන්නට
නෙත් දෙකම අකමැති වුවත්
වැහි බිංදුවෙන් බිංදුව
පහලට ඇවිදින්
තුරුලතාවන්ගේ වෙලෙමින්
මිහිකතට පතිත වන
මොහොත
ඒ තරම් දුරක නොවන වග
නිල් පැහැති ආකාසේ වගේම
ස්ථිරයි

සෙ/284064
සංසෙ අමුණුගම එච්ඒඩබ්එස්ඩිබී
11 ශ්‍රීලංසංබ

## මා තනිකර ගිය අම්මේ

කඳුල දුටුවේ මා නුබෙනුයි අම්මේ
උණුසුම ලැබුවේ මා නුඹෙනුයි අම්මේ
කඳුල ඉතිරි කර මගෙ දෙනෙතේ අම්මේ
ආපසු නොඑන ගමනක් ගියේ ඇයි අම්මේ
මතු ආත්මයකදි වත් මා තනිකර
නොයා ඉඳින් මගේ අම්මේ

සෙ/281078
සංසෙ බංඩාර ඩීආර්ජ්
5 ශ්‍රීලංසංබ
වලෙයි
මුලතිව්

## නූතන විශාඛාවට

සිහින මන්දිර බිඳී විසිරී
කඳුලු බිඳු නෙතු අග තියන්
කුලුඳුලේ මැව් යොවුන් සිහිනය
නුඹත් නොදැනිම හොරා අරන්
හිමල හිර්මල නුඹේ ගැම්කම
සෙයිලමේ උන් බිලි අරන්
කාසි කොළ ලග නුඹ අසරණසි
නැවත එන්නට බැරි තරම්
ගිහි ගහන රළු පරලු නගරය
ඔබව පිළිගන්නෑ තවත්
මං මුලා වූ විශාඛාවනි
දෙර වසනු දැන්වත් ඉකින්

සෙ/279953
ලා/කෝ ලක්මාල් එච්ඒඩී
3 ශ්‍රීලංසංබ

## නුඹ කොහෙද කියන්න

ජීවිතය නොකියා ගිය මට
ජීවිතය දුන්න නුඹ
ආදරය සොයා ගිය නුඹ
ආදරය දුන්න නුඹ
කොහේද කියන්න

ඔබ ලස්සනයි කිසු
මගේ නිල හිවන් යුග
ඔබ තාම සොයමි
මේ මිණි පුර නගරයම පුරා
නුඹ කොහේද කියන්න
මට කියන්න

හිනෙන් වත් නුඹ එනවද
මගේ ලගට
අපේ ආදරෙත් අරන්
සසර සුරා එකට ඉන්න......

සෙ/280000
ලා/කෝ දසනායක ඩබ්ජීජේඑච්කේ
1 ශ්‍රීලංසංබ
23 සේමු - සංඥා බලඝණය

## මගෙන් වරදක් වුවා

නතිගුණ සොයන ගමන්
ආදරය විඳින ගමන්
සෙනෙහස ලබන ගමන්
වෙන තුරුලකට ගිය මා
වරදියි මගේ චූටි නංගියේ

සෙ/281078 සංසෙ බංඩාර ඩීආර්ඒ
5 ශ්‍රීලංසංබ
සුතන්තිරපුරම්
පුදුකුඩිඉරිප්පු

## Life

*Morning is vivacious.......*
*When you*
*Say*
*Good Morning...*

*Noon is pleasurable.....*
*When you*
*Come to mind*
*In unleisured times...*

*Eve is sentimental.....*
*When you*
*Share*
*The happy moments...*

*Night is chromatic....*
*When you*
*Whisper*
*Sweet dreams...*

*Life is perfect.....*
*When you*
*Are safe*
*Between my arms...*

Capt Lakshitha Wijewantha
GSO III
Sig Bde

## නෙතු කඳුලට උපහාරයක්

ලක්බිම කැළඹී ලක්මව හඩන දිනක
දැය සනසන්නට උතුරුකරයට ගිය
ඔබටද උරුම විය නෙතු කඳුළු
දෙපය අහිමි හිසා නොව
නැවතත් දෙපයින් නැගී සිට
පරදවන්නට නොහැකි ත්‍රස්තවාදය
දරුවන්ට දෙමාපියන් අහිමිකල
අපට යෙසායුරන් අහිමිකල
ඒ රුදුරු වචනයට එරෙහිව
රටදැය සමය බේරාගත්
ජාති ආලයෙන් ඔබ්බට හෙලන
උතුම් නෙතු කඳුලක තිබෙන
උපහාරයයි.....

සෙ/283651 සංසෙ ප්‍රේමරත්න
ඒඑස්එස්
9 ශ්‍රීලංසංබ, ඉරණමඩු, කිලිනොච්චිය

## හැරගිය පෙම්වතිය

ඉඩෝරයේ බොල්
සුළගට අසුවී
වියලුනු මගේ සිතට
යලිත් ඔබ
මහා වරුසාවක්වී
ඇදහැලෙන තුරු
මගේ සිත මග බලයි
නමුදු ඔබ
එන්නේ නැති බව
සිත පිළිගැහිමට
අකමැතිය
මගේ සිතේ මහමෙරක්
තරම් තිබූ ආදරයට
හින අහුරක් පමනක්
මා හට ඉතිරිකර
ඔබ යන්න ගිහින්
හැන්දෑවක

සෙ/284411
සංසෙ විජේරත්න ඩබ්එම්සීඑම්
9 ශ්‍රීලංසංබ
ඉරණමඩු
කිලිනොච්චිය

THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2012

## අද මා දුක් විඳින්නේ පුතුණි ඔබේ හෙට දින ලස්සන කරන්නයි

හිතට ගතට දැනුනමුත් අපහසු විඩාවක්
නෙතට නොම උණත් සුවබර නින්දක්
කෙළෙස ගෙවුණ මුත් අපහසු දින ගණනක්
ලැබුණි තාත්තිට සුදු පුතුනේ කෙටි නිවාඩුවක්
දුටිමි ප්‍රතු අනුහස්ගේ පින්බර සිනාවක්
අමතක වුණා තාත්තිට සියලුම විඩාවක්
ගෙවුණයි පුතු ඇසිපිය සළන වේගයෙන්
නිවාඩු දින ගණනක්
අම්මිගෙ තුරුලෙ ඉඳන්
සුදු පුතු හිනාවෙන් දෙන්න තාත්තිට
අවසර පුතුගෙන් නික්මී
ඔබගෙ හෙට දින තනන්නට

කෝප්‍රල් තුසිත කුමාර එස්
7 ශ්‍රීලංසංබ(ආ/බ) - බී කණ්ඩායම
උයියන්කුලම්

## අහිමි සෙනෙහස

මව් සෙනෙහසක ඇති මිහිරිය
මතක නැතිය .....
පිය සෙනෙහසක ඇති සුවඳද
නොවැටහේය .....
මව්ගේ සෙනෙහේ මා හරි හැටි
නොදන්නේය .....
පියකුගේ සෙවණ මා හට නොලැබුනේය .....
මව්ගේ තුරුල කොතරම්
උනුසුම්ද .....
පියකුගේ සෙවණ කොතරම්
සිසිලසක්ද .....
උණුසුම සිසිල පීවය කොතරම්
පුබුදයිදරූ .....
මෙවන් සෙනෙහසක් අහිමිවීමට
මා කල පව කුමක්ද .....
සම්ඳුනි පවසන්න මා කල පව කුමක්ද .....

සෙ/284477
සංසෙ රණතුංග පීආර්ආර්පී

## එදා සහ මෙදා

එදා................
දේශයේ මුර දේවතාවෝ නමින් ලැබුවා සම්මානය
උදාර රණවිරුවන්ට අපගේ උත්තමාචාරයි
තිබුනා බැනර් කටවුට් ගස් ගල්වල මීටර් ගණන් දිගට
සදා අමතක නොකරමු රණවිරුවෝ කීවා මාධ්‍යවේදීහු
තල්ගස් යට බංකර්වල සිට
උත්තමාචාර උලෙළවල් ගම් බිම් පාසා

මෙදා..............
ඒ කුරිරු වු යුධ පිටියට මුර අඩවියට
එනවාය බළන්නට විසිටර්ස්ලා
වනසනවාය මුලු පිටියම බමන මතින්
අඩ නිරුවතින් දමනවාය පාට් ගස්යට
ඔවුන් නොදනිති ඒ ගස්යට තාමත් පොළොව මත
විරුවන්ගේ ලයෙන් පිටවූ රුධිරය ඇති බව

අහෝ විරුවෝ බලා සිටිති ඔවුන්ගේ නාඩගම්
සුව පහසු වාහන වලින් ඉගිල්ලෙන
දුවිලි වල රස බලමින්
ඉතිරි වු හිස් බෝතල් හා පොලිතින් අසල
මහ මග සිටගෙන.....................

සෙ/275891 කෝප්‍රල් සිසිර කුමාර එච්ඩීජේපී
5 ශ්‍රීලංසංබ
සුතන්තිරපුරම්
පුදුකුඩිඉරිප්පු

## දැන් යුධ හමුදාව

යුධ හමුදාවේ දැන් කරදර ගොඩක් ඇත
ඒ හැම දෙයම නිළ ඇඳුමෙන් වසා ඇත
විවේකය යුධ සෙබළාට උරුම නැත
ජීවිතේ ප්‍රබල අවියක් ඔහු සතුව ඇත

යුද්ධය ඇති කලට සලකයි දෙනා සැම
සාමය ඇති කරයි සිත්වල ප්‍රබල කම
දෙවියන් ලෙසින් සළකයි හඳින් පෙම
සාමය ආදාට වෙයි......................... සම

සෙ/279729 ලා/කෝප්‍රල් නෝනිස්
5 ශ්‍රීලංසංබ
සුතන්තිරපුරම්
පුදුකුඩිඉරිප්පු




## තෙවන නිදහස් සැමරුම

තෙවසරක මෙහෙයුමකින්
වර්ෂ 30 ක යුද්ධය නිමා කොට
නවෝදයෙහි හිරු කැන් දක්නට

නිදි නැකි නෙත් සගල
දනන් වෙනුවෙන් විපරමින් සිටිම්
හදවතේ සැම විටම ඔබගේ,
ස්පන්දනය වූසේ නිදහස් රටක සිහිනයයි

සැප සම්පත් අතර,
මරුට එඩිතරව මුහුණදී
රුදු අවියද දැත්, දෙපා මුලු දිවියම දුන් ඔබගේ
මතකය අප සිතුවිලි සදා අනුස්මරන නියයි

සෙ/280003 ලා/කෝ ශ්‍රීවිතානගේ වීඑස්කේ
යන කොනොනියගේ නැගනිය විසින්
9 ශ්‍රිලංසංබ - ඉරණමඩු

## පුතුණි සිතුම්

අපේ ජීවිතය සුන්දර කරනට
අපේ කැදැල්ලට ආ කුරුලු පැටික්කා
ජීවිතයට ජීවය ගෙනදුන්
පුංචි පුතේ මගේ සිතුම්ණ
තාත්තගෙයි අම්මගෙයි උණුසුමේ
ගිලි ජීනලා සැනසුනේ
ආසයි දකින්න පුතුණි මගේ
උගතකු වී අප තුරුලේ
පුංචි පුංචි දගවැඩ කර
හැන්ගෙන්නේ මවගේ තුරුල්ලෙ
පුංචි පුතේ මගේ සිතුම්ණ
නුඹයි අපේ හිරු එළිය මේ ලොවේ

සෙ/280050
ලා/කෝ ජයවර්ධන ජේඩබ්ජීආර්එම්
3 ශ්‍රිලංසංබ

## තල්වැට අද්දර සිට ජයගත් අපේ රණ විරුවෝ

මාවිල් ආරුවෙන් ඇරඹි අපේ තෙද
කොටි බළ බිඳ දමා පැමිණි අප සැම
නමුත් අපගේ ලග සිටි අය
මේ මහ පොලෝ තලය මත

අපගෙන් සමු අරන් ගියත් මේ මහ දෙරණ මත
නොනිමි දැල්වෙන පහණක් මෙනි ඔබ සැම
දෙනගේ රුව
නැගෙනහිරෙන් ඇරඹු අපගේ තෙද බළ පෙන්වා
ජය ගත්තෙමු උතුරු කරේ

මේ ලක් පොලෝ දෙරණ මත
අපගේ උත්සහය මත
සියළු රණවිරුවන්ගේ නාමය ලියවෙයි
සැමදා රන් අකුරින් මේ ලක් මැණියන්ගේ හිස මත

සෙ/280319 ලා/කෝ විජේවර්ධන එම්ජීබීකේ
5 ශ්‍රිලංසංබ
සුතන්තිරපුරම්
පුදුකුඩිඉරිප්පු

## පුදුමාතලෙන්

පුදුමාතලෙන් යුධ නැති බිම මුවාවෙලා
පුදු ඊලමෙන් බොදු වෙනු දුටු සිහින වලා
මාදු ගති නැති කොටි හැංගි මුවාවෙලා
සිහිවුනි බිලිවෙන්න උණ්ඩෙට පපුව පලා

සෙ/282455 සංසෙ සමන් කුමාර කේපීඒ
5 ශ්‍රිලංසංබ
සුතන්තිරපුරම්
පුදුකුඩිඉරිප්පු

## පියඹා එන්න ආසයි යුධ බිමෙන් මට

සුසිනිඳු ඔබේ අතැගිලි පිරිමදින්නට
රන්වන් පැහැති නුඹෙ දෙකොපුල් සිඹින්නට
තුරුලු වෙලා ආදර බස් දොඩන්නට
පියඹා එන්න ආසයි යුධ බිමෙන් මට

සෙ/281251 සංසෙ ප්‍රසන්න කුමාර ජීඑස්
7 ශ්‍රිලංසංබ(ආ/බ) - බී කණ්ඩායම
උයිලන්කුලම

## විරු සොයුර

සොයුර හිරුද පායා එයි
සඳුද පායා එයි
එහෙත් අවිය අත දරා කුසට ආහර
නොමැතිව
දිව රෑ නිදි මරා
මගේ රට යන උතුම් මානික්‍ය රැක ගැනිමට
සොයුර සොයුරියන්
කලකට මතකයෙන් තුරන් කර
රකී පණසේ මගෙ රට
තෙරුවණ් බළ මහිම සියක් දෙව් රැකවරණ
හැම සිතකම ආසිරි මැද
ලක්මව නුඹට භාරයි සොයුර

සෙ/ ආසෙ ගුණසේන පිඑච්ජිසිඞි

## ආදරණීය සුදු දුව

සුදු අරලිය මලක් වගේ පිපිලා හරි ලස්සනයි
නිල් අහසේ පිපී දිලෙන තරු මල් නුඹ ගැන අසයි
සුරංගනා ලොවින් පැමිණි සුරකුමරිය පින්බරයි
සිනහ වෙයන් තිළිණි දුවේ සැමදාටම නුඹ ආදරෙන්

ගතත් ලස්සනයි නුඹෙ සිතත් ලස්සනයි
මනමාලිය වුණුදා නුඹ තවත් ලස්සනයි
පින්බර කුමරෙකු අතිනත ගන්නට සිදුවෙයි
ඒ ගැන නුඹ සිතන්නෙපා පොඩි සිතට රිදෙයි

සෙ/281506 සංසෙ කුසුම්සිරි කේච්චින්
4 රෙජි ශ්‍රිලංසංබ

## සෙබළ සිත

කැළෑ ඇඳුම් ඇඳ සපත්තු දැම්මාට
අවිවේ ඉඳල අතපය කලු වුවාට
හිත් පිත් නොමැති අවියක් අත දැරුවාට
අවංක හදවතක් ඇත යුධ සෙබළාට

අවිය ගන්තට දිරිය දෑතට
සෙබළ සිතටද දුක දැනේ
හමන සුළඟද හිරුගේ රස්නෙද
වලෙයි වැල්ලේ මායින් කොනේ

සෙ/282571 සංසෙ මධුශංක ඊආර්එච්
5 ශ්‍රිලංසංබ
වලෙයි
මුලතිව්

## යුද්ධයයි බර වැඩයි

දෙකම මහ බයක්
යුද්ධය ලේ හලන විට
බර වැඩ දහදිය හෙලනවා
යුද්ධයේදී ගිණි අවි යොදාගන්නවා
බර වැඩ වලදි කැති පොරෝ උදලු ගන්නවා
යුද්ධය හිස් බව බිඳිනවා
බර වැඩ සිත් බිඳිනවා

සෙ/278550 සංසෙ කරුණාතිලක එන්ජිවි
5 ශ්‍රිලංසංබ
සුතන්තිරපුරම්
පුදුකුඩිඉරිප්පු

## පුංචි යෙහෙළිය

ලියන්නට පුංචි කවියක්
නැත සිතේ නිසල බව
පතන්නට පුංචි පැතුමක්
නැත හදේ සතුට බිඳුවකුදු
නමුදු සොයුරිය ඔබයි සදා
මගේ පුංචි යෙහෙළිය
රකිනෙම් මියෙන තුරු මෙමා
අපේ සොඳුරු මිතුදම

සෙ/2044852
ආසෙ මධුශාන් එච්එම්අයි
පුහුණු අංශය - 4 ශ්‍රිලංසංබ

## මගේ ආදර අම්මා

දස මස කුස දරා මා බිහිකල අම්මේ
ලේ කිරි කර පොවා මා දැඩි කල අම්මේ
නිම්මා නැති දුකක් මා වෙනුවෙන් විඳි අම්මේ
ඔබේ පා යුග නමදිම් ආදර සුදු අම්මේ..........

සෙ/279520
ලා/කෝ මහින්ද පීජී
සී කණ්ඩායම - 6 ශ්‍රිලංසංබ(ආ/බ)




## ඉරණම

අවියක් අතින් ගෙන
රණබිමේ ඇවිද යන්නට
පොදි බැඳ ගන්නා වූ දහසක්
බලාපොරොත්තු
නොසිතූ නිමේෂයකින්
බොඳ කරන්නට
පැමිණියේ ඇයි නුඹ
මගේ දිවියට
මේ මා ලද
ඉරණමද රෑ

කෝප්‍රල් මහින්ද ඩබ්
7 ශ්‍රීලංසංබ(ආ/බ) - බී කණ්ඩායම
උයියන්කුලම්

## නොනිමි සෙනෙහස

ඔබ දුටු දා
දැනුන සෙනෙහස
මතකයන්
යලි පනඅරන්
සිතට නොදැනිම
සිතේ කොනකින්
යලිත් ගිණි කඳුළු
පුපුරවන්නේ
වසර ගනනක්
ගෙවී ඇති මුත්
ඔබව නොදැකම
සමුඅරන්
විඩාබර ගත
සිතට නොදැනිම
මහළු වී ඇත
මේ බවෙන්.....

සෙ/281462
සංසෙ කරුණාරත්න
අයිජීඑස්ඩ්කේ
1 ශ්‍රීලංසංබ - නයාරු

## දුම්රිය

අඳුරු පැහැති දුම්රිය
හෙමි හෙමින් ඇවිදින්
සර්පයෙකුසේ
නැවැත්විය වේදිකාවේ
මගේ හිත මත
විහිදුවමින් ගිණිපුපුරු
වේදනාවේ

මා මේ දකින
දුම්රියෙහි දුක්බර දසුන
ඔබත් දුටුවේද ?
දෑස බැඳි පටල
පිසදා බලන්න
දුම්රියක් වැනි අනෝරාවක
පාළු වේදිකාව අබියස
නවත්වා ඇත

දුම්රිය ආපසු ඇදෙන්නට
පටන් ගන්නා විට
කිසිවක් ඔබට ඇසුනේද
දෙසවන් අගුළු හැර
අසන්න ඉන් නැගෙන
වේදනාබර හඬ

ඉඳු දැලක පැටළුන
පැනසර හද විමසයි
දහස්වර මා සිතූ ඔබ
නොවන ඔබගෙන්
දුටුවාද දුම්රිය
වේදිකාව හැර යන

සෙ/284108
සංසෙ ප්‍රනාන්දු එන්ඩ්පී
11 ශ්‍රීලංසංබ
9 ශ්‍රීලංසංබ
ඉරණමඩු කිලිනොච්චිය

## සිතිවිලි

කෑලි කැපිය හැකි ඝණ අඳුරේ
පිණි මිදෙන සිසිලසට
ගිණි අවිය තුරුලු කර
රැපුන් මර උගුල් මැද
බිම දිගේ ඇදී ගොස්
රැපුන් නසමින් එදා - තරණය කළෙමි
මුහමලේ තල් අරඹ - ත්‍රස්ත මුර වැට කඩොලු
නිදහසේ ධජ ලෙලදවා
විරුවෙක් ලෙසින් අභිමන් ලබා
අප දිනූ ඒ මාවතේ
කස පැනින් මත් වෙමින්
අවට සිරි නරඹමින්
බමන ගැටවර කැළද
නැගී ගත් සුව පහසු
ප්‍රාඩෝ බොලෙරෝ මගින්
නැගෙන දුවිලි මතින්
කිලිටි වී ඇත නුඹේ
නිළ ඇඳුම මෙන් ගතද
මග දෙපස රැඳී ගත්
අභීත විරුවාණෙණි
නොකියා සිටියාට නුඹට
සිතෙන්නැති ඇත්තටම
හිස් මොළ නැති අනුවණයින්
භුක්ති විඳින හැටි නිදහස

සෙ/276675
සැරයන් පුෂ්ප කුමාර ජේආර්එන්
සංඥා පුහුණු පාසල
බූවැලිකඩ - මහනුවර

## සෙබළ සිත

ලක්මැණි වෙනුවෙන් පුජා කලත්
මගේ දෙපා යුග
නමුදු මාගේ මුළු හදම පුජා කලේ
නුඹටයි මිහිරියේ
කෙසේ පවසම්ද මා
නුඹට ආදරය බව
නමුදු අසරණයි
දෙපා නැති මම

සෙ/280319
ලා/කෝප්‍රල් විජේවර්ධන එම්ජීබීකේ
5 ශ්‍රීලංසංබ
වලෙයි
මුලතිව්

## අභිමි ආදරය

මගේ ජීවිතය කඳුලක් ලෙසින් තෙත් කලා
පැතුම් මාලිගා සුන්වී බිමට පෙරලුනා
ආදරෙ කියා කිව් ඒ වදන් බොඳවෙලා
ඒ වදන් ඔබේ හද තුල නපුරුවෙලා

යන්නෙ නෑ කියා කිව්වා එදා දිවුරලා
සෙනෙහසින් බැඳි උන්නා ඔබේ ලයට ලංවෙලා
ඒ වදන් ඔබේ හද තුල අද නපුරුවෙලා
ආදරේ කියු ඔබ ඇයි අද වෙනස් වෙලා

නෙලුම් මල් හතක් අරගෙන කැලණියට ගියා
කැලණි වඩීන ඒ මොහොතේ ඔබ මතක් වුනා
ආදරෙ නිසා ඒ දුක් කඳුලු ඉවසුනා
ඔබට සුබ පතා යන්නෙම් ආදරෙයි කියා



සෙ/282863
සංසෙ පුදීප් කුමාර එච්ආර්වීආර්
7 ශ්‍රීලංසංබ(ආ/බ)

## හැරගිය පෙම්වතිය

කඳුලක්ව ඔබ එන්න
හඩන්නට මග බලන වගේ දෙනෙතට
හසරැල්ල ව් නුඹ එන්න
සිනා සෙන්නට අමතකව ගිය දෙතොලගට
සුසුමක්ව නුඹ එන්න
රිදුනු සිත සුවපත් කරන්න
ජීවිතය ගෙන නුඹ එන්න
මගේ ජීවිතය හෙටත් ජීවත් කරන්න
මහ අසනි වරුසාවට මම තෙමෙන්නට
ගං දැල කඩා බිඳ ගසාගෙන මා ගියා
නමුත් නුඹ එපා මා එක්ක ගිලෙන්නට
ඉවක් නැති මහ සයුරේ මා ඔහේ පාවුණා
නමුත් නුඹ එපා මගේ දිවි ගලවන්න
තනිව හඬ හඬා මා සිතිජ ඉම සැඟවුණා
නමුත් නුඹ එපා කිසිදිනක මා නමින් හඬන්නට

සෙ/279253
ලා/කෝ විතාරණ කේඑන්
4 රෙජි ශ්‍රීලංසංබ

## මව්පිය සෙනෙහස

මව්නි ඔබ පෑ සෙනේ
මලක් මෙන් පිවිතුරුයි
පියාණෙනි ඔබේ සවිය
කප්රුකක් සේ වටී
මුතු මැණික් එපා මට
හැමදාම ඔබ අගෙයි
මව්නි පියාණෙනි
ඔබ දෙපල මගෙයි
ඇස් දෙක වගෙයි..........



සෙ/281197
ලා/කෝ තෙන්නකෝන් ඩබ්ටීඑම්එස්එස්
7 ශ්‍රීලංසංබ(ආ/බ)
උයිලන්කුලම්

## දයාබර මිතුර

පුංචිම පුංචි කාලයේ සිට
ඔබත් මමත් එකට පාසල් ගියේ
එකම පේලියේ එකම ලඟ ඉඳගෙන
අකුරු කර නිමාවෙන් පසු

අප දෙදෙනාටම තෝරා ගත් ජීවිතය
සෙබළ ජීවිතයයි
මෙසේ අකුරු කල මා ජීවත්ව සිටියත්
ඔබ නොමැත ජීවතුන් අතර
විටෙක ඔබ සිහියට නැගෙන විට
මට මහත් ආඩම්බරයකි
දයාබර මිය ගියත්
සදා කාලිකම ජීවමානයි ඔබ අප අතර

සෙ/280282 සංසෙ ඒකනායක ඒටීඑස්ආර්ච්
සී කණ්ඩායම
6 ශ්‍රීලංසංබ(ආ/බ)
කෝපායි - යාපනය

## අහිමි සඳ

අඳුරු අහසට සරා සඳ විත්
නීල නෙතු යුග බොඳ කරන්
ආදරෙන් නුඹ දුන්නු දුක ගැන
තියන් මගේ හිත ලග ඉඳන්

සසර මග අතැර යන්නට
නුඹ හිතේ හංගන් ඉදන්
යන්න ගිය හැටි මටත් නොකියම
මගේ පෙම් හිත හිණි තියන්

සෙ/279208
ලා/කෝ ජයසිංහ ජේව්වන්බී
1 ශ්‍රීලංසංබ
23 සේමු සංඥා බලඝණය

## සර්පයා යනු......

වන රොදක් අසලින් ගන්නා වීට
තුවාල සහිතව වේදනාවෙන් ඇදී යන
සර්ප පැටවකු දුටිමි
හිරිකිතය හා භීතිය පසෙක ලා
කරුණාබර සිතින් යුතුව
එම අසරණයා ගෙන ගොස්
ඔසු පැන් ගල්වා සුවපත් කලෙමි
ප්‍රියතම අහර ලබාදී
සුනඛ ආදී සතුන්ගෙන් ආරක්ෂාකර
අසරණයා පෝෂණය කලෙමි
හදිසියේ දිනක ඌ මාගේ පයට පෑගිනි
පෙනය පුම්බා විෂ දළ පෑ
කළ ගුණ නොදත් සර්පයා
වේගයෙන් මා වෙත දෂ්ඨ කලේය
දෙනෙත් අඬවන් වී
ජීවිතය නිමවී
මිහි සයන මත ඇද වැටෙන විට
මා පසක් කර ගතිමි
සර්පයා යනු සර්පයාම මිස
වෙනත් සත්වයකු නොවන බව

සෙ/276675 සැරයන් පුෂ්ප කුමාර ජේආර්එන්
සංඥා පුහුණු පාසල
බූවැලිකඩ - මහනුවර

## චපල සිත

සඳක් මෙන් පායා
යලි නොවෙනස් වන බැවින්
අවංක හදවතින්
මගේ ජීවිතය
ආලෝක කළ නුඹ
මට හිමි වූ
යකඩ පය ගැන සිතා
මා අමතක කර
වෙනත් හදවත්
එළිය කළ නුඹ
මට දුන් ඒ ගින්දර
උහුලගනු කෙසේ

සෙ/283014
සංසෙ සමන් කුමාර එස්එම්පීජීසී
සී කණ්ඩායම - 7 ශ්‍රීලංසංබ(ආ/බ)
උයිලන්කුලම්

## නිමාවූ යුද්ධය

තිස් වසරක යුද්ධය දැන් ගෙවිලා
වෙනවා දැනට තුන් වසරක් විලා
රටට තිබෙන ආදරයක් ගැන සිතලා
තිබුනු යුගය දැන් අමතක කරදමලා
යමු අපි පෙරට රටගැන දැන් වෙහෙසිලා

සෙ/282616
ලා/කෝ විජේසිරි කේඑස්පී
9 ශ්‍රීලංසංබ
ඉරණමඩු
කිලිනොච්චිය

## The Best of Friends

The Best of Friends
can change a frown
in to a smile
when you feel down

The Best of friends
Will understand
You little triuts
And Lend a hand

The best of friends
Will always share
Your Secret dreams
Because they care

The best of friends
Worm more than gold
Give all the love
A heart can hold

**S/284508 SGM Prakash F**
**9 SLSC – Iranamadu,**
**Kilinochchi**

## නැවුම් පැතුම්

ලස්සන දවසක උපදින පැතුම්
පිදෙන සෙනෙහස
වසන් නොකර කිසිදින
පසක් කර දුන් අරුමය
රුවන් ඇති මගෙ නෙත බබළන
ඇස්දෙක මගේ සුරකින
සෙනෙහස ඔබයි
ආදරය මගෙ සදා පුදදෙන

සෙ/281003 සංසෙ සුමුදු පැතුම් එම්ඒ
7 ශ්‍රීලංසංබ(ආ/බ) - මූලස්ථාන කණ්ඩායම
උයිලන්කුලම

## අහිමි ඔබ

සිතිවිලි ලොවේ නිති ඔබෙ රුව දකින්නෙමි
පැතුමන් මිලින බව දැන තැවෙන්නෙමි
නෙතු පිය අසල කඳුලක් ලෙස රැඳෙන්නෙමි
මතු භවයකදී හෝ යලි ඔබ පතන්නෙමි

## දරු සෙනෙහස

දස මස කුස දරා මා පෙව් කිරි බිංදු
ලමැදට හොවා සැනසූ මා බිලිඳු
දෙනෙතින් කඳුලක් වැටෙනා විට මා නොඉවසූ
පුතුගේ සිනා රැල් විය මා  හට සඳ සැනසූ

## අහිමි ආදරය

පෙර භාවයක සිට පැතු ලෙස සංසාරේ
මේ භවයදීම හමු වුවා පෙර වාගේ
බැඳුනා දෙදෙනා පෙර සිටි කිඳුරන් වාගේ

දෙනෙතට දෙනෙත යාවී ආ ගමන් මග
අතරට වුනා මල් හී සර උයන් ගොමු
නොසිතුව විලස ඇස් වැටුණා වෙන හදක
ඇයි ගියේ හැරදා මා මෙලෙස

සෙ/284394 සංසෙ චන්ද්‍රතිලක පීකේබී
4 ශ්‍රීලංසංබ

## බංකරය ඇත හැමදාටම උරුම වෙලා

ලස්සන සිහින සිහිකරමින් වරින් වර
ඉස්සර මම කවි ලීවේ නුබෙ නමට
ගැස්සෙන හදවතින් නුබ දෙස බැලුවාම
දැන් දුක ලියන්නේ සුදූ මම නුබෙ නමට
හදවත කකියනව දුක වැඩි වීලා
දෙනෙත රිදෙනවා නිදිමත වැඩි වීලා
පාලුව දැනෙනවා තනිකම වැඩි වීලා
බංකරය ඇත හැමදා උරුම වෙලා

සෙ/280960 ලා/කෝ ජයකොඩි ජේවීඑන්එස්
7ශ්‍රීලංසංබ(ආ/බ) - මූලස්ථාන කණ්ඩායම
උයිලන්කුලම

## පෙම්වතිය

හමන සුළං මට පවසයි ඔයා ගැන
කුරුළු පැටවි මට පවසයි ඔයා ගැන
ආදරයේ අවංක කම දැනෙයි මට
අපි දෙන්නා ළංවිලා සිටින විට

රෝසමලේ පිපී සුවඳින් පිරි ඉතිරිලා
ඔබෙයි මගෙයි ආදරයේ සුවඳ දැවටිලා
ලස්සන අපේ අනාගතේ හින පුරවලා
සතුටු වුනා මම ඔබ ගැන
සිහිකරලා

මගේ ලෝකෙට ඔයා පැමිණි මුල් දිනයේ
සතුටු වුනා කවදාවත් නොවූ විලසට
හැමදාමත් මා ළග ඔබ ඉන්නවා නේද
මම දන්නවා ඔයා මගෙයි මැරෙන තුරාම

සෙ/2044871
ආසෙ ප්‍රියදර්ශණ බීපීටීබී
පුහුණු අංශය - 4 ශ්‍රීලංසංබ

## පුතු

හිනැහුනු ඔබ - ඔබ පුතු ඉපදුනු දවසේ
හිනැහුනු ඔබ - ඔබ පුතු දෙපයන් හිටගත් දවසේ
හිනැහුනු ඔබ - ඔබ පුතු රණ විරුවෙකු වූ දවසේ
හිනැහුනු ඔබ - ඔබ පුතු රට වෙනුවෙන් දිවිදුන් දවසේ

සෙ/279279  ලා/කෝ  රාජකරුණා  එච්බී
9 ශ්‍රීලංසංබ
ඉරණමඩු
කිලිනොච්චිය

## විරුවාට හිමි තැන

ආබාධිත රණවිරුවා යයි බසයේ - හිටගෙන
පොලිසියට නියත් කරගන්නට වැඩක් - එලවයි පසුපස
ළමයා දැම්මට ගියත් පාසලට - ඉල්ලයි කප්පම
විරුවාට හිමිවෙයි තවමත් - පසු තැවෙන්නට

සෙ/281563 සංසෙ අරවින්ද යුකේඩී
5 ශ්‍රීලංසංබ
සුතන්තිරපුරම්
පුදුකුඩිඉරිප්පු

## සෙබළ සොයුර

අශ්ධ ලෝක ධර්මය වනසන්න එපා
දශ්ධ කරන නයෙකුට අතදෙන්න එපා
ඉශ්ධ නොවන දේකට හිත දෙන්න එපා
දුශ්ධ අය සමග උැසුරට යන්න එපා

## තනිවූ මා

පාව තනිකම සිත රජ කරන විට
මසිතට එන්නේ නුඹ ගැනමයි එවිට
සිතිවිලි කෙරෙහි සිත දුක් විඳින විට
නුඹ මට ගව් ගණන් ඈතින් එපිට

දින සති මාස පෙරුම් පිරුවත් නිබඳ
නෙතට නුදුටු දසුනක් නුඹවයි සබඳ
එනමුදු සැමදා නෙත විමසන්නේ නුඹද
නුඹ දැනගන්නේ තවදා කොහිදැයි කිමද

## අහිමි ඔබ

සිතිවිලි ලොවේ නිති ඔබේ රුව දකින්නෙමි
පැතුමන් මිලින බව දැන තැවෙන්නෙමි
නෙතු පිය අසල කඳුලක් ලෙස රැදෙන්නෙමි
මතු භවයකදී හෝ යලි ඔබ පතන්නෙමි

## සෙළඹ සිතවිලි

යුද්ධය බිහිසුණුය කුරිරුය බියකරුය
අප දුක් විඳින්නේ අප රට රැකුමටය
මතකෙට නැගෙන විට ගමරට ගැන දුකය
සිනාසෙන්නේ ඔබේ ඇමතුම ලද විටය

ආලය ආදරය අපහට නොවෙද සැපා
සිත සැනසෙන්න සහයෝගය නොදෙනු එපා
අසරණ වුවත් ඔහු හැරදා යන්න එපා
සොයුරිය සෙබළ සිත් නම් රිදවන්න එපා

සෙ/277346 කෝප්‍රල් සමන් කුමාර ඒසී
4 රෙජී ශ්‍රීලංසංබ

## අහිමි පෙම

අවිහිංසක පුරා සඳට
තරුවක් වී ඉන්න
සඳ එළියට සඳ සිසිලට
නැලවී හැඩ බැලුව
මුවැත්තියක් වගෙ බියෙන්
කඳුලැලි නෙත පිරුණ හැටි
පුදුමයි ලොවට හොරෙන්
සිත ලග දග කෙරුව
දගකාරයි නුඹේ හිනහව
සිත පාලුව මැකුව
දයාබරයි ලෙංගතුකම
හොරෙන් හොරෙන් පෑව
ලොවට හොරෙන් නුඹේ ලගට
එන්නට මග බලන
දඩබ්බරයි සිත තාමත්
නුඹ ලග දගකරන
සුවඳ මලක සුවඳ වෙලා
මද සුලගේ එන්න
පුර පෝයට සඳ බලන්න
නුඹ හනිකට එන්න
සංසාරේ පුරාවටම
ලෙංගතු වී ඉන්න
දුරක අරන් යන්න එපා
සෙනෙහස මට දුන්න

සෙ/278502
කෝප්‍රල් මඩවල බීඩබ්එස්පී
3 ශ්‍රීලංසංබ

## ගිණි අවිය

හිරු බැස යන වෙලාවක
ගිණි අවිය ළය මත තුරුලු කරන්
ප්‍රාර්ථනා දහසක් පැතුවත්
ඒ ප්‍රාර්ථනා කොයි මොහොතේ
විනාශ වෙලා යයිද කියා
දන්නේ අවියෙන් පිටවන උණ්ඩය පමණි

සෙ/281957
සංසෙ රුවන් දිනේෂ් එම්ඩබ්
7 ශ්‍රීලංසංබ(ආ/බ) - සී කණ්ඩායම
උයිලන්කුලම

## පාරමී දම්

සත් සියක් කල් පුරා
සසර මග සැරි සරා
සොයා ආවෙමි මෙමා
නුඹෙ උවන මට උරුම
කප් සියක් පිරූ පින්
අහඹු එක් නිමේෂයක
පල දෙමින් මා වෙතට
මුණ ගැසුනු දා නුඹව
දිනූවෙමි මා ලොවම
ඇත්තෙන්ම සිතුනි මට
එලෙස පාරමී දම්
පුරා ලත් නුඹ තවත්
හමු උනත් - හිමි නොවී
මගෙම නොමවී ගියෙන්
මුලු මහත් විශ්වයම
පතිත වී හිස මතට
විසුනුවිය මගෙ පැතුම්
එහෙත් ඉන් නොනැවතී
යා යුතුය බොහෝ දුර
සසර මග ඉදිරියට
නුඹ මගෙම වන දිනක්
කෙදින හෝ එන තුරුම

සෙ/276675
සැරයන් පුෂ්ප කුමාර ජේආර්එන්
සංඥා පුහුණු පාසල
බූවැලිකඩ - මහනුවර

## පින් පව්

නිති බුදුන් නමදිමින්
බණ පිරිත් අසමින්
භාවනා වඩමින්
එකතු කරයි පිං...
නිති මුසාවාදය බිඳිමින්
අනුන්ගේ වැරදි දකිමින්
දොස් පරොස් නගමින්
එකතු කරයි පව්...

සෙ/282623
ලා/කෝ පද්මකුමාර පීටීඩබ්
9 ශ්‍රීලංසංබ
ඉරණමඩු
කිලිනොච්චිය

## සසර සැරිසැන තෙක් මා නුඹට ණයගැතියි

බාලොලියා මලක් කියා
සෙනහස ලැබුවා මව් තුරුලට වී
ළමාවිය ඉක්මවු පසු පිය නැගුවා තුරුණු වියට
ඉඳහිට නුඹ නෙත ගැටුනත්
මා සිතුවේ නැත කිසි දින
නුඹ සමග හාද වෙන්නට
මෙලෙස පන්හිඳ අවදි කලත්
නුඹ ගැන ලියන්නට
වදන් නෑ මට නෑ නුඹේ අගය
පහදා දෙන්නට
වියපත්වී යන විට දවසින් දවස මා දිවියට
සිටියේ නෑ කවුරුත්
අත්වැල් බැඳ ගන්නට නුඹ හැර
හුදකලා දිවියට නුඹ පමණයි සිටියේ
මගේ සරනට
අවසන් සුසුම මා දිවියෙන් සමුගත්තට
සිතුවේ නෑ නුඹ දමා
වෙන්ව යන්නට
සසර සැරිසරන තෙක්ම මා නුඹට ණය ගැතියි
සත්තකින්ම  දයාබර සැරයටිය නුඹට මා
සදා ණය ගැතියි මා නුඹට

සෙ/277342
සැරයන් කරුණාසිරි එල්එම්ඒ
4 රෙජි ශ්‍රීලංසංබ

## යතුරු ලියන සුකුමාලිය

උඩට පහතට තර කර තනතුරකට
ටොකුකමින් නුඹ
ප්‍රතිපත්ති එළියට ගෙනෙන
නුඹයි මිනි පහන කාර්‍යාලයට
සමාවෙයන් මට ටොකු කන සුකුමාලිය
එසේ නොකලොත් ආයතන දියුණුව අතර මග
නුඹ නොදනියි ඔබයි මගේ ආයුධය
යතුරු ලියන සුකුමාලියේ
ණයගැතියි මම සදාකල් නුඹට
නුඹ නිසයි රැකෙනුයේ අද මගේ දරු පවුල
කරමි උපහාර වැඳ නමස්කාර

සෙ/275423 බනි 11  ඒකනායක එන්පී
4 රෙජි ශ්‍රීලංසංබ

## මහ පොළොව මත හිඳ

ගිජුලිහිණියනි,
පියාසර කලත් නිදහසේ නිල් ගුවන් ගැබ සිසාරා
සුන්දර යැයි ඔබ සිතන ඔය අහස
විෂ දූලි වලාවන්ගෙන් පිරී ඇත
නුබට පෙනෙන්නේ නොමැති උනාට......

කටු පඳුරු, වන ලැහැබ්, ගල්තලා වලින් පිරිහිය
මේ කාෂ්ඨක පොළොව මතින් දිව යමි මා
මිරිවැඩි සගලක් වත් නොමැතිව
යටි පතුල් වලින් ලේ ධාරා පනින තුරු
වැටී වැටී දිව යමි
දිව අගට දැනේවි කටුක බවේ තිත්ත රසය
නමුත් ඔබ හිස් අහසේ පාවේවි
ඈතට ඈතට යමි විසිතුරු ලොවක් බලාවි
පිපාසයට දිය පොදක්වත් නොමැතිව
අරමුණක් නොමැතිව........

තුති පුදමි මා පියාපත් නුදුන්නාට
විෂ දූලි මතින් පියාඹන්නට
කෙතරම් කටුක වුවත් සුන්දරයි මහ පොළොව
වැටි වැටී දිව යන්නට කෙදිනක හෝ
මගේ අරමුණ කරා..................

සෙ/275891 කෝප්‍රල් සිසිර කුමාර එච්ඩීජේපී
5 ශ්‍රීලංසංබ
සුතන්තිරපුරම්
පුදුකුඩිඉරිප්පු

## යුධ හමුදා සේවය

ජාතිය ආගම කුලය ගැන නැත බෙදීම
පොහොසත් දුප්පත් කිසිවෙක් ගැන නොසිතාම
අසරණ සරණ කොයි කාටත් පිහිටට අත දීම
කරනෙමි සේවය රට වෙනුවෙන් අපි හැමදාම

සෙ/276956 ලා/කෝ සේනාරත්න ඩීඒයූ
5 ශ්‍රීලංසංබ
වලෙයි
මුලතිව්

THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2012

## ආදරණීය පියාණනි

මා මෙලොවට බිහිවු දා සිට සෙවනැල්ලක් මෙන් නුඹ මාගේ..............
දහසක් පැතුම් හිත තුල පොදි බැඳ ගෙන
දුක් වින්දා නුඹ අපමන................
හිරුගේ එලිය සේ මගේ ලෝකෙට
ආලෝකය ගෙන ආවේ නුඹයි මට
වෙන්ව සිටියත් දුර ඈතක මෙලෙස
ගිණි අව් අත දරණ සෙබළකු ලෙසින
පිය තුමණි....................
නුඹගේ ආශිර්වාදයම ඇතිමට............................

සෙ/283257 සංසෙ සමන්සිරි කේපීඩී
ඒ කණ්ඩායම
6 ශ්‍රීලංසංබ(ආ/බ)

## නිවන් දකින අම්මා

දස මාසේ කුසේ හොවා නෙක දුක් විඳි අම්මේ
ඇස වාගේ මා රැකලා මා බිහිකල අම්මේ
රස වාගේ නැත රසයක් දෙතනෙන් ඉරු අම්මේ
හිස මාගේ නමා වඳිම් ආදර මගෙ අම්මේ

අතට වෙරලු ඇහිඳ ගෙනත් දුන් අම්මා නුඹදෝ
ඉනට පලා නෙලා ගෙනත් දුන් අම්මා නුඹදෝ
කනට මිහිරි නැළවිලි ගි ගඟුලක් ගැලුවා වාදෝ
මෙමට ලොවේ පිළිසරණය මගෙ අම්මා නොවෙදෝ

වැලි පිල්ලෙන් ආ යන්නට අත හුරු කල අම්මේ
සුලැගිල්ලෙන් මා අල්ලා අකුරට ගිය අම්මේ
නැලවිල්ලෙන් ගී සිපද කනට මිමිණු අම්මේ
සැනසිල්ලෙන් දිවි ගෙවන්න පැතුම් මගෙන් අම්මේ

රෑ පුරාම නිදි වැරුවා ඔබේ දෙනෙත් සත්තයි
දිවි පුරාම දුක් වින්දා දරු සෙනෙහෙන් සත්තයි
බැරි උනාම අසරණ වී ඔබ ලග මා සත්තයි
මගෙ අම්මා මේ භවයෙම නිවන් දකිනු සත්තයි

සෙ/280337
ලා/කෝප්‍රල් නිස්සංක එන්ව්වන්
5 ශ්‍රීලංසංබ
සුතන්තිරපුරම්
පුදුකුඩිඉරිප්පු

## හුදකලා විරාමයක්.....

රුදුරු කතරක විඩාබරිතව
පිපාසිතව පියාසලන කිරිල්ලකගේ
උණුසුම් වූ පියාපත්,

චණ්ඩ මාරුතයකට මැදිව පියමංකල
වලා පියසින් ගලා හැලුනා
පිණිකැටවලින් තෙතබරිතව එක්තැන්ව
අතුපතරට වී හුදකලාව බලා සිටින්නේ

වලාරොද පාවී ගිය කල
පාලු කතරට පිණිපොදක් එක්වන්නේ
කෙසේදැයි කියා සුසුම් ලම්නි.....

සෙ/278634 කෝප්‍රල් ජයකොඩි ජේඑම්ව්එස්කේ
5 ශ්‍රීලංසංබ
සුතන්තිරපුරම්
පුදුකුඩිඉරිප්පු

## සෙබළ පෙම්වතා

සසල මුහුදු තීරයේ
නිසල සිතුවිලි කැටිව
පෑන වෙනුවට ගිණි අවිය
අතදරා සිටියි නුඹ.ඤවගග

හදවතින් දිරියෙන්
ඔබේ ආදරය වෙනුවෙන්
කිසිදාක හැරදමා
නොයමි මම සත්තකින්.ඤවගග

එදින පැමිණෙන තෙක්
මඟ බලා සිටිමි මම
ඔබේ රුව දැක ගන්න
ආදරණීය විරුවණි.ඤවගග

සෙ/282698
සංසෙ උදය කුමාර ඒජේඑම්'එන්
7ශ්‍රීලංසංබ(ආ/බ)
උයිලන්කුලම

THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2012

## සොඳුරු අත්දැකීම්

බිහිසුණු ක්‍රියාකාරකම්
නව අද්දැකීම් කායික මෙන්ම මානසික
ශක්තියෙන් කෙදිනකවත්
සියල්ලන් හට එක් වීමට නොහැකි නමුත්
එම මොහොතට එකතු වන
ඒ සොඳුරු වූත්
වෙහෙසකර වූත් ඒ මොහොත මන්ද
එය බළඇණි පුහුණු පාඨමාලාවයි.

සෙ/283014 සංසෙ කුමාර එස්එම්පීපීපී
7 ශ්‍රීලංසංබ(ආ/බ) - සී කණ්ඩායම
උයිලන්කුලම්

## A Mirior Bird

I have wished a bird would fly away
And not sing by my house all day
Have clapped my hands at him from the door
When it Seemed as if I could been no more
The fruit must party have been me
The bird was not to blame for him key
And of cause there must be something wrong
Im waiting to silnce any song

S/284508 SGM Prakash F
9SLSC – Iranamadu, Kilinochchi

## ආදර අම්මා

දහසක් දුක් වේදනාවන් විඳ මා මෙලොවට
බිහිකල මගේ අම්මා
විඳින වේදනාවන් හිතේ හංගා අපට
සැනසුම දුන් අම්මා
පාසැල් යවලා මා හොඳ කෙනෙකුන් කර
මෙලොව එළිය පෙන්වූ අම්මා
මම ලොකුවී අද කාසි සොයනවා
අම්මට දුක දෙන්නෑ අම්මේ

සෙ/2044879
ආසෙ කරුණාරත්න ඊඑම්ඩීසිආර්
පුහුණු අංශය - 4 ශ්‍රීලංසංබ

## කඳුලු කපොලු

හැම තැනකම කොටු කරගත්ත - අඳුරු පාට බිත්ති කොනේ
ඇයි අම්මේ බලන් ඉන්නේ - ගොම්මනට ඇස් දියකර......
බුදුන් ලගම දනින් වැටී - දෑත් විදා හිමි සඳුදෙස
මොනවද ඉල්ලුවේ අම්මේ - කඳුලු බිංදු නෙතේ දරා........
හිම්දිරියත් මුලු දවසත් - පාලු කාමරේ හිරවී
මහ හයියෙන් සුසුම්ලමින් - මොනවද ඔය හිත ගෙවෙන තුරා
නුඹ හිතුවේ අම්මේ..........
අපි විතරක් නොවෙයි අම්මේ - ඔබේ සෙනෙහෙත් තනිකරලා
වසර තුනක් ගෙවී ගියත් - ආයෙත් එව්ද අම්මේ
අපේ ආදර තාත්තා......................

සෙ/283751
කෝප්‍රල් සේනක ඩබ්ලිව් ජී
මූලස්ථානය 11 ශ්‍රීලංසංබ - පනාගොඩ

## සැලෙනා සිත

මලක් සේ නැත මෙලෙක් වී සිත
ගලක් තරමට දැඩිවෙලා
තුවක්කුව ගත් රුවැත්තියකට
කවක් සෙනෙහෙන් ලියැවීලා

නිමක් දැන්මට පෙමක් තිබුනට
කමක් නෑ සුදු නංගියේ
ගමක් ගෙදරත් එපා මතකෙට
ඉමක් නොපෙනෙන යුද බිමේ

නිවන් දැකුමට නුවන් පීන්මද
රුවන් වන් මිහි මුතු ලදේ
උපන් නූපන් පුතුන් වෙනුවෙන්
රුපුන් වනසමු නිපබිමේ

## මගේ පැතුම

බෙලි කපන
කේලම් කියන
අංචි අදින
අනුන්ට ඊර්ෂ්‍යා කරන
සියලු දෙනාහට යහපතක් වේවා
ඔවුන්ට යහපත් සිතුවිලි ඇතිවේවා

සෙ/276965 කෝප්‍රල් කුමාරසිංහ කේඑම්ජී
රෙජිමූලය - 5 ශ්‍රීලංසංබ
සුතන්තිරපුරම් - පුදුකුඩිඉරිප්පු

THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2012

## ආදර බිරිඳ

මවත් නොමැකි මගේ
අඳුරු ජීවිත මගට
පෑයු හිරු ෂඳු ඔබයි
ආදර මුතු........

දුක සතුට දෙක ලගම
මගෙ ලඟ හිඳිමින්
වැරදි මග ගිය මගේ ජීවිතය
නිවැරදි මගට ගෙනාවේ ඔබයි
ආදර මුතු..........

යුධ සෙබලෙකු ලෙස
දින තුන්සිය හැට පහම
ඔබ ලඟ සිටිය නොහැකි වුත්
සිතින් හැම මොහොතකම
ඔබ ලගයි මගේ සිත
ආදර මුතු.......

සෙ/278436
ලා/කෝ සේනාධීර එස්පීසීපී
1 ශ්‍රීලංසංබ
පාපුම(මින්)

## මගෙන් වරදක් වුවා

| | |
|---|---|
| යුහ සහ සිර කියන දෙක කඳවුරු | වුනාට |
| වෙනසක් තිබේ පැහැදිලිවම | දකින්නට |
| සිර කඳවුර හොඳයි කෙනෙකුට | වසන්නට |
| යුහ කඳවුරයි හොඳ ගතිගුණ | වඩින්නට |
| ඇතමුන් සිටියි යුහ කඳවුරේ කල් | ගෙවලා |
| අද වන් දිනේ සිර කඳවුරේ | ගාල්වෙලා |
| ඒ අය නිසා රණවිරු නම කැලැල් | වෙලා |
| කොහොමද හදන්නේ නිල් | දමලා |
| මේ ගැන සිතා දුන් ඔවදන සිතට | අරන් |
| ජීවය කියන හමුදාවේ විනය | රැකන් |
| යහපත් කෙනෙක් වන්නට ඔබ දිරිය | අරන් |
| හිටපන් මිතුර යුහ කඳවුරේ නාමේ | රැකන් |

සෙ/281927 සංසෙ ජයසේකර ඩබ්එම්
5 ශ්‍රීලංසංබ
වලෙයි
මුලතිව්

## ආදරණීය දුවේ නුඹයි

නුඹේ කිරි සිනා ලඟ
මගේ සිත නැවතුනත්
සුරතල් තෙපුල් ලඟ
නිබඳව රැදෙන්නට
මගේ සිත බල කලත්
යා යුතුව ඇත දුවේ.....

ඒ මහා මෙහෙවරට
නුඹ සේම තවත් සහසත්
මල් කැකුල් වෙත
නිදහස්ව නිවහල්ව
පිපෙන්නට සරු බිමක්
තනා දෙන්නට
හෙට දිනක එන තුරා
නුඹ පියා මඟ බලා නිදනු මැන
අද සේම සිනාසී........

සෙ/276925
සැරයන් රූපසිංහ එස්ආර්කේ
1ශ්‍රීලංසංබ
පාපුම(මින්)

## මගේ පෙමට මල් වඩමක්ද

අහසේ සඳ නොමැති රැයක
සීත සුළඟ ඇගේ හැපෙන
තරු පුපුරා බිමට වැටෙන
නිදි නැති යාමේ

ඔබේ ශෝක සුසුම් ඇවිත්
මගේ හදේ ලැගුම් අරන්
මගේ පෙමට මල් වඩමක්
නොවෙද ගෙනාවේ

සිහින පවා සොඳුරු නොවන
උමතු වෙලාවේ
මගේ ආදරේ සොරු ගෙන
යන්න ගියානේ

## බලා හිඳුනු මැන

දින ගනන් සති මාස ගතවී
සොඳුරු දිනයක් එළඹෙනා
යෞවනේ අපි සිනහ දුටු ඒ
පෙම් වසන්තයට ලං වෙන්න
දකින්නට ඔබ මග බලන් සිටි
සඳ කුමරිය සේ පේ වෙලා
හනික එනතුරු බලා හිඳිනු මැන
ඉතිරි වසර හතරත් හිනැහිලා....

සෙ/276979 සැරයන් කුමාරසිංහ ටීඑම්පී
5 ශ්‍රීලංසංබ
සුතන්තිරපුරම්
පුදුකුඩිඉරිප්පු




## සෙනෙහෙබර අම්මා

කුළුඳුල් දිවි පෙවෙත හිමවෙලා අද
රණබිම වෙනුවෙන් දිවි ගෙවනවා අද
මව්බිම සෙනෙහෙබර අම්මා වැනිය අද
ඔබ ළග නැති නිසා පාළුව තනිකම දැනෙනවා අද

කටුක දුක් ගැහැට උහුලා ගෙන ඉන්නේ
එනමුදු ඔබ ගැන සිත ලත වෙන්නේ
වරක්වත් ඔබ දැකුමෙන් සිත සැනසෙන්නේ
ඔබ දුන් දිවිය මව්බිම වෙනුවෙන් ගෙවෙන්නේ

දහස් වරක් සමාව අයදිම් අම්මේ
මව්බිම වෙනුවෙනුයි මම ඉපදුනේ අම්මේ
ඔබ පෙවු කිරි නිසයි මා අද මෙහි අම්මේ
ඔබ පෙවු කිරිවලට සමාව අයදිම් අම්මේ

තනිවන විටදි අම්මේ ඔබ සිහිවෙනවා
කුමක් කරන්නද මා සිත ලතවෙනවා
ඔබ ගැන සිත සිතා මා සිත සැනසෙනවා
සිහිනෙන් ඇවිත් ඔබ තුරුලෙහි සැනසෙනවා

## අපේ අම්මා

පිලිසිඳ ගත් දා සිට මා කුසට
සෙනෙහස පිදුවා ලේ කිරිවන්නට
දස මසක් කුසේ හොවාගෙන
බිහි කෙරුවා ලොවට
දායාදයක් ලෙසින්......

දැස් නොඇර කිරි සුවඳ ලං විලා
කිරි උරනා පුංචි ළදරුවක් දැක
එන්නට සිතුනා ඔබගේ තුරුලට
කිරි සුවඳ මලිත්තට
ඒත් ඔබ මා තුරුලු කර ගනියි
මගේ රත්තරන් පුතා කියා
ඔබගේ සෙනෙහස හදවතට දැනී
කඳුලක් වැටුනා නෙතගින්
මා තරුනෙක් වු දුකට

සෙ/278635
කෝප්‍රල් වරලේකුඹුර කේජේසිඩබ්එස්බී
1 ශ්‍රීලංසංබ - නයාරු

## බලා හිඳිම්... එනතුරු ඔබ...

ගිම්හානය එපා යන්න
වසන්තෙට කලින්...
තුරු වදුලේ මල් සිඹින්න
කොයිද සමනලුන්...
දේදුන්නෙන් පාට ගන්න
පෙළ සදයි කුසුම්...
සසර පුරා ළග හිඳින්න
ආදරේ නම්න්...

සුසුම් වලට අඬගහන්න
හදවතේ කොනින්...
කඳුළු වලට තිත තියන්න
සිනාසෙනු නෙතින්...
අනන්තයට පියමනින්න
දෑත් පටලමින්...
බලා හිඳිම් එනතුරු ඔබ
කඳුළු දුන් නෙතින්...

තනි තරුවෙන් දුක අහන්න
සඳුත් නෑ ලඟින්...
මා වෙනුවෙන් ගී ගයන්න
සියොත් කැල ඉතින්...
ඔබ වෙනුවෙන් දිවි ගෙවන්න
උණුහුමෙන් පෙමින්...
මගේ ලොවට ඔබ වඩින්නෙ
කෙදිනදෝ කියන්...

සෙ/2041287 සාසෙ චතුරිකා පීඑම්එච්
තොරතුරු තාක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය

## I WILL BE WAITING FOR YOU

IN EVERYTHING I DID YOU WERE WITH ME.
BUT NOW I LOST U,
I FEEL LONELY YOU ARE MY EVRYTHING
DON'T HURT ME
I LOVE U SO....... MUCH
FOR EVERY MINUTE I LIVE I 'LL BE WAITING FOR U......

O/68252 LT HMBM HERATH
SLSC

# උපන්දින සුභ පැතුම්

## Happy Birth Day...



2012.07.04 දින ජීවන මගෙහි 01 වැනි වියට පා තැබූ චෙනුල් දිත්සර බණ්ඩාර හේරත් සිගිති පුතුට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා කපිතන් රන්කොටිගේ සහ අප්පච්චි මේජර් හේරත්





2012.04.24 දින වසර 2 ක් සපිරුන සදෙව්මි හිම්සරා සත්සරණී දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා



2012.03.08 දින 2 වන උපන් දිනය සමරන යුත්මික ඉන්සිළු රාජපක්ෂ ආදරණීය පුතුට වාසනාවන්ත උපන් දිනයක්



2012.10.29 දින 10 වන මසට පා තබන නෙත්මිණි සුධම්සා සුදු දුවට සුභ උපන් දිනයක් වේවායි ආසිරි පත්න්නේ අම්මා අප්පච්චි



2012.11.20 දින 04 වැනි වියට පා තැබූ මෙතුමියා මින්හාරා බණ්ඩාර හේරත් දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා කපිතන් රන්කොටිගේ සහ අප්පච්චි මේජර් හේරත්



2012.10.10 දින 05 වැනි උපන් දිනය සමරන පියුමි ක්‍රිස්ටිකා බන්ගම දියණියට සුභ උපන් දිනයක් වේවා



2012.09.13 දිනට වසරක් සපිරෙන ගිත්ම නිල්නෙතුම් රත්නායක ආදරණීය පුතුට සුභ උපන් දිනයක් වේවා



2012.07.27 දිනට පළමු වියට පා තබන ඒ. ඒ. විත්සඳ කලාත්ම සිගිති පුතුට සුභ උපන් දිනයක් වේවා



2012.03.03 දිනට 2 වන වියට පා තබන ඕනුක ඉසුරු බණ්ඩාර පුතුට සුභ උපන් දිනයක් වේවා






2012.12.31 දින 04 වන උපන්දිනය සමරන වර්ෂා ඕෂදි අමරසිංහ දියණියට සුභ උපන් දිනයක් වේවා



2012 අප්‍රේල් මස 14 දින 06 වන උපන් දිනය සමරන බිහිංගා නවෝදනි දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා තාත්තා ඇතුළු පවුලේ සැම



2012.04.06 දින 05 වන උපන්දිනය සමරන චතුර ආසිරි ධනංජය පුතණුවන්ට සුභ උපන් දිනයක් වේවා





2012.07.12 දින 5 වන උපන් දිනය සමරණ ඉශාදි අරුණිකා ධනපාල යන චුටි දුවට සුභ උපන් දිනයකට ආසිරි



2012.06.22 දින 2 වන උපන් දිනය සමරන අසංසය විහඟ කවිෂ්ක රඹුක්වැල්ල පුතුට සුභම සුභ උපන් දිනයක්



2012.06.24 දින 03 වන උපන්දිනය සමරන දුලක්ෂි නිල්මිණි අබේකෝන් දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ අම්මා තාත්තා

2012.07.12 දියට 7 වැනි උපන් දිනය සමරන කිතුණු මලිත් කුරේ පුතුට සුභ උපන් දිනයක් වේවා







2012 12 06 දින 11 වියට පාතබන කිතුණිකා උපේක්ෂි බන්ගම දියණියට සුභ උපන් දිනයකට ආසිරි

2012.10.03 වන දින 2 වන උපන් දිනය සැමරන දසිඳු සන්දීර දිසානායක පුතුට සුභම සුභ උපන් දිනයක් වේවා



2012.02.03 වන දින 8 වන උපන් දිනය සැමරූ ස්වේතා මෙලනි මාපා සිගිති දියණියට සුභ උපන් දිනයක් වේවා

2002.04.30 දින 10 වන උපන් දිනය සමරන කෞශල්‍යා එශානි බණ්ඩාර සුභ උපන් දිනයක් වේවා



2012.06.13 දින 2 වන උපන් දිනය සැමරූ ඉමේක සසිඳු නිම්හර වතුලියද්ද යන චුටි පුතුට සුභ උපන් දිනයක් වේවා



2012.10.29 දින 10 වන වියට පා තබන නෙත්මිණි සුධම්කා දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ අප්පච්චි සහ අම්මා



2012.04.12 දින 4 වන උපන් දිනය සමරන අයෙෂ්මා දෙව්මිණි ගුණරත්න දියණියට සුභ උපන් දිනයකට ආසිරි



2012.09.17 වන දින 7 වන වියට පා තබන මලීෂ ගිම්හාන් ජයවර්ධන ආදරණීය පුතුට වාසනාවන්ත සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා



2012.10.27 දින 1 වන උපන් දිනය සමරන තිසරංග දිලුම් බණ්ඩාර පුතණුවන්ට සුභ උපන් දිනයක් වේවා



2012.07.27 දිනට 10 වන වියට පා තබන ඉෂානි අප්සරා දියණියට සහ 2012.07.25 වන දින 5 වන වියට පා තබන රවීෂ ඉඳුවර සිගිති පුතුට සුභ උපන් දිනයක් වේවා



2012.06.25 වන දින 2 වන වියට පා තබන මල්ෂිකා නෙත්සරණි කවිරන්ද සිල්වා ආදරණීය දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා



2012.09.12 දිනට 2 වන වියට පා තබන එච් ඩී ඉමාෂී ජනිත්‍යා සිගිති දියණියට සුභ උපන් දිනයක් වේවා



2012.09.16 දින 3 වන උපන් දිනය සමරන නුසර දිනෙත් පුතණුවන්ට සුභ උපන් දිනයක් වේවා



2012.09.07 දින 6 වන වියට පා තැබූ මෞලි ප්‍රාර්ථනා ජයරත්න දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ අප්පච්චි සහ අම්මා



2012.06.24 දින 2 වන උපන් දිනය සමරන සිත්මි නුවන්දරා ආදරණීය දියණියට වාසනාවන්ත උපන් දිනයකට ආසිරි



2012.06.13 දින 5 වන උපන් දිනය සමරන ගයාෂා ශසිනි රාජපක්ෂ ආදරණීය දියණියට සුභ උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා

2012.02.01 දින 8 වන උපන් දිනය සමරන කසුන් කෞෂල්‍ය ආදරණීය පුතුට වාසනාවන්ත උපන් දිනයකට ආසිරි පතන්නේ ආදරණීය අම්මා තාත්තා



# මංගල සීනු

Wedding Day



කපිතන් ඒඑස් වේලාතන්ත්‍රී යන නිළධාරි 2012.05.31 දින වාද්දුව නිවාඩු නිකේතනයේදී 2/ලුතිතන් ලක්මිණි සමරකෝන් නිළධාරිනී සමග විවාහ මංගල්‍ය උත්සවය සිදුකරන ලදි



නි/66151 කපිතන් එම්ආර් හමීම් යන නිළධාරි 2012.03.11 දින වැල්ලවත්ත සෆායර් හෝටලයේදී සිත්ති රෙහානා ෂායා මෙනෙවිය සමග විවාහ මංගල්‍ය උත්සවය සිදුකරන ලදි



නි/65700 කපිතන් එච්එම්ජීඅයියුබී හේරත් යන නිළධාරි 2012.03.01 දින මහනුවර සිව්ස් හෝටලයේදී විවාහ මංගල්‍ය උත්සවය සිදුකරන ලදි

කපිතන් සීඑන් සංජීව යන නිළධාරි 2012.06.06 දින ගම්පහ කැනෝන් බෝල් බැන්කට් හෝල් හිදී දිලූපා විජේවර්ධන මෙනෙවිය සමග අතිනත ගත් සුභ මොහොත



කපිතන් තුසිත ද සිල්වා යන නිළධාරි 2012.03.11 දින පින්නවල රැලිදිය හෝටලයේදී සිය විවාහ මංගල්‍ය උත්සවය සිදුකරන ලදි





ලුතිතන් පීජී චන්ද්‍රසිරි යන නිළධාරි 2012.02.17 දින සිනමන් ලේක් සයිඩ් හොටෙල් හිදී නිලක්ෂි ප්‍රනාන්දු මෙනෙවිය සමග විවාහ ගිවිස ගත් සුභ මොහොත

2012.05.30 වන දිනට යෙදී තිබූ සුභ මොහොතින් අතිනත ගත් ලුතිතන් ප්‍රනීත් පල්ලියගුරු හා ලුතිතන් දිලූකා මුල්ලගේ (ශ්‍රීලයුකාබ) අතිනත ගත් ඒ වාසනාවන්ත මොහොත





2012.05.17 වන දිනට යෙදී තිබූ වාසනාවන්ත සුභ මොහොතින් යුගදිවි ගමන් ඇරඹූ 1 ශ්‍රීලංසංබ ඒකකයට අයත් සෙ/279170 කෝප්‍රල් ජයකොඩි ආර්ආර්ජේජී සහ විශාකා කෞශල්‍යා මෙනෙවිය



2012.01.19 දින සුභ මොහොතින් අතිනත ගත් 4 ශ්‍රීලංසංබ ඒකකයේ කෝප්‍රල් උදයංග පීඩීඑච් සහ නයනි ඉරෝෂිමා මෙනෙවිය



සුභ මොහොතින් අතිනත ගත් සංඥා මූලික වැඩපළ සෙ/280802 සංසෙ අබේවික්‍රම පීජීපී හා චතුරිකා මෙනෙවිය



සෙ/279230 සංසෙ අබේරත්න කේඑච්එම් 2012.05.25 දින සුරේකා මධුශානි කීර්තිරත්න මෙනෙවිය සමග අතිනත ගත් සුභ මොහොත



2012.05.03 දින යුග දිවියට පා තැබූ සෙ/2සී00691 සංසෙ ජයතිලක ආර්පීඑල්පී සහ එරන්දි අනුරාධා ජයසිංහ මෙනෙවිය



2012.07.02 දින සුභ මොහොතින් අතිනත ගත් 7 ශ්‍රීලංසංබ සෙ/280921 ලා/කෝ සිසිර කුමාර ඒආර්එම් හා ඩීජී සුවිනීතා මෙනෙවිය



2012.05.10 වන දින සුභ මොහොතින් අතිනත ගත් 4 ශ්‍රීලංසංබ සෙ/281514 සංසෙ හේරත් එච්එම්පීසී හා ආර්එම් නිසංසලා සඳමාලි රත්නායක

# විවිධ

**ඒජාසාසා හමුදා රාජකාරි සඳහා 2012 වර්ෂය තුල මෙම ඒකකය වෙතින් පහත නම් සඳහන් නිළධාරි/සෙසුනිළයින් සහභාගි කරවන ලදි.**

| | | | |
|---|---|---|---|
| නි/62999 | මේජර් | ටීඑස් | ලියනගුණවර්ධන |
| සෙ/275615 | බනි 11 | රිදීමහලියද්ද | සීඑස් |
| සෙ/276456 | සැරයන් | පියනන්දන | පීඑල්එම් |
| සෙ/277039 | සැරයන් | පෙරේරා | ඩබ්ජීඑම් |
| සෙ/277041 | සැරයන් | උදයරත්න බංඩා | එම්බී |
| සෙ/277280 | කෝප්‍රල් | ප්‍රදීප් | කේඑච් |
| සෙ/277283 | කෝප්‍රල් | චින්දන කුමාර | එච්ආර් |
| සෙ/277285 | කෝප්‍රල් | ජයවර්ධන | ජේඅයි |
| සෙ/278229 | කෝප්‍රල් | පියසේන | එච්එම්ආර්වයි |

## හයිටි  රාජ්‍යයේ සාමසාදක රාජකාරි සඳහා සහභාගිවීම

2006 වර්ෂයේ සිට සාමසාධක රාජකාරි සදහා සහභාගි වීමට මෙම ඒකක නිළධාරි හා සෙසු නිළයින්ට අවස්ථාව ලැබී ඇති අතර, දැනට ඒකකයේ සෙසුනිළයින් 28 දෙනෙකු සාම සාධක රාජකාරි සදහා සහභාගී වී ඇත.

THE SIGNALLER
SRI LANKA SIGNAL CORPS JOURNAL - 2012

# සංඥා බලකා ලාංඡනය




- තරංග සළකුණ
  සංඥා බලකාය මගින් ඉටුකරන සංඥා සම්බන්ධතාවය පිළිඹිඹු කෙරේ
- ලෝක ගෝලය
  මුළු පෘතුවිය වටාම සංඥා සම්බන්ධතාවය පැතිරවීම පිළිඹිඹු කෙරේ
- SRI LANKA SIGNAL CORPS
  ලාංඡනය අයත් රෙජිමේන්තුව පිළිඹිඹු කෙරේ
- ලා නිල්, තද නිල් සහ තද කොළ වර්ණයන්
  මෙම සියළු වර්ණයන්ගෙන් අහස, ගොඩබිම සහ මුහුද ආවරනය කරමින් සංඥා සම්බන්ධතාවය පැවැත්වීම පිළිඹිඹු කෙරේ

# සංඥා පාසල ලාංඡනය




- පන්දම් සලකුණ
  ඉගෙනීම සඳහා ආලෝකය යන්න පිළිඹිඹු කෙරේ
- ආදර්ශ පාඨය
  තාක්‍ෂණයෙන් පිරිපුන්ව
- සංඥා පුහුණු පාසල
  ලාංඡණය අයත් ආයතනය පිළිඹිඹු කෙරේ
- ලා නිල්, තද නිල් සහ තද කොළ වර්ණයන්
  මෙම වර්ණයන්ගෙන් සංඥා සම්බන්ධතාවය සඳහා පුහුණුව ත්‍රිවිධ හමුදාව සඳහා ලබාදීම පිළිඹිඹු කෙරේ

# SIGNALLER

